







# වාර්ෂික වාර්තාව 2018

## ජාතික රක්ෂණ භාර අරමුදල

# පටුන


| | |
|---|---|
| ජාතික රක්ෂණ භාර අරමුදල පිළිබඳව | 2 |
| අපගේ දැක්ම | 3 |
| අපගේ මෙහෙවර | 3 |
| අප කවුරුන්ද? | 4 |
| අපගේ ආයතනික වටිනාකම් | 5 |
| ප්‍රධාන මූල්‍ය කරුණු | 6 |
| උපාය මාර්ගික අරමුණු | 7 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 9 |
| ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය | 10 |
| | |
| කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය | 12 |
| පාරිසරික සමාලෝචනය | 13 |
| මූල්‍ය සමාලෝචනය | 14 |
| ආංශික සමාලෝචනය | 17 |
| | |
| පාලනය හා අභ්‍යන්තර පාලනය | 24 |
| ව්‍යාපාර පාලනය | 25 |
| අධ්‍යකෂක මණ්ඩල සාමාජිකයින් -2018 | 29 |
| මණ්ඩල සාමාජිකයින්ගේ පැතිකඩ | 31 |
| ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 33 |
| ව්‍යාපාර අවදානම් කළමනාකරණය | 35 |
| තිරසර වාර්තාකරණය | 39 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 40 |
| | |
| මූල්‍ය වාර්තා | 43 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 44 |
| මූල්‍ය ප්‍රකාශන | 61 |
| | |
| අතිරේක තොරතුරු | 103 |
| දශකය දෙස බැල්මක් | 104 |
| ආයතනික තොරතුරු | 106 |



# ජාතික රක්ෂණ භාර අරමුදල පිළිබඳව

# අපගේ දැක්ම

**ආරක්ෂාව අවැසි සියලු අංශයන්ට
රැකවරණය හා ආරක්ෂණ ජාලයක්**

# අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට දායක වීම සඳහා:

සමාජයෙහි අවශ්‍යතා සහිත සියලුම අංශයන් අරඹයා දැරිය හැකි, ඵලදායී, කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම ලබාදීම.

වෙනස් වන අවශ්‍යතාවන් තුළින් පැන නඟින ඉහළ අවදානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීමෙන් හා වෙනත් වැඩ පිළිවෙල තුළින් දේශීය වෙළෙඳපොලට විසඳුම් සලසාලීම.

දේශීය රක්ෂණ වෙළෙඳපොළට අතිරේක ධාරිතාවය සැපයීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම.

# අප කවුරුද

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ජාතික රක්ෂණ භාර අරමුදල ස්ථාපනය කරන ලදී. ආර්ථිකය සඳහා එහි දායකත්වය ප්‍රතිරක්ෂණය, වැඩ වර්ජන කැරලි කෝලාහල සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණය, අග්‍රහාර වෛද්‍ය රක්ෂණය, සෞඛ්‍ය රක්ෂණය, ස්වාභාවික ආපදා රක්‍ෂණ ආවරණ ඇතුළු සාමාන්‍ය රක්‍ෂණ ක්‍රම යනාදියෙන් සමන්විත වෙයි. ජාතික රක්ෂණ භාර අරමුදල් පනත අනුව වැඩ වර්ජන කැරලි කෝලාහල සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල මුලින් මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් කළමනාකරණය කරන ලද අතර, වැඩ වර්ජන කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්ථවාදී අවදානම් සඳහා රක්ෂණ ආවරණ නිකුත් කරන සියලුම රක්ෂකයින් මේ සඳහා ඔවුන් ලබාගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දීම කළ යුතු වේ 1791/4 දරන 2012 දෙසැම්බර් 31 දිනැති ගැසට් දැන්වීම අනුව සියලුම ප්‍රාථමික රක්‍ෂණකරුවන් ප්‍රාථමික රක්‍ෂණ ගිවිසුම් වලින් පැන නගින සිය සමස්ත ප්‍රතිරක්‍ෂණ වාරිකයෙන් 30% ක් ජාතික රක්‍ෂණ භාර අරමුදල වෙත ලබා දිය යුතුය. වර්තමානයේදී ප්‍රාථමික රක්‍ෂණකරුවන්ට ප්‍රති රක්‍ෂණ ආවරණයක් සපයන එකම ශ්‍රී ලාංකික ආයතනය ජාතික රක්‍ෂණ භාර අරමුදලයි. අග්‍රහාර වෛද්‍ය රක්‍ෂණ ක්‍රමය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 12/2005 විසින් ක්‍රියාත්මක කරන ලද අතර එය 2006 ජනවාරි 1 වන දින සිට ජාතික රක්‍ෂණ භාර අරමුදල යටතට ගැනුණි.එය විවාහක සාමාජිකයන්ගේ, කලත්‍රයා සහ දරුවන්ට (ඔවුන් අවිවාහක, රැකියා විරහිත සහ වයස අවුරුදු 21 ට අඩු නම් පමණක්) සහ අවිවාහක සාමාජිකයන්ගේ, දෙමාපියන් (දෙමාපියන් වයස අවුරුදු 70 ට අඩු නම්) ප්‍රතිලාභ සපයයි.

අඩු වාරිකයකට ප්‍රතිලාභ ගණනාවක් ලබාදීම ප්‍රධානතම තරගකාරී වාසියක් වන අතර හිමිකම් පිළිගැනීම සහ ගෙවීම සම්බන්ධයෙන් ගත් කල අප රටේ සිටින හොඳම ආයතනයක් වේ. නව තාක්‍ෂණයන් උපයෝගී කර ගැනීමෙන් අපගේ අභ්‍යන්තර හා බාහිර කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇති අතර පහළම මට්ටමට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

# අපගේ ආයතනික වටිනාකම්

අපගේ මූලික ආයතනික අගයන් හය අප අපගේ ව්‍යාපාරයට ප්‍රවේශ වන ආකාරය සඳහා ස්ථිර පදනමක් සහ මාර්ගෝපදේශයක් සාදයි



# ප්‍රධාන මූල්‍ය කරුණු - 2018

(a) බදුවලට පසු ලාභය — රු බිලියන 3.1

(b) මුළු වත්කම් — රු බිලියන 16

(ඇ) ඒකාබද්ධ අරමුදලට දායකත්වය — රු බිලියන 2.75

(c) ආයෝජන මත ප්‍රතිලාභ — 20.4%

| | 2018 | 2017 |
|---|---|---|
| | රු | රු |
| දළ ලිඛිත වාරිකය | 9,683,874,748 | 9,071,278,467 |
| ශුද්ධ ඉපයූ වාරිකය | 13,653,431,467 | 11,613,828,982 |
| බදුවලට පෙර ලාභය (PBT) | 3,288,839,528 | 1,077,185,612 |
| බදුවලට පසු ලාභය (PAT) | 3,183,238,866 | 976,233,935 |
| මුළු වත්කම් | 15,595,192,598 | 18,552,675,429 |
| ආයෝජන මත ප්‍රතිලාභ (%) | 20.4% | 5.2% |



# උපාය මාර්ගික අරමුණු

1. වෘත්තීය හා පාරිභෝගික හිතකාමී ප්‍රතිරක්ෂණකරුවෙකු ලෙස සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව ඉහළම සේවා ප්‍රමිතීන් සපුරාලමින් ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපොළේ ප්‍රතිරක්ෂණ අවශ්‍යතා සඳහා පූර්ණ විසඳුම් ලබා දීම
2. ජාත්‍යන්තර ප්‍රතිරක්ෂණ වෙළඳපොලේ පිළිගත් ක්‍රියාකාරිකයෙකු වීමට සංවිධානයේ නෛතික ව්‍යුහය ශක්තිමත් කරමින් වසර පහක් ඇතුළත ජාත්‍යන්තර ප්‍රතිරක්ෂණ සැපයුම්කරුවෙකු වීම.
3. 2019 වන විට ශ්‍රී ලංකාවේ වැඩිම කැමැත්ත දිනාගත් ප්‍රතිරක්ෂණ සමාගම වීම සහ 2021 වන විට රු. බිලියන 50 ක ශුද්ධ වටිනාකම් සහිතව ආසියානු කලාපයේ ප්‍රමුඛ ප්‍රතිරක්ෂණ සමාගම බවට පත්වීම.
4. සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් / අඟහිඟකම් ඇති පුද්ගලයින්ගේ රක්ෂණ අවශ්‍යතා සපුරාලීම සහ වාණිජ සාමාන්‍ය රක්ෂණකරුවෙකු රක්ෂණ විසඳුම් ලබා නොදෙන අවදානම් ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කිරීම.
5. ශ්‍රී ලංකාවේ ගොවීන්ගේ කෘෂිකාර්මික ව්‍යාපාර සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික කර්මාන්තයට සහ එහි පාර්ශවකරුවන්ට රක්ෂණ විසඳුම් ලබා දීම.
6. රජයේ සේවකයින් සහ අනෙකුත් අවශ්‍යතා ඇති කණ්ඩායම් දෙකටම සේවය කරන රටේ වඩාත්ම කාර්යක්ෂම හා ඵලදායී සෞඛ්‍ය රක්‍ෂණ සැපයුම්කරුවෙකු සහ හිමිකම් සපයන්නෙකු වීම.
7. ශ්‍රී ලංකාවේ තොරතුරු කේන්ද්‍රස්ථානය සහ වෘත්තීය රක්‍ෂණ දැනුම මධ්‍යස්ථානය ලෙස ජාතික රක්‍ෂණ භාර අරමුදල (NITF) ස්ථානගත කිරීම
8. පොදුවේ රක්ෂණ ව්‍යාපාරයේ හොඳම ප්‍රතිඵල ලබාගැනීම සඳහා රජයේ ආයතන සමඟ ඇති සම්බන්ධතාවය ශක්තිමත් කිරීම මගින් සියලුම රාජ්‍ය ආයතන සඳහා වඩාත්ම කැමති රක්ෂණ සැපයුම්කරු බවට පත්වීම
9. පරිසර ආරක්ෂාව සඳහා නිරූපිත කැපවීමක් ඇති හරිත ආයතනයක් බවට පත්වීමෙන් සමාජ වගකීම් දැරීම
10. සාමාන්‍ය රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය යන දෙකෙහිම කඩිනම් හිමිකම් පියවීම සඳහා පහසුකම් සපයන ගතික පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් පාරිභෝගික තෘප්තිය ලබා දීම.
11. ජාතික රක්‍ෂණ භාර අරමුදල (NITF) හි මූල්‍ය ශක්තිය හා ස්ථාවරත්වය නිරූපණය කරන ජාත්‍යන්තර මූල්‍ය ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
12. විනිවිදභාවය තහවුරු කිරීම සඳහා වෘත්තීය ගිණුම්කරණ සහ වාර්තාකරණ පද්ධතියක් සහ විගණන කාර්යයක් ඇති කිරීම.
13. විවිධාංගීකරණය වූ ආයෝජන විකල්පයන්හි නිරත වීමට බලය ලබා ගැනීමෙන් පසු සීමිත ආයෝජන ක්‍රියාකාරීත්වය ගතික මෙහෙයුම් ක්‍රියාකාරීත්වයක් බවට පරිවර්තනය කිරීම
14. දැනට අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ භුක්ති විඳින රජයේ සේවකයින්ට උසස් සේවාවක් ලබා දීම සඳහා සෞඛ්‍ය සේවා කර්මාන්තය සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයකට එළඹීම.

15. දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැනි රජයේ මෙහෙයුම් ව්‍යුහයන් භාවිතා කරමින් ළඟාවීම සහ දෘශ්‍යතාව උපරිම කිරීම
16. රාජ්‍ය අංශය යටතේ පවතින සමාන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
17. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ වෘත්තිකයන් වෙනුවෙන් වැඩ කිරීමට වඩාත්ම කැමති සංවිධානය බවට පත්වීම සඳහා කුසලතා කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ මානව ප්‍රාග්ධනය පොහොසත් කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම.

# සභාපතිතුමාගේ පණිවුඩය

2018 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව සතුටට පත්වෙමි.ජාතික වැදගත්කම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරමින්, අපගේ පාර්ශවකරුවන්ට සැලකිය යුතු වටිනාකමක් එකතු කිරීමක් නිර්මාණය කිරීම සඳහා වසර ගණනාවක් තිස්සේ අපි සන්ධාන සහ හවුල්කාරිත්වයන් වෙත එළඹී ඇත්තෙමු. ශක්තිමත්ව ඉදිරියට යාමට මෙය ඉතාම වැදගත් කරුණක්ව තිබේ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය සාධනය සහ දායකත්වය

මන්දගාමී වීමකට ලක්ව ඇති රක්ෂණ වෙළඳපොළක ක්‍රියාත්මක වුවද, 2017 දී රු. බිලියන 9.1 ක් වූ දළ ලිඛිත වාරිකය 2018 දී රු. බිලියන 9.7ක් බවට පත් වී මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේ ය. මෙම ජයග්‍රහණය වඩා ආකර්ෂණීය කරමින්, ජාතික රක්ෂණ භාර අරමුදල 2017 වසරේදී රු. බිලියන 0.976 ක් වූ බදුවලින් පසු ලාභය 2018 වසරේදී රු. බිලියන 3.183 ක් බවට පත් කෙරිණි. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් AA- (lka) හි ෆිච් ශ්‍රේණිගත කිරීමක් ලබා ගත් අතර එය 2018 වර්ෂයේ මූල්‍යමය යහපත් බව සනාථ කරයි.

**ඇගයීම**

මෙම ආයතනය මෙහෙයවනු ලබන ගරු මුදල් අමාත්‍යවරයාට මගේ කෘතඥතාව පිරිනමමි. භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් සහ ජාතික රක්ෂණ භාර අරමුදල සමග සමීපව කටයුතු කරන අනෙකුත් සියලුම භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය මම මෙහිදී සිහිපත් කරමි. රක්ෂණ කර්මාන්තයේ නියාමකයින් වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ නිලධාරීන් වෙත ද මගේ අවංක ස්තූතිය සහ ඇගයීම පිළිගන්වමි. අවසාන වශයෙන්, මණ්ඩලයේ සෙසු සාමාජිකයින්ට, ප්‍රධාන විධායක නිලධාරිතුමාට මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලේ සේවකයින්ට ඔවුන්ගේ වසර පුරා නොසැලෙන කැපවීම සහ කැපවීම පිළිබඳව ස්තූතිවන්ත වෙමි.



මවාහිබ් මච්ජුඩ්
සභාපති
27.09.2020

# ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

රක්ෂණ කර්මාන්තය සඳහා අවාසිදායක තත්ත්වයන් පැවතියද, වාරික වර්ධනය, ලාභ වර්ධනය සහ පාරිභෝගික සේවය අනුව 2018 දී සතුටුදායක කාර්ය සාධනයක් වාර්තා කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදලට (NITF) හැකි වී ඇති බව ප්‍රකාශ කරනුයේ ඉමහත් සතුටිනි. රට මහා පරිමාණ ගංවතුරට මුහුණ දුන් 2017 වර්ෂය හා සසඳන විට, 2018 මූල්‍ය වර්ෂය මෙහෙයුම් හා මූල්‍ය දෘෂ්ටි කෝණයෙන් සාපේක්ෂව ප්‍රශංසනීය වසරකි.පසුගිය දෙවසර තුළ ගංවතුර හේතුවෙන් විශාල හිමිකම් ප්‍රමාණයක් ගෙවීමෙන් පසුව වුවද, මූල්‍ය ස්ථායිතාව පිළිබිඹු කරමින් ජාතික රක්ෂණ භාර අරමුදල ෆිච් රේටින්ග් ලංකා වෙතින් AA-ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ගත් බව අවධාරණය කිරීම ද වැදගත් ය.

**මූල්‍ය ප්‍රගතිය**

සිය ගනුදෙනුකරුවන්ට ප්‍රසන්න සේවාවක් සපයන අතරම 2017 ට සාපේක්ෂව සිය මූල්‍ය ශක්තිය ඉහළ නැංවීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල සිය මූල්‍ය කළඹ කාර්යක්ෂමව කළමනාකරණය කර ඇත.2017 දී රු. බිලියන 9.071 ක් වූ දළ ලිඛිත වාරිකය 2018 වසරේදී රු. බිලියන 9.683 ක් වූ අතර එය 2017 ට සාපේක්ෂව 2018 දී 6.8% ක වර්ධනයකි.මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රතිරක්ෂණ හා වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල යන දළ ලිඛිත වාරික ඉහළ නැංවීමයි. ඒ හා සමානව, 2017 දී බිලියන 11.613 ක් වූ ශුද්ධ ඉපැයූ වාරිකය 2018 දී රු. බිලියන 13.653 ක් වූ අතර එය 18% ක වර්ධනයකි.

අනෙක් අතට, 2017 දී බිලියන 11.455 ක් වූ දළ ප්‍රතිලාභ සහ හිමිකම් 2018 දී 15% කින් අඩු වූ අතර එය රු. බිලියන 9.763 ක් විය.මෙයට හේතුව 2018 දී ස්වාභාවික විපත් සංඛ්‍යාව අඩු වීම සහ 2017 දී මහා පරිමාණ ගංවතුර ඇතිවීම සහ 2017 දී ගංවතුර හිමිකම් සඳහා සැලකිය යුතු ප්‍රමාණයකින් හිමිකම් ගෙවා දැමීම වැඩිවීම ය.එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දී රු. බිලියන 1.176 ක් වූ සමස්ත විස්තීර්ණ ආදායම 2018 දී රු. බිලියන 3.303 ක් විය.එය පෙර වසර හා සාපේක්ෂව 180% ක වැඩි වීමකි.

2017 සහ 2018 වසරවල මූල්‍ය තත්ත්වය සලකා බැලීමේදී, මුළු ස්කන්ධ සහ මුළු වත්කම් පිළිවෙළින් රු බිලියන 7.146 සිට රු බිලියන 6.956 දක්වාත් රු. බිලියන 18.553 සිට රු බිලියන 15.595 දක්වාත් යම් ප්‍රමාණයකින් අඩු වී ඇත. එමෙන්ම, 2017 දී රු. බිලියන 11.406 ක්ව තිබූ මුළු බැරකම් ප්‍රමාණයද 2018 දී රු. බිලියන 8.639 දක්වා පහත වැටී තිබිණි.

2017 වසරේ තිබූ රු.බිලියන 8.161 මූල්‍ය වත්කම් 2018 වන විට රු.බිලියන 10.674 දක්වා පැමිණ 31% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ 2018 වසරේදී ප්‍රතිරක්ෂණ කරුවන්ගෙන් විශාල වශයෙන් ප්‍රතිරක්ෂණ ප්‍රතිසාධනයන් ලැබීමයි.එමෙන්ම, දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම 2017 දී රු. මිලියන 39.471 ක් වූ අතර 2018 දී 26% ක අඩුවීමක් පෙන්නුම් කරමින් රු.මිලියන 29.363 ක් බවට වාර්තා විය.

AA- හි පිවි ශ්‍රේණිගත කිරීමේ මූල්‍ය ප්‍රගතිය සහ ශ්‍රේණිය සලකා බැලීමේදී, ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රධාන වශයෙන් සමස්ථ විස්තීර්ණ ආදායම, මුළු වත්කම් සහ AA- ණය ශ්‍රේණිගත කිරීම් හේතුවෙන් ශක්තිමත් මූල්‍යමය තත්ත්වයක් පෙන්නුම් කරයි.

**මෙහෙයුම් ප්‍රගතිය**

2018 දී එහි සාමාජිකයින්ට රන් හා රිදී සාමාජික කාඩ්පත් නිකුත් කර ඇති අතර අග්‍රහාර රන් හා රිදී යෝජනා ක්‍රම අර්ධ රාජ්‍ය ආයතන වෙත ව්‍යාප්ත කර ඇත.සේවකයින්ට සහ පාරිභෝගික හිතකාමී ආයතනයකට වඩා හොඳ සේවා පරිසරයක් ඇති කිරීම සඳහා වර්තමාන කාර්යාල පරිසරය නව පරිශ්‍රයකට මාරු කිරීමට ද තීරණය කර එම කටයුතු ආරම්භ කර ඇත.

**ඇගයීම**

අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 2018 හි ජයග්‍රහණ වෙත දැක්වූ අඛණ්ඩ කැපවීම සහ අපගේ සේවකයින් අපගේ ව්‍යාපාරයට වෙත දැක්වූ කැපවීම සහ ලැදියාව පිළිබඳව අපගේ කෘතඥතාව හා අගය කිරීම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. අපගේ ගාමක සාධකයන් වන මහජනතාවට සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ගනුදෙනුකරුවන්ට, ඔවුන් අප වෙත දැක්වූ විශ්වාසය සහ සහයෝගිතාව වෙනුවෙන් මම ස්තූතිය ප්‍රකාශ කරමි.තවද, 2018 වර්ෂය තුළ දී දැක්වූ සහයෝගය වෙනුවෙන් සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත මාගේ අවංක අගය කිරීම් පිරිනැමීමට මම කැමැත්තෙමි. එමෙන්ම ඉදිරියේදී සමාජ ආරක්ෂණය වඩා හොඳ ආකාරයකින් ජනතාවට ලබා දීමට උදක්ම අපේක්ෂා කරමි.

මංජුල හෙට්ටිආරච්චි
ප්‍රධාන විධායක නිලධාරී (වැඩ බලන)
18.02.2021



# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

# පාරිසරික සමාලෝචනය

සාර්ව ආර්ථික ගතිකතාවයන් ජාතික රක්‍ෂණ භාර අරමුදලහි මෙහෙයුම් කෙරෙහි බලපාන බව ජාතික රක්‍ෂණ භාර අරමුදල හොඳින් දනී. මෙයට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ සියලුම ආර්ථික වර්ධනයන් අසාර්ථක වීමේ අවදානමක් සහිත වීමත් මෙයට බොහෝ දුරට සමනය කරගනුයේ ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම්වලින් මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් රක්ෂණ ආවරණ ලබා ගැනීමෙනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රක්ෂණ සමාගම් 30% ක් ජාතික රක්ෂණ භාර අරමුදල සමග සහ ඉතිරි කොටස විදේශීය ප්‍රතිරක්ෂණකරුවන් සමග ප්‍රතිරක්ෂණය කර තම අවදානම් මාරු කරගනී. එබැවින් ජාතික රක්ෂණ භාර අරමුදල උපායමාර්ගික තීරණ ගැනීමේදී රටේ ආර්ථික හා රක්ෂණ කර්මාන්තයේ වර්ධනයන් සමාලෝචනය කිරීමට අවධානය යොමු කරයි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය

ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය 2017 ට සමානව 2018 දී ද යම් අහිතකර බවක් පෙන්වීය. සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පෙර වසරේ පැවති සියයට 3.4 ට සාපේක්ෂව 2018 දී සියයට 3.2 ක් විය. මෙම වර්ධනයට බොහෝ දුරට සහය වූයේ සියයට 4.7 කින් පුළුල් වූ සේවා ක්‍රියාකාරකම් සහ සියයට 4.8 ක වර්ධනයක් පෙන්වූ කෘෂිකාර්මික කටයුතුවල ප්‍රතිසාධනයයි. ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත කටයුතු වර්ෂය තුළ සැලකිය යුතු ලෙස සියයට 0.9 දක්වා මන්දගාමී විය. වියදම් ප්‍රවේශයට අනුව, පරිභෝජනය සහ ආයෝජන වියදම් යන දෙකම වර්ධනයට සහාය විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආයෝජන පෙර වර්ෂයේ පැවති සියයට 28.8 ට සාපේක්ෂව 2018 දී සියයට 28.6 ක් වූ අතර හිඟය පිරවීම සඳහා බාහිර සම්පත් මත වැඩි වශයෙන් රඳා පැවතීම පෙන්නුම් කරමින් ඉතුරුම්-ආයෝජන පරතරය වර්ෂය තුළ පුළුල් විය.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය

2018 වසර තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටීමේ නැඹුරුවක් නිරීක්ෂණය කළ බැවින් රක්ෂණ ක්ෂේත්‍රයද 2017 පැවති දළ ලිඛිත වාරිකය 15.3% 2018 වසරේදී 10.03% ක් දක්වා අඩුවෙනු දක්නට ලැබිණි. වර්ෂය තුළ උත්පාදනය කරන ලද අතිරේක වාරිකය රුපියල් මිලියන 16,546 ක් පමණ වූ අතර වසර අවසානයේදී දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 181,506 ක් වාර්තා කළේය. පහත වැටීමට හේතුව විය හැක්කේ වර්ෂය තුළ පැවති ආර්ථික හා දේශපාලන අවිනිශ්චිතතාවයන් නිසා ව්‍යාපාර විශ්වාසය කෙරෙහි ඇති කළ බලපෑමයි. මෙය වඩා හොඳින් විද්‍යාමාන වූයේ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධන වේගය දැඩි ලෙස අඩු වීමෙනි. 2017 දී 17.3% ක් වූ එය 2018 දී 8.3% ක් දක්වා අඩු විය.

# මූල්‍ය සමාලෝචනය -2018

විශේෂ මූල්‍ය අවස්ථා පහත ලෙස සාරාංශ කර දැක්විය හැකිය.

වගුව :ප්‍රධාන මූල්‍ය තත්වයන්

| | 2018 | 2017 |
|---|---|---|
| | රු | රු |
| දළ ලිඛිත වාරිකය | 9,683,874,748 | 9,071,278,467 |
| ශුද්ධ ඉපයූ වාරිකය | 13,653,431,467 | 11,613,828,982 |
| බදුවලට පෙර ලාභය (PBT) | 3,288,839,528 | 1,077,185,612 |
| බදුවලට පසු ලාභය (PAT) | 3,183,238,866 | 976,233,935 |
| මුළු වත්කම් | 15,595,192,598 | 18,552,675,429 |
| ආයෝජන මත ප්‍රතිලාභ (%) | 20.4% | 5.2% |

ප්‍රස්තාරය ප්‍රධාන මූල්‍ය තත්වයන්



2018 වසරේදී ජාතික රක්ෂණ භාර අරමුදල රු. බිලියන 9.68 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කළ අතර එය 2017 වර්ෂයේදී රු.බිලියන 9.07 ක් වී තිබිණි. මෙය 7.3% ක සාමාන්‍ය වර්ධනයකි. 2018 වසරේ තිබූ රු.බිලියන 13.65 ශුද්ධ ඉපයූ වාරිකය 2017 වන විට රු.බිලියන 11.61 දක්වා පැමිණ 17.6% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලෙන් වාරික සැලකිය යුතු ලෙස වැඩිවීම සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණයයි. ජාතික රක්ෂණ භාර අරමුදල 2017 වසරේදී රු බිලියන 12.50ක් වූ ශුද්ධ ලිඛිත වාරිකය 6.8% කින් වැඩි කරගනිමින් 2018 වසරේදී රු බිලියන 13.35 ක් දක්වා ළඟා කරගෙන තිබිණි.

2017 දී රු. බිලියන 0.98 ක් වූ බදුවලට පසු ලාභය 2018 දී රු. බිලියන 3.18 ක් විය. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අනෙක් ආදායම් රු. බිලියන 1.46 ක් වන අතර එය 2017 වසරේදී රු. බිලියන 1.15 ක් විය. එයට හේතු වන්නේ ඉහළ පොළී අනුපාතයක් සමග ආයෝජනයට යොමු වූ ද්‍රවශීලතාව වැඩි වීමෙන් උපචිත වූ පොළී ආදායම යි. ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමෙරිකන් ඩොලරයේ වැඩිවීම, මූල්‍ය වර්ෂය අගදී ජාතික රක්ෂණ භාර අරමුදලේ ඇමරිකානු ඩොලර් නාමික ඉතුරුම් ගිණුම් මත ඉපයූ හුවමාරු ලාභයට සාපේක්ෂව අරමුදලට වඩා ලාභදායී විය.

ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවීමට පෙර ශ්‍රී ලංකා රජයේ විෂය පථය යටතේ වැඩ වර්ජන කැරලි සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදලෙන් මෘදු ණය ප්‍රමාණයක් ලබා දෙන ලදී. පැවති ත්‍රස්තවාදී කාලපරිච්ඡේදය තුල ප්‍රහාරවලින් පීඩාවට පත් වූ විශාල ආයතනවලට මෙම ණය සහන මිල ගණන් යටතේ ලබා දී ඇත. 2006 දී ජාතික රක්ෂණ භාර අරමුදල වෙත මාරු කරන ලද මෙම ණය ආපසු ගෙවීමට සමගාමීව උපචිත පොලී ආදායම දැන් අඩු වී ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලේ මුළු වත්කම් 2017 දී රු බිලියන 18.55 ක් වූ අතර එය 2018 දී රු. බිලියන 15.59 දක්වා අඩු විය. එමෙන්ම 2017 වසරේදී රු.බිලියන 7.15 ක් වූ මුළු ස්කන්ධ 2018 දී රු බිලියන 6.96 ක් විය.

**ආදායම් සමාලෝචනය**

ජාතික රක්ෂණ භාර අරමුදලේ ආදායම පහත පරිදි දැක්විය හැකිය.

වගුව :රක්ෂණ නිපැයුම් වෙතින් ජාතික රක්ෂණ භාර අරමුදල ලද ආදායම **2017** සහ **2018**

| | 2017 | 2018 |
|---|---|---|
| අභ්‍යන්තර ප්‍රතිරක්ෂණය | 3,683,389,120 | 4,056,395,150 |
| SRCC & Tr රක්ෂණ වාරික | 4,036,282,848 | 4,581,640,544 |
| සාමාන්‍ය රක්ෂණය - රථවාහන | 417,885,956 | 422,117,039 |
| සාමාන්‍ය රක්ෂණය - රථවාහන නොවන | 413,720,543 | 103,722,015 |
| ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ වාරික | 500,000,000 | 500,000,000 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වෛද්‍ය යෝජනා ක්‍රමය | 20,000,000 | 20,000,000 |
| අග්‍රහාර සඳහා ලද දායකත්වය | 2,726,522,599 | 4,017,420,904 |
| එකතු කරන ලද වගා රක්ෂණ බදු | 1,878,361,459 | 2,138,167,676 |

ප්‍රස්තාරය රක්ෂණ නිපැයුම් වෙතින් ජාතික රක්ෂණ භාර අරමුදල ලද ආදායම **2017** සහ **2018** (රු.)



# ආංශික සමාලෝචනය

## අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය

'අග්‍රහාර' යනු ශ්‍රී ලංකාවේ විශාලතම වෛද්‍ය රක්‍ෂණ ක්‍රමය වන අතර එහි සාමාජිකත්වය 845,000 ඉක්මවයි. මිලියන 2.3 කට ආසන්න ශ්‍රී ලාංකිකයින් සහ ඔවුන්ගේ පවුල් මෙමගින් ආවරණය වේ.මෙය දායක මුදල් ගෙවීමේ ක්‍රමයක් වන අතර විශ්‍රාම වැටුප් සහිත සියලුම රජයේ නිලධාරීන්ගේ වැටුපෙන් නාමික මාසික දායකත්වයක් අඩු කරනු ලැබේ.

2018 වසරේදී අග්‍රහාර වෙත භාණ්ඩාගාරයෙන් රු. මිලියන 750 ක් ලැබුණු අතර සාමාජික දායකත්වය මගින් රු. බිලියන 3.28 ක් එකතු කරන ලදී. වසර තුළදී වෛද්‍ය රක්ෂණ හිමිකම් සඳහා රු. බිලියන 4.1 ක් ගෙවන ලදී.

වගුව :ආදායම් වර්ගීකරණය

| | 2018 රු | 2017 රු |
|---|---|---|
| සාමාජිකයින්ගේ දායකත්වය | 2,979,518,379 | 2,154,586,499 |
| භාණ්ඩාගාරයේ දායකත්වය | 750,000,000 | 500,000,000 |
| අග්‍රහාර විශ්‍රාම වැටුප් ක්‍රමය | 101,282,200 | 58,785,600 |
| අර්ධ රාජ්‍ය ක්‍රමය | 206,620,325 | 13,150,500 |
| මුළු දායකත්වය | 4,037,420,000 | 2,726,522,599 |
| හිමිකම් වියදම | 4,085,005,000 | 2,873,715,118 |
| ඌනතාව/අතිරික්තය | (47,585,000) | (147,192,519) |

වගුව :හිමිකම් වර්ගීකරණය

| හිමිකම් වර්ග | ලැබුණු හිමිකම් ගණන - 2018 | ගෙවන ලද හිමිකම් ගණන - -2018 | ගෙවිය යුතු හිමිකම් ගණන -2018 |
|---|---|---|---|
| මරණ | 2,755 | 2,607 | 61 |
| හදිසි අනතුරු | 202 | 151 | 27 |
| දරු උපත් | 17,986 | 17,143 | 759 |

| | | | |
|---|---|---|---|
| මොළයේ සැත්කම් | 29 | 29 | - |
| පිළිකා | 1,439 | 1,335 | 18 |
| හෘද | 1,074 | 1,060 | 2 |
| පුද්ගලික රෝහල් | 28,389 | 23,977 | 987 |
| උකුල් බද්ධ කිරීම් | 12 | 11 | - |
| වකුගඩු | 77 | 68 | - |
| දණහිස් බද්ධ කිරීම | 22 | 22 | - |
| ශ්‍රවණාධාර | 3 | 3 | - |
| අංශභාග | 8 | 8 | - |
| රජයේ රෝහල් | 61,195 | 57,291 | 1,420 |
| ඇස් කණ්ණාඩි | 72,283 | 63,229 | 2,331 |
| **එකතුව** | **185,474** | 166,934 | **5,605** |

### රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් සහ රිදී යෝජනා ක්‍රම

2016 වසරේදී, රාජ්‍ය අංශයට රන් සහ රිදී යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී.තම දායකත්වය රු.300 සහ රු. 600 දක්වා වැඩි කිරීමට එකඟ වන ප්‍රතිලාභීන් පිළිවෙළින් රිදී හා රන් යෝජනා ක්‍රම සඳහා යෝග්‍ය වේ.

### අර්ධ රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් සහ රිදී ක්‍රම

2017 වසරේදී, අර්ධ රාජ්‍ය අංශයට රන් සහ රිදී යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී.

### අග්‍රහාර විශ්‍රාම වැටුප් ක්‍රමය

2016 මැයි මස අග්‍රහාර විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුන්වා දුන් අතර මෙම නිපැයුම කෙරෙහි වූ දැඩි ඉල්ලුම මත 2017 වසරේදී එය තවදුරටත් පුළුල් කරන ලදී.මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය 2016 ජනවාරි මස 1 වන දිනෙන් පසුව විශ්‍රාම ලැබූ පූර්ණ කාලීන රජයේ සේවකයන් සඳහා අදාළ වේ.

### අග්‍රහාර ඉ-කාඩ්පත්

2012 ජනවාරි මාසයේදී, අග්‍රහාර ප්‍රතිලාභීන්ට ලබාදෙන සේවය වඩා කාර්යක්ෂම කිරීම සඳහා සියලුම සාමාජිකයින්ට ඉ-කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කෙරිණි.2017 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල අග්‍රහාර රන් සහ රිදී

සාමාජිකයින්ට වෙනම රන් සහ රිදී ඉ-කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී.ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා පුද්ගලික රෝහල් ගණනාවක් සමග ගිවිසුම්වලට එළැඹිණි.

## ප්‍රතිරක්ෂණය

ශ්‍රී ලංකාවේ එක් එක් සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින් ප්‍රතිරක්ෂණය කර ඇති මුදලෙන් 20% ක වගකීමක් භාර ගැනීමට 2007 දෙසැම්බර් 19 වන දිනැති 1528/20 දරන ගැසට් පත්‍රය අනුව 2008 වසරේදී ප්‍රතිරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. එය 2012 දක්වා පවත්වාගෙන යනු ලැබිණි.2013 වසරේදී, එය 30% ක් දක්වා වැඩි කරන ලද අතර මේ වන තෙක් එය පවත්වාගෙන යනු ලැබේ.

2018 දී, NITF විසින් රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවය මත NITF ශේෂ පත්‍රය ආරක්ෂා කිරීම සඳහා නැවත ප්‍රතිරක්ෂණ ආවරණයක් (retrocession) ලබා ගත් අතර ප්‍රතිරක්ෂණ ආවරණයේ සීමාව බිලියන 7.5 ක් විය. ප්‍රතිරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන ප්‍රතිරක්ෂණකරු වන්නේ Renaissance Re ය.

Retrocession ආවරණයට අමතරව, Renaissance Re හි ප්‍රධානත්වයෙන් යුතුව ජාතික රක්ෂණ භාර අරමුදල, රු.බිලියන 15 දක්වා රක්ෂණය නොකරන ලද දේපළ ආරක්ෂා කිරීම සඳහා ස්වභාවික ආපදා රක්ෂණයක් සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල සඳහා රු බිලියන 10 ක් දක්වා වන ඔවුන්ගෙ බැරකම් ආරක්ෂා කිරීමට ප්‍රතිරක්ෂණ ආවරණයක් ලබාගන්නා ලදී.එමෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදල AAIB වෙතින් කෘෂිකර්ම බෝග රක්ෂණ ක්‍රමයක් සඳහා ප්‍රතිරක්ෂණයක්ද ලබාගන්නා ලදී.

| ප්‍රතිරක්ෂණ | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| දළ ලිඛිත රක්ෂණ වාරික - අභ්‍යන්තර ප්‍රතිරක්ෂණය | 4,056,395,150 | 3,683,389,120 |
| ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් | (2,345,202,622) | (2,039,286,678) |

## වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල

වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල, 2008 මාර්තු 25 දිනැති 1542/11 දරන ගැසට් දැන්වීම අනුව ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම්වලින් වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණාවරණය ලබාගන්නා අයට ලබා දෙනු ලැබේ.

2018 දී, NITF විසින් රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවය මත NITF ශේෂ පත්‍රය ආරක්ෂා කිරීම සඳහා නැවත ප්‍රතිරක්ෂණ ආවරණයක් ලබා ගත් අතර ප්‍රතිරක්ෂණ ආවරණයේ සීමාව බිලියන 10 ක් විය.ප්‍රතිරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන ප්‍රතිරක්ෂණකරු වන්නේ MS/ Chaucer Syndicate 1084 ය.

| SRCC හා Tr රක්ෂණ | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| දළ ලිඛිත රක්ෂණ වාරික - SRCC හා Tr රක්ෂණ | 4,581,640,544 | 4,036,282,848 |
| ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් | (50,085,704) | (12,314,131) |

## මෝටර් රථ රක්ෂණය

2008 සිට රජයේ ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන සතු වාහන සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් මෝටර් රථ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. රජයේ චක්‍රලේඛ අංක PF 427 හා PF 437 ට අනුව, රජය සතු ආයතනවල මෝටර් සහ මෝටර් නොවන රක්ෂණය ලබාගත හැක්කේ ජාතික රක්ෂණ භාර අරමුදල හෝ රජය සතු රක්ෂණ සමාගම වෙතින් පමණි.

ජාතික රක්ෂණ භාර අරමුදල පුද්ගලික ගනුදෙනුකරුවන් සඳහා සිය සේවය පුළුල් කර ඇති අතර 2014 සිට පුද්ගලික ගනුදෙනුකරුවන්ගේ වාරික දායකත්වය විශාල ලෙස ඉහළ ගොස් තිබේ. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2017 දී අර්ධ රාජ්‍ය නිලධාරීන් සහ විශ්‍රාමිකයන් ඇතුළු රජයේ නිලධාරීන්ට "අග්‍රහාර මෝටර්" නමින් නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර එය මෝටර් රථ රක්ෂණ අංශයේ ප්‍රධාන ලාභ ඉපැයීමේ අංශය වේ.

ක්‍රියාවලි විධිමත් කිරීම සහ හිමිකම් ගෙවීම වේගවත් කිරීම සඳහා අඛණ්ඩ වැයමක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ඇති ශාඛා කාර්යාල හරහා දිවයිනේ ඕනෑම තැනක සේවාදායකයින්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව පවත්වා ගනිමින් ජාතික රක්ෂණ භාර අරමුදල පැය 24 පුරා ඇමතුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම විශේෂත්වයකි. දිවයින පුරා විසිරී සිටින දක්ෂ තක්සේරුකරුවන් කණ්ඩායමක් ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීමට සහ හිමිකම් ඉල්ලීම් සිදුකරන විට ගනුදෙනුකරුවන්ට පුළුල් වූ සහයක් ලබ දීමට කටයුතු කරයි.

| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| දළ ලිඛිත රක්ෂණ වාරික - මෝටර් රථ | 422,117,039 | 417,885,956 |
| ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් | (208,043,768) | (202,402,854) |

වගුව :මෝටර් හිමිකම් වර්ගීකරණය

| වර්ගය | 2018 | | 2017 | | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|---|
| | හිමිකම් ගණන | මුදල (රු.මිලියන) | හිමිකම් ගණන | මුදල (රු.මිලියන) | හිමිකම් ගණන | මුදල (රු.මිලියන) | හිමිකම් ගණන | මුදල (රු.මිලියන) |
| පුද්ගලික මෝටර් රථ | 657 | 56.05 | 587 | 61.38 | 327 | 40.24 | 258 | 33.02 |
| යතුරු පැදි | 2465 | 45.07 | 2176 | 35.8 | 1912 | 29.09 | 966 | 13.89 |
| මෝටර් වාහන | 183 | 17.23 | 189 | 18.1 | 170 | 15.46 | 91 | 9.52 |
| ලොරි | 131 | 9.99 | 116 | 11.28 | 69 | 3.3 | 51 | 4.34 |
| ද්විත්ව කාර්යය වාහන | 558 | 52.65 | 514 | 56.21 | 391 | 42.06 | 220 | 26.51 |
| **එකතුව** | **3994** | **180.99** | **3582** | **182.77** | **2869** | **130.14** | **1,586** | **87.27** |

## මෝටර් රථ නොවන රක්ෂණය

2009.08.20 දින නිකුත් කරන ලද අංක 1615/20 ගැසට් නිවේදනයට අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (මෝටර් නොවන) ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ආරම්භ කරන ලද අතර එය වසර ගණනාවක් පුරා ක්‍රමයෙන් වර්ධනය විය.

ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් ගිනි හා ඉංජිනේරු රක්‍ෂණ, රෝහල් සහ ශල්‍යකර්ම වියදම් රක්‍ෂණ, මුහුදු රක්‍ෂණ සහ විවිධ රක්‍ෂණ ලෙස බෙදා ඇත.

පහත වගුවේ දැක්වෙන්නේ 2018 වර්ෂයේ දී නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු ගණන සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික දායකත්වයයි.

වගුව :මෝටර් නොවන රක්ෂණ වෙතින් ආදායම් වර්ගීකරණය

| වර්ගය | ප්‍රතිපත්ති ගණන | දළ ලිඛිත වාරිකය (රු.මිලියන) |
|---|---|---|
| ගිනි සහ ඉංජිනේරු රක්ෂණය | 84 | 23.6 |
| සැත්කම් රක්ෂණය | 07 | **36.3** |

| | | |
|---|---|---|
| සමුද්‍ර රක්ෂණය | 47 | **1.6** |
| විවිධ රක්ෂණය | 142 | 41.7 |
| එකතුව | | **103** |

| **සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන** | **2018** රු. | **2017** රු. |
|---|---|---|
| **දළ ලිඛිත රක්ෂණ වාරික - මෝටර් රථ නොවන** | 103,722,015 | 413,720,543 |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | (469,755,602) | (151,205,332) |

## ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රමය

ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනා ක්‍රමය (NNDIS) 2016 සඳහා අයවැය යෝජනාවක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය (NITF) හරහා ආරම්භ කරන ලදී.

ජාතික රක්ෂණ භාර අරමුදලට 2018 වසරේදී ඉහත රක්ෂණ ක්‍රමය යටතේ රු මිලියන 500 ක වාරික ගෙවීමක් ලැබී තිබිණි.මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ජීවිත හා රක්‍ෂිත නොවන දේපල, විශේෂයෙන් සියලුම කුටුම්භ හා කුඩා ව්‍යාපාරික ආයතන සඳහා සමූහ ආවරණයක් සපයයි (වාර්ෂික පිරිවැටුම රු.මි.10 නොඉක්මවන ව්‍යාපාර සඳහා සුළි කුණාටු, කුණාටු, චණ්ඩ මාරුත, ගංවතුර, නායයෑම්, භූමිකම්පා, සුනාමි, අධික සුළං හේතුවෙන් ගස් කඩා වැටීම, රැඳවුම් බිත්ති කඩා වැටීම සහ නියඟය හැර වෙනත් සමාන ස්වාභාවික අනතුරු සහ වාර්ෂිකව රුපියල් බිලියන 10 ක සමස්ත සීමාව දක්වා විශාල ව්‍යාපාරවල දේපල හානි සහ රක්ෂණ සමාගමක් සමග රක්ෂණය කර ඇති අය බැහැර කරනු ලැබේ.

ධීවර දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති සියලුම ධීවරයින් මසුන් ඇල්ලීමේ නිරතව සිටියදී හදිසි මරණයක් සම්බන්ධයෙන් රු. මිලියන 1 බැගින් ආවරණය කෙරෙනු ලැබේ.ස්වාභාවික විපත් වලින් විපතට පත්වූ අනෙකුත් සියලු දෙනා සඳහා පුද්ගලික අනතුරු රක්‍ෂණ ආවරණය යටතේ රු. 100,000 හදිසි මරණ ආවරණයක් ලබ දෙනු ලැබේ.ක්ෂුද්‍ර රක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හසුරුවන ලද ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිරක්ෂණ ආවරණයක් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ලබා ගනු ලැබිණි.

| **ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ වාරික** | **2018** රු. | **2017** රු. |
|---|---|---|
| **දළ ලිඛිත රක්ෂණ වාරික - ජාතික ස්වාභාවික ආපදා** | 500,000,000 | 500,000,000 |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | (843,784,556) | (4,699,472,888) |

## කෘෂිකාර්මික ණය ආරක්ෂණ රක්ෂණ ක්‍රමය

බොහෝ ගොවීන් කෘෂිකාර්මික ණය සැපයීමේ නිරතව සිටින බැංකු හා මූල්‍ය ආයතනවලින් ණය ලබා ගනී.නියඟය, ගංවතුර හෝ අලි ප්‍රහාර හේතුවෙන් බෝග වලට හානි සිදුවුවහොත් ණය ලබා දෙන ආයතනවලට ගෙවිය යුතු ණයවලින් සැලකිය යුතු වාරිකයන් ප්‍රමාණයක් අය කර ගැනීමට නොහැකි වෙයි. එබැවින් ඔවුන්ට ආරක්ෂාව සැපයීම සඳහා මෙම රක්ෂණ ක්‍රමය සකස් කර ඇත.



# පාලනය හා අභ්‍යන්තර පාලනය

# ව්‍යාපාර පාලනය

### හැඳින්වීම

ව්‍යවසාය පාලනය යනු සංවිධානයේ සමස්ත වගවීමේ රාමුවයි. ව්‍යවසාය පාලනයේ මානයන් දෙක වන අනුකූලතාව සහ කාර්ය සාධනය සමතුලිත විය යුතුය.

අනුකූලතාවය "ආයතනික පාලනය" ලෙසද හැඳින්වේ. එය මණ්ඩල ව්‍යුහයන් සහ භූමිකාවන් සහ විධායක වේතනය වැනි කරුණු ආවරණය කරයි. ආයතනික පාලන වංචා ගණනාවකින් පසු මෑත වසරවලදී ඒ සඳහා සැලකිය යුතු ආවරණයක් ලබා ඇති අතර මෙම ක්ෂේත්‍රය තුළ අඛණ්ඩ වර්ධනයන් සිදුවනු ඇත.අනුකූලතාවන් විගණනයට යටත් කිරීමෙන් සංග්‍රහයන් සහ/හෝ ප්‍රමිතීන්ට මෙම මානය වෙත පිවිසිය හැකිය. යහපත් ආයතනික ක්‍රියාවලීන් ඵලදායීව ක්‍රියාත්මක වන බව සහතික කරගැනීමට හොඳින් තහවුරු කළ අධීක්ෂණ යාන්ත්‍රණයක් ද ඇත උදා. විගණන කමිටු. කාර්ය සාධන මානය උපාය මාර්ග සහ අගයන් නිර්මාණය කිරීම සඳහා අවධානය යොමු කරන අතර පහත කාර්යයන් සඳහා මණ්ඩලයට උපකාර කරයි: උපායමාර්ගික තීරණ සැපයීම; අවදානම සඳහා වන ඉඩ සහ කාර්ය සාධනය සඳහා එහි ප්‍රධාන ධාවක තේරුම් ගැනීම; සහ තීරණ ගැනීමේදී එහි ප්‍රධාන මූලධර්ම හඳුනා ගැනීම.

2006 අංක 28 දරණ ජාතික රක්‍ෂණ භාර අරමුදල පනත යටතේ ජාතික රක්‍ෂණ භාර අරමුදල 2006 දී පිහිටුවන ලද දා සිට, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද හොඳම භාවිතයන් පිළිබඳ ආයතනික පාලන නීති සංග්‍රහයේ සහ සහ යහපාලනය සහ ආයතනික පාලන පිළිවෙත් සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයේ අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් එහි ආයතනික පාලන පිළිවෙත් ක්‍රියාත්මක කර ඇත.

### ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය

2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනතට අනුව, මුදල් විෂය භාරව අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත සඳහන් සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය කරනු ලැබේ.

(අ) මුදල් විෂයය පවරා ඇති ඇමතිවරයාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකු:

(ආ) මුදල් විෂයය පවරා ඇති ඇමතිවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී:

(ඇ) සෞඛ්‍යය විෂයය පවරා ඇති ඇමතිවරයාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකු:

(ඈ) රාජ්‍ය කළමනාකරණය විෂයය පවරා ඇති අමාත්‍යාංශයේ නිලධාරියෙකු: හා

(ඉ) අමාත්‍යවරයා විසින් නම් කළ මුදල් බැංකුකරණය, රක්ෂණ කළමනාකරණය හෝ නීතිය යන ක්ෂේත්‍රයන්හි සුදුසුකම් හෝ විශේෂඥතාවයන් ඇති පුද්ගලයින් තිදෙනෙකු.

මණ්ඩලයේ එක් අයෙකු සභාපති ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත. පනතට අනුව, මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පත් කළ දින සිට වසර පහක කාලයක් සඳහා ධුරය හෙබවිය යුතුය. මණ්ඩල සාමාජිකයින්ගේ නම් මණ්ඩල සාමාජික පැතිකඩ පිටුවේ දක්වා ඇත. මණ්ඩල රැස්වීම්වල පැමිණීමේ විස්තර පහත දක්වා ඇත.

| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් | 2018 අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම | | | | | | | | | | | | අධ්‍යක්ෂකවරුන් ලෙස පත් වූ දිනය | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | | |
| මංජුල ද සිල්වා මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | | ✓ | 06/04/2015 | - |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලෙ මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | | ✓ | 08/04/2015 | - |
| අසේන්ද්‍ර සිරිවර්ධන මයා | නොපැ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | නොපැ | | ✓ | | ✓ | 02/04/2015 | - |
| එච්. ඒ. සී. කුමරසිංහ මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | - | ✓ | 14/12/2015 | - |
| පී.පී.ස් රොහණ ද සිල්වා මයා | ✓ | ✓ | ✓ | | ✓ | නොපැ | ✓ | ✓ | | ✓ | | ✓ | 05/05/2016 | - |
| එන්.එම්.ඩී. නවරත්න මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | | ✓ | 31/07/2017 | - |
| ඒ.කේ. සෙනෙවිරත්න මයා | | නොපැ | නොපැ | | | | | | | | | | 22/02/2018 | 05/2018 |
| කේ. ඒ. විමලෙන්තිරාජා මයා | | | | | | | | ✓ | | නොපැ | | නොපැ | 29/08/2018 | - |

**තොරතුරු සැපයීම**

මණ්ඩල රැස්වීමට සතියකට පළමුව, ඉන් පෙර පැවති මණ්ඩල රැස්වීම් පත්‍රිකා වල කාර්ය සාධනය සහ වාර්තාවන් ලබා දෙනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අදාළ වෙනත් නීති හා රෙගුලාසි අනුගමනය කරමින් ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.ඒවා මගින් ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය සාධනය පිළිබඳව විනිවිද පෙනෙන විස්ලේෂණයක් සපයනු ලබයි.

වාර්ෂික වාර්තාව

ආයතනයේ වාර්ෂික වාර්තාව 2018 සැලසුම් කර ඇත්තේ දැනුවත් තීරණ ගැනීම සඳහා 2018 වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතු පිළිබඳ සමස්ත දැක්මක් පෙන්වීම සඳහා ය.

**ප්‍රසම්පාදනය**

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රසම්පාදන සිදු කර ඇත්තේ NPA මාර්ගෝපදේශ හා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ භාවිතා කරමිනි. ප්‍රසම්පාදනය සිදු කරනු ලබන්නේ වටිනාකම මත පදනම්ව CAPC (අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව), MPC (අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව) සහ DPC (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව) වැනි කමිටු භාවිතා කරමිනි.

**අභ්‍යන්තර පාලනය**

2018 වර්ෂය තුළ, ජාතික විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය සහ වැඩ වර්ජන, කැරලි කෝලහාල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල විගණනය ඇතුළු අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

**විගණන කමිටුව**

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද 'විගණන කමිටු සඳහා හොඳම පරිචය පිළිබඳ සංග්‍රහයට' අනුකූලව රාජකාරි හා වගකීම් සකස් කරමින් විගණන කමිටුව පිහිටුවන ලදී. විගණනයේ විෂය පථය මෙන්ම විගණන කමිටුවට බැඳී ඇති වගකීම් ද 2018 දී පහත පරිදි ස්ථාපිත කරන ලදී.

- ✓ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කර ස්ථාපිත කිරීම.
- ✓ අභ්‍යන්තර පාලන ක්‍රමය සමාලෝචනය කර ස්ථාපිත කිරීම.
- ✓ පිරිවැය ඵලදායීතාවයේ ද්විත්ව අරමුණු සහ නාස්තිකාර වියදම් අවම කිරීම සඳහා වෙනම ඒකකවල කාර්ය සාධනය වරින් වර සමාලෝචනය කිරීම.
- ✓ විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් බාහිර විගණකවරයා සහ විගණකාධිපති සමග නිරන්තර පසුවිපරම් කිරීම.
- ✓ ප්‍රඥප්ති, රෙගුලාසි සහ චක්‍රලේඛවලට අනුකූලද යන්න පරීක්ෂා කිරීම.
- ✓ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලදැයි සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම.
- ✓ අඩුපාඩු හා පිළියම් යෙදීම සඳහා බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා මෙන්ම කළමනාකරණ ලිපිද සමාලෝචනය කිරීම.
- ✓ කමිටුවේ නිර්දේශ /විධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව සමාලෝචනය කිරීම.

සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර පාලනයන්හි සැලකිය යුතු දියුණුවක් විය. අභ්‍යන්තර විගණන වාර්තා මාසිකව සකස් කරන ලද අතර පසු විපරම් රැස්වීම් පවත්වන ලදී. හඳුනාගත් අවදානම් මත පදනම්ව, දුර්වලතා මැඩ පැවැත්වීමට සහ පාලනයන්හි ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරගැනීමට පාලනයන් සහ මෙහෙයුම් වැඩි දියුණු කළ හැකි

ආකාරයන් ද තීරණය කරන ලදී. තවත් පියවරක් වශයෙන්, අභ්‍යන්තර විගණන කණ්ඩායම ජාතික රක්ෂණ භාර අරමුදලේ රීති සහ රෙගුලාසිවලට අනුකූලව අදාළ ආයතන කටයුතු කරන්නේද යන්න අධීක්ෂණය කිරීමට රක්ෂණ සමාගම් කිහිපයක ක්ෂේත්‍ර සංචාරයේ නියැළිණි. 2018 වසරේ විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

**විගණන කමිටුවේ සාමාජිකයින්**

කේ.ඒ. විමලේන්තිරරාජා මහතා (සභාපති)

ට්‍රෙවීන් ප්‍රනාන්දුපුල්ලේ මහතා

අසේන්ද්‍ර සිරිවර්ධන මහතා

**බාහිර විගණනය**

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණක ලෙස පත් කරන ලද අතර ඕනෑම ලිඛිත නීතියක් යටතේ රජයට පවරා ඇති රාජ්‍ය සංස්ථා, ව්‍යාපාර හෝ වෙනත් ආයතනවල ගිණුම් විගණනය කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයා විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂික විගණනය සිදු කරන ලදී.

**ආයෝජන කමිටුව**

ආයෝජන කමිටුවේ වගකීම් ප්‍රධාන අංශ දෙකකට බෙදිය හැකිය, එනම් යහපත් ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ආයෝජන ප්‍රතිපත්ති නිර්ණායක හා ජාතික රක්ෂණ භාර අරමුදලේ මාර්ගෝපදේශයන්ට අනුකූලව උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම යි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ ආයෝජන කළඹ කළමනාකරණය, වත්කම් වෙන් කිරීම සහ වත්කම්-වගකීම් ගැලපීම කළමනාකරණය කිරීම සෝදිසි කිරීම මෙන්ම ආයෝජන සඳහා නව අවස්ථා සෙවීම ද සිදු විය.

# මණ්ඩල සාමාජිකයින්



මංජුල ද සිල්වා මයා
(සභාපති)



අසෙන්ද්‍ර සිරිවර්ධන මයා
(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)



රොහණ ද සිල්වා මයා
(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)



කේ. ඒ. විමලෙන්තිරාජා මයා
(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)



චන්දන කුමරසිංහ මයා
(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)



ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලෙ මයා
(අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික)

# මණ්ඩල සාමාජිකයින්ගේ පැතිකඩ

### මංජුල ද සිල්වා මහතා (සභාපති)

සභාපතිවරයා ලෙස මංජුල ද සිල්වා මහතා 2015.04.06 දින පත් කරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදලේ සභාපති ධුරයට පත්වීමට පෙර ඔහු එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී හි කළමනාකාර අධ්‍යක්ෂවරයා විය.මංජුල ද සිල්වා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති අතර එක්සත් රාජධානියේ ලන්ඩන් ව්‍යාපාරික පාසලෙන් MBA උපාධියක් ලබා ඇත. ඔහු FCMA (UK) සහ CGMA සාමාජිකත්වයද සහිත වේ.

ඔහු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශකයෙකු ලෙස ද සේවය කළේය. 2015 ට පෙර ඔහු වසර 9 ක් එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසත් තවත් වසර 2 ක් එහි ප්‍රධාන විධායක නිලධාරියා ලෙසත් සේවය කළේය. එමෙන්ම ඔහු ඊගල් එන් ඩී බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ (දැන් එන්ඩීබී වෙල්ත් මැනේජ්මන්ට් ලෙස හැඳින්වෙන) සාමාන්‍යාධිකාරි ලෙසත්, ඊගල් ඉන්ෂුවරන්ස් සමාගමේ සාමාන්‍යාධිකාරී - ආයතනික සහ මානව සම්පත් ලෙසත් (දැන් ඒඅයිඒ ඉන්ෂුවරන්ස්) රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (PERC) අධ්‍යක්ෂ ජනරාල් ලෙසත් සේවය කළේ ය. එමෙන්ම ඔහු කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ වරලත් ආයතනයේ ( CIMA) ශ්‍රී ලංකා මණ්ඩලයේ සභාපති ලෙස 2016 වසරේදී සේවය කළ අතර ඉන්පසු MESANA කලාපයේ කලාපීය මණ්ඩලයේ සේවය කළේ ය.

### රෝහණ ද් සිල්වා මහතා (මණ්ඩල සාමාජික)

රෝහණ ද සිල්වා මහතා 2016.05.05 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2016 මැයි මස සිට මණ්ඩල රැස්වීම්වලට සහභාගී වේ. වසර තුළදී ඔහු සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස සේවය කරමින් සිටියේය.

### අසේන්ද්‍ර සිරිවර්ධන මහතා (මණ්ඩල සාමාජික)

අසේන්ද්‍ර සිරිවර්ධන මහතා 2015.04.02 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. ඔහු 2018 දී නීතිඥයෙකු ලෙස කටයුතු කරයි.

### චන්දන කුමාරසිංහ මහතා (මණ්ඩල සාමාජික)

චන්දන කුමාරසිංහ මහතා 2015.12.14 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. 2018 දී ඔහු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ඉතා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිටියේය.

ට්‍රෙවීන් ප්‍රනාන්දුපුල්ලේ මහතා (මණ්ඩල සාමාජික)

ට්‍රෙවීන් ප්‍රනාන්දුපුල්ලේ මහතා 2015.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2015 සිට මණ්ඩල රැස්වීම්වලට සහභාගී වේ.ඔහු එච්එස්බීසී බැංකුවෙන් විශ්‍රාම ගන්නා විට එහි නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරියා විය

එන්.එම්.ඩී. නවරත්න මහතා (මණ්ඩල සාමාජික)

එන්.එම්.ඩී. නවරත්න මහතා 2017 දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.2018 දී ඔහු මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කළේය.

කේ.ඒ. විමලේන්දිරරාජා මහතා (මණ්ඩල සාමාජික)

කේ.ඒ. විමලේන්දිරරාජා මහතා 2018.08.29 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.කේ. ඒ. විමලේන්දිරරාජා මහතා රාජ්‍ය සේවයේ වසර 24 කට වැඩි පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකි.මෙම කාලය තුළ ඔහු මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළේය. ඔහු නීතිඥවරයෙකු ලෙස කටයුතු කරයි.

# ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



01
සනත් සී. ද සිල්වා මහතා
*ප්‍රධාන විධායක නිලධාරී*



02
ජේ. ඒ. ඩී. සිරිවර්ධන මහතා
*සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය*



03
නිමාලි පතිරණ මිය
*සහකාර සාමාන්‍යාධිකාරී - රක්ෂණ*



04
පී. ආර්. ඒ. ලසන්ත ශ්‍රී. කුමාර මහතා
*මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තු ප්‍රධානී*



05
නිමාලි පෙරේරා මිය
*අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශාඛා ප්‍රධානී*



06
ධම්මිකා වීරකෝන් මිය
*මූල්‍ය අංශ ප්‍රධානී*



07
ආර්. එස්. ගුණසේකර මහතා
*පරීක්ෂණ හා විශ්ලේෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*



08
කාවින්ද ජයසිංහ මහතා
*තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*



09
උපේක්ෂා ඒකනායක මිය
*මෝටර්රථ ප්‍රාරක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*



10
අනුර සමරකෝන් මහතා
*අනුකූල දෙපාර්තමේන්තු ප්‍රධානී*



11
දේශානි නානායක්කාර මිය
*ප්‍රතිරක්ෂණ හා SRCC දෙපාර්තමේන්තු ප්‍රධානී*



12
රන්දිමා ඩී. එම්. මානගේ මෙනෙවිය
*සාමාන්‍ය හිමිකම් දෙපාර්තමේන්තු ප්‍රධානී*



13

හිමේෂා සහබන්දු මිය
ක්ෂුද්‍ර රක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී



14

ටී. පී. ලක්ෂ්මන් මහතා
මෝටර්රථ හිමිකම් දෙපාර්තමේන්තු ප්‍රධානී



15

සිතාර අසංක ජයලත් මහතා
පරිපාලන අංශ ප්‍රධානී



16

ගයාත්‍රී සොයිසා මිය
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු ප්‍රධානී



17

තාමල් කාංචන මහතා
ආයෝජන අංශ ප්‍රධානී



18

එස්. ආර්. පී. උදාරි ප්‍රියභාෂිණී මිය
හිමි අංශ ප්‍රධානී



19

ශයනි සියබලාගොඩ මිය
විධායක ලේකම්



20

ශමාල් සුමුදු සේනාරත්න මහතා
අනුරාධපුර ශාඛා ප්‍රධානී



21

එම්.එන්.කේ. පාඩිගම්ගේ මහතා
හම්බන්තොට ශාඛා ප්‍රධානී



22

සිසිත චන්ද්‍රකුමාර මයා
මූල්‍ය වාර්තාකරණ ප්‍රධානී

# ව්‍යාපාර අවදානම් කළමනාකරණය

## හැඳින්වීම

ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ඊආර්එම්) යනු ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය සහ වෙනත් පිරිස් විසින් ක්‍රියාත්මක කරනු ලබන, උපාය මාර්ග සැකසීමේදී සහ ව්‍යවසාය පුරා ක්‍රියාත්මක වන, එම ආයතනයට බලපාන විභව සිදුවීම් හඳුනා ගැනීමට සහ අවදානම කළමනාකරණය කිරීමට සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රියාවලියක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අනුගමනය කරන ලද ව්‍යවසාය අවදානම් කළමනාකරණයේ මූලික මූලධර්මවලට ඇතුළත් වන්නේ:

- ව්‍යාපාර උපායමාර්ගයේ සන්දර්භය තුළ සලකා බැලීම
- එය ඉහළ මට්ටමේ සිට සෑම දෙනාගේම වගකීමකි.
- මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ඉලක්කගත උපාය මාර්ගයකි
- අවදානම් සක්‍රීයව කළමනාකරණය කිරීම
- අවදානම් පිළිබඳ දැනුවත් භාවයක් සහිත සංස්කෘතියක් ඇති කිරීම
- අවදානම් කළමනාකරණය සඳහා පුළුල් හා පරිපූර්ණ ප්‍රවේශයක්
- පුළුල් පරාසයක අවදානම් සලකා බැලීම (උපායමාර්ගික, මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා)
- අවදානම් කළමනාකරණ රාමුවක් හෝ පද්ධතියක් හරහා ක්‍රියාත්මක කිරීම.

අවදානම් කළමනාකරණය යනු ජාතික රක්ෂණ භාර අරමුදලේ උපායමාර්ගික කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසකි. එක් එක් ක්‍රියාකාරකම තුළ සහ සියලු ක්‍රියාකාරකම් හරහා තිරසාර ප්‍රතිලාභ අත්කර ගැනීමේ අරමුණින් රාජ්‍ය රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට ඇති අවදානම් සම්බන්ධව ක්‍රමවත් ලෙස කටයුතු කරයි. අවදානම් හඳුනාගැනීම සහ ඒවා අවම කිරීම සඳහා වැදගත් වන්නේ යහපත් අවදානම් කළමනාකරණයකින් බව ජාතික රක්ෂණ භාර අරමුදල හඳුනාගෙන ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලේ අරමුණ වන්නේ සංවිධානයට බලපෑමට ඉඩ ඇති සියලුම සාධකයන්ගේ යහපත් සහ අයහපත් පාර්ශ්වයන් අවබෝධ කරගනිමින් එහි සියලුම ක්‍රියාකාරකම් වලට උපරිම තිරසර අගයක් එක් කිරීමයි. ව්‍යවසාය අවදානම් කළමනාකරණ උපාය මාර්ග

අනුගමනය කිරීමේදී, බලපෑම / ප්‍රතිවිපාකයේ ප්‍රමාණය සහ සිදුවීමේ සම්භාවිතාව / පිළිගත හැකි බව තක්සේරු කරමින් පහත සඳහන් ප්‍රමුඛ අවදානම් හඳුනාගෙන ඇත.

R01 - උපාය මාර්ගික අවදානම

උපාය මාර්ගික අවදානම යනු අභ්‍යන්තර හා බාහිර පරිසර සාධක හේතුවෙන් අපේක්ෂිත පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලේ උපායමාර්ගික අරමුණු, අරමුණු සහ ව්‍යාපාර සැලැස්ම සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීමේ අවදානමයි. උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා, ජාතික රක්ෂණ භාර අරමුදලේ කළමනාකාරිත්වය සාමාන්‍ය පරිසරයේ දේශපාලන, තාක්‍ෂණික, සමාජ-සංස්කෘතික, ආර්ථික වර්ධනයන් සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ උපායමාර්ගික අභිප්‍රාය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි රක්ෂණ අංශයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ කාර්ය පරිසරය තුළ තරගකරු සහ පාරිභෝගික ගතිකතාවයන් පිළිබඳව සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කර ඇත.

R02 - ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම යනු විවිධ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ හෝ අඩුවීමේ අවදානමයි. ප්‍රතිරක්ෂණය, සාමාන්‍ය රක්ෂණය, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, අග්‍රහාර රක්ෂණය වැනි බොහෝ උපායමාර්ගික ව්‍යාපාර ඒකක වෙත විවිධාංගීකරණය කිරීමෙන් ජාතික රක්ෂණ භාර අරමුදල තම ව්‍යාපාරික අවදානම අවම කර ඇත.

R03 - ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම හෝ මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින විට හිමිකම් ගෙවීම්, ප්‍රතිරක්ෂණ ගෙවීම් සහ භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම වැනි ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට ඇති නොහැකියාව. ප්‍රති මිලදී ගැනීම්, විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්, විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර සහ ණයකර වැනි විවිධ කල්පිරීම් සහිත ආයෝජන විවිධාංගීකරණය කිරීමෙන් මෙම අවදානම අවම කර ඇත.

**R04 - මෙහෙයුම් අවදානම**

මෙහෙයුම් පරිගණකකරණය සහ අභ්‍යන්තර විගණනය මගින් මෙහෙයුම් අවදානම අවම කරනු ලැබේ. වාරික එකතු කිරීම සහ හිමිකම් ගෙවීම්වල දෝෂ සහ විෂමතා අවම කිරීම සඳහා වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ අනෙකුත් දෙපාර්තමේන්තු වල අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.තවද, දෝෂ සහ විෂමතා අවම කිරීම සඳහා කාර්යාල මෙහෙයුම් පරිගණක ගත කර ඇත.

R05 - ජාත්‍යන්තර අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අන්තර්ජාතික දේශපාලන හා සමාජ-ආර්ථික ගතිකතාවයන් අධීක්ෂණය කර ඇති අතර එය ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යාපාරයට සෘජුවම බලපායි.මෙම අවදානම කළමනාකරණය කර ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණයට අදාළ ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රවණතා විශේෂයෙන් අධීක්ෂණය කිරීමෙනි.

R06 - ස්වභාවික අවදානම

වර්ෂාව, ගංවතුර, සුළි සුළං වැනි ස්වාභාවික විපත් මෙන්ම පළිබෝධ සහ කෘමීන්ගේ ප්‍රහාර හේතුවෙන් බෝග රක්ෂණය, සාමාන්‍ය රක්ෂණය සහ මෝටර් රථ රක්ෂණය කෙරෙහි බලපාන අවදානම මෙයින් අදහස් කෙරේ. කාලගුණ අනාවැකි සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කිරීම සහ ඒ අනුව වාරිකය පාලනය කිරීම මගින් මෙම අවදානම අවම කරනු ලැබේ. මෙය NNDIS වැනි ජාතික රක්ෂණ භාර අරමුදලේ රක්ෂණ ක්‍රමවලට බලපායි.

R07 - සමාහරණ අවදානම

සමාහරණ අවදානම යනු ආයතනය විසින් ණය ලබා දී ඇති හෝ ආයෝජනය කර ඇති ණය ගැතියන් හෝ මූල්‍යකරුවන්ගේ ගණන හෝ විවිධත්වය මත ආයතනයක කැපී පෙනෙන මූල්‍ය සංචිතවල සමස්ත ව්‍යාප්තියයි. සමාහරණ අවදානම අවම කරනු ලබන්නේ මූලික වශයෙන් අවදානම් රහිත රජයේ සුරැකුම්පත් සඳහා ආයෝජනය කිරීමෙන් සහ රජයේ බැංකු කිහිපයක් හරහා රජයේ සුරැකුම්පත්වල පමණක් ගනුදෙනු කිරීමෙන් ය.

R09 - කීර්ති නාම අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල ගනුදෙනුකරුවන්, පාර්ශවකරුවන් සහ මහජන මතය බැරෑරුම් ලෙස සලකන අතර එහි නම සම්බන්ධයෙන් ඇති වෙළඳපල කීර්තිය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ.ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි නිසි පරිදි අනුගමනය කරන බව සහතික කිරීම සඳහා ශක්තිමත් පාලනයක් සහ අනුකූලතා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන හෙයින්, සියලු උත්සාහයන් යොමු වන්නේ හොඳ ආයතනික වටිනාකම් සහිත ධනාත්මක වැඩ සංස්කෘතියක් නිර්මාණය කිරීම හා ශක්තිමත් කිරීම සඳහා ය.

R10 - වංචා අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කර ඇත.වංචනික ක්‍රියාකාරකම් වල අවදානම වළක්වාලීම සහතික කිරීම සඳහා ආයතනය තුළ ඇති සියලුම අභ්‍යන්තර පාලනයන් අඛණ්ඩව සමාලෝචනය කරන ඵලදායී අභ්‍යන්තර විගණන කාර්යයක් ජාතික රක්ෂණ භාර අරමුදල සතුව ඇත.මනාව ව්‍යුහගත වූ මෙහෙයුම් ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටිය, සහ පැහැදිලි සන්නිවේදන මාර්ග පූර්ව අනතුරු ඇඟවීමේ සංඥාවන් පැහැදිලිව ප්‍රකාශ වන බව සහතික කරයි.

R11 - විදේශ විනිමය අවදානම

විදේශ විනිමය ගනුදෙනු අවදානම තුරන් කිරීම සඳහා, ප්‍රතිරක්ෂණ වාරිකය ගෙවීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් දේශීය මුදල් වටිනාකම් සමග ගිවිසුම්ගත කර ඇත.

R12–ප්‍රතිරක්ෂණ අවදානම

විශිෂ්ට මූල්‍ය ශ්‍රේණිගත කිරීම් සහ ඉහළ ගෝලීය ශ්‍රේණිගත කිරීම් ඇති ප්‍රතිරක්ෂණකරුවන් සමඟ 2018 දී ජාතික රක්ෂණ භාර අරමුදල සිය ප්‍රතිරක්ෂණ කළඹ ආවරණය කිරීම සඳහා සාධාරණ පිරිවැයකින් ප්‍රතිරක්ෂණ ආවරණ ලබා ගත්තේය.වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල, ප්‍රතිරක්ෂණ ආවරණ (retrocession) වැඩසටහන සහ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා 2018 දී ප්‍රතිරක්‍ෂණ ආවරණ ලබා ගන්නා ලදී.

# තිරසර වාර්තාකරණය

තිරසර වාර්තාකරණය යනු තිරසර සංවර්ධනයේ ඉලක්කය වෙත ගමන් කිරීමේදී ආයතනික කාර්ය සාධනය පිණිස අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන්ට මැනීම, අනාවරණය කිරීම සහ වගවීම සම්බන්ධ යහපත් භාවිතයයි. තිරසාර වාර්තාකරණයේ අරමුණ වන්නේ ආයතනයකට සමාජ, පාරිසරික, සංස්කෘතික හා ආර්ථික ක්‍රියාකාරිත්වය සහ එහි බලපෑම පිළිබඳ තොරතුරු සැපයීම මෙන්ම වාර්තාකරණ සංවිධානයක එහි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීමයි. ජාතික තිරසාරභාවයට ඇති තර්ජන පිළිබඳ වැඩි අවබෝධයක් ඇති නිසා තිරසාරභාවය වැඩි වැඩියෙන් රජයන් වෙත යොමු වේ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ නියාමන අභිලාෂයන් සහ ඔවුන්ගේම තිරසාරභාවයට ඇති තර්ජන සහ නවෝත්පාදන හා පිරිවැය අඩුකිරීමේ අවස්ථාවන් නිසා සමාගම් තිරසාර බව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි.

2018 වසර ආරම්භයත් සමග රක්ෂණ කර්මාන්ත ව්‍යාපාරවල ආයතනික තිරසාරභාවය ප්‍රධාන සැලකිල්ලක් බවට පත්වෙමින් තිබේ. ඒ අනුව, ආර්ථික සමෘද්ධිය, පාරිසරික හා සමාජීය ගුණාත්මකභාවය යන ත්‍රිත්ව නව කාර්ය සාධන මානයන් සාක්ෂාත් කර ගැනීම තුළින් සිය ව්‍යාපාරික ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට ජාතික රක්ෂණ භාර අරමුදල උත්සාහ කරන අතර “හොඳින් වගකිව යුතු ආයතනික පුරවැසියෙකු” වීමට උත්සාහ කරයි. ජාතික රක්ෂණ භාර අරමුදල, අතීත සම්ප්‍රදාය අනුව යමින්, පහත වගුවේ දැක්වෙන පරිදි 2018 වසරේදී ඒකාබද්ධ අරමුදලට රු.මිලියන 2,750 ක් දායක කර ඇත.

**වගුව :ඒකාබද්ධ අරමුදලට දායකත්වය**

| වර්ෂය | ගණන රු. |
|---:|---:|
| 2018 | 2,750,000,000 |
| 2017 | 1,500,000,000 |
| 2016 | 3,200,000,000 |
| 2015 | 3,000,000,000 |
| 2014 | 4,000,000,000 |
| 2013 | 3,200,000,000 |

සමාලෝචිත වර්ෂය තුළදී, අග්‍රහාර සෞඛ්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය යටතේ සියලුම රජයේ සේවකයින්ට සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රවීණ රෝහල් සමඟ අවබෝධතා ගිවිසුම් රාශියක් අත්සන් කරන ලදී.

බංකොලොත්භාවය සහ ණය අවදානම අවම කිරීම සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ සන්නාම ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම මගින් පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා, ජාතික රක්ෂණ භාර අරමුදල සිය හිමි අගය AA- අඛණ්ඩව යාවත්කාලීන කරමින් සිටී.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

මුදල් විෂය භාරව අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත සඳහන් සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය කරනු ලැබේ.

(a) මුදල් විෂයය පවරා ඇති ඇමතිවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු:
(b) මුදල් විෂයය පවරා ඇති ඇමතිවරයාගේ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී:
(c) සෞඛ්‍යය විෂයය පවරා ඇති ඇමතිවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු:
(d) රාජ්‍ය කළමනාකරණය විෂයය පවරා ඇති අමාත්‍යංශයේ නිලධාරියෙකු: හා
(e) අමාත්‍යවරයා විසින් නම් කළ මුදල් බැංකුකරණය, රක්ෂණ කළමනාකරණය හෝ නීතිය යන ක්ෂේත්‍රයන්හි සුදුසුකම් හෝ විශේෂඥතාවයන් ඇති පුද්ගලයින් තිදෙනෙකු.

මණ්ඩලයේ එක් අයෙකු සභාපති ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.පනතට අනුව, මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පත් කළ දින සිට වසර පහක කාලයක් සඳහා ධුරය හෙබවිය යුතුය. 2018 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 9 ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ වාර්තා විශිෂ්ට ලෙස පවත්වා ගෙන යනු ලැබේ.අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට මණ්ඩලයේ සාමාජිකයින්ගේ පැමිණීම පහත දක්වා ඇත.

| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් | 2018 අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම | | | | | | | | | | | | අධ්‍යක්ෂකවරුන් ලෙස පත් වූ දිනය | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | | |
| මංජුල ද සිල්වා මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | | ✓ | 06/04/2015 | - |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලෙ මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | | ✓ | 08/04/2015 | - |
| අසෙන්ද්‍ර සිරිවර්ධන මයා | නොපැ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | නොපැ | | ✓ | | ✓ | 02/04/2015 | - |
| එච්. ඒ. සී. කුමරසිංහ මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | - | ✓ | 14/12/2015 | - |
| පී.පී.ස් රොහණ ද සිල්වා මයා | ✓ | ✓ | ✓ | | ✓ | නොපැ | ✓ | ✓ | | ✓ | | ✓ | 05/05/2016 | - |
| එන්.එම්.ඩී. නවරත්න මයා | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | | ✓ | 31/07/2017 | - |
| ඒ.කේ. සෙනෙවිරත්න මයා | | නොපැ | නොපැ | | | | | | | | | | 22/02/2018 | 05/2018 |
| කේ. ඒ. විමලේන්තිරාජා මයා | | | | | | | | ✓ | | නොපැ | | නොපැ | 29/08/2018 | - |

අනුමත ව්‍යාපාර සැලැස්ම සහ ආයතනයේ මූල්‍ය හා භෞතික ඉලක්ක මත පදනම්ව ව්‍යාපාරය සුදුසු ආකාරයකින් සිදු කිරීම සහතික කිරීම සඳහා මණ්ඩලය ආයතනයේ පාර්ශවකරුවන්ට වගකිව යුතුය.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර සමාලෝචන**

2018 දී ජාතික රක්ෂණ අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ රාජ්‍ය නිලධාරීන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (අග්‍රහාර), අනිවාර්ය ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය, මෝටර් රථ රක්ෂණ යෝජනා ක්‍රමය, සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම, ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය, කෘෂිකාර්මික ණය ආරක්ෂණ රක්ෂණ යෝජනා ක්‍රමය සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල (SRCC&TF) ක්‍රියාත්මක කිරීමයි.

**මූල්‍ය ප්‍රතිඵල**

2018 දී ජාතික රක්ෂණ භාර අරමුදලේ දළ ලිඛිත වාරිකය රු මිලියන 9,684 ක් විය. ප්‍රධාන වශයෙන් ප්‍රතිරක්ෂණ සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලෙන් ලැබෙන වාරිකය වැඩිවීම හේතුවෙන් දළ ලිඛිත වාරිකය 2017 වසරේදී මිලියන 9,071 ට සාපේක්ෂව සුළු වර්ධනයක් වාර්තා කළේය. 2018 දී ජාතික රක්ෂණ භාර අරමුදලේ උපයාගත් ලාභය බදුවලින් පසු රු මිලියන 3,183 ක් විය.

**සේවකයන්**

2018.12.31 දින වන විට ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය මණ්ඩල ශක්තිය 238 ක් විය.

**විගණකවරුන්**

1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුව 2018 වසරේ ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී.

**විගණන කමිටුව**

2018 වසරේදී විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය; එනම් කේ.ඒ. විමලන්තිරරාජා මහතා (සභාපති)- (අධ්‍යක්ෂ ජනරාල් - ෆිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව -2018), ටී ආර් ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ අසේන්ද්‍ර සිරිවර්ධන මහතා.

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා පත් කරන ලද විගණන අධිකාරී ද කමිටුවේ ආරාධනය මත නිරීක්ෂකයෙකු ලෙස කමිටුවේ රැස්වීම්වලට සහභාගී විය.කාරක සභා රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් තොරතුරු සහිතව සටහන් කර ඇති අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන කමිටුව විසින් ඉදිරිපත් කර අනුමත කරන ලදී. 2018 වර්ෂය තුළ, සියලුම අංශවල අභ්‍යන්තර විගණනය සහ  වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල විගණනය ඇතුළු අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

**ආයතනික පාලනය**

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද හොඳම භාවිතයන් පිළිබඳ ආයතනික පාලන නීති සංග්‍රහයේ සහ සහ යහපාලනය සහ ආයතනික පාලන පිළිවෙත් සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් එහි ආයතනික පාලන පිළිවෙත් ක්‍රියාත්මක කර ඇත.

මවාහිබ් මව්ජූඩ්
සභාපති

ගයත්‍රි සොයිසා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (වැඩ බලන)

2021 ඔක්තෝබර් 03
කොළඹ



# මූල්‍ය වාර්තා

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

## ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TRE/C/NITF/2018/FA/08 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019 නොවැම්බර් 18 දින

සභාපති,

ජාතික රක්ෂණ භාර අරමුදල.

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපතිවරයාගේ වාර්තාව



1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රමිතියෙහි 20 වන ඡේදය ප්‍රකාරව, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය, විස්තීරණ ආදායම් ප්‍රකාශණය තුළ හෙලි කරන ලද ආදායම් සහ වියදම් සහ තොගවල හා මෙහෙයුම් සම්බන්ධ ලැබිය යුතු හා ගෙවිය යුතු අගයන්ගේ කාලපරිච්ඡේදයේ වූ වෙනස්වීම් පෙන්නුම් කිරීමෙන් ඉදිරිපත් කළ හැකි බව සඳහන්ව ඇති නමුත්, අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය තීරණය කිරීමේදී බදුපෙර ලාභය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශණය තුලින් නොගලපන ලද එකතුව රු.627,653,598 ක් වූ අයිතම 02 ක් සඳහා ගැලපීම් කර තිබුණි.

(ii) LKAS 16 දේපල පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 40 වන ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලයක් වශයෙන් වත්කමක ධාරණ අගය අඩුවීමක් සිදුවන විටක එම අඩුවීම වියදමක් ලෙස හඳුනාගත යුතු බව සඳහන් වේ. එහෙත් අරමුදල 2018 වර්ෂයට අදාලව සිදුකරන ලද ප්‍රත්‍යාගණනයට අදාලව වත්කම්හි ධාරණ අගය රු.2,102,126 කින් අඩුවීම පෙර වර්ෂයන්ට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තයක් නොමැතිව අරමුදලේ ලාභය ගණනයේදී වියදමක් ලෙස හඳුනා නොගෙන වෙනත් විස්තීරණ ආදායමින් අඩුකර දක්වා තිබුණි.

(iii) LKAS 01 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම ප්‍රමිතියෙහි 114 වන ඡේදයෙහි (ඇ) ප්‍රකාරව පරිශීලනය කරන්නන් හට මූල්‍ය ප්‍රකාශයේ තේරුම් ගැනීම සහ ඒවා අන් අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශ සමඟ සංසන්දනය කිරීම පහසුව සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ යන ප්‍රකාශනයන්හි ඉදිරිපත් කර ඇති අයිතමවලට උපකාරක තොරතුරු එක් එක් ප්‍රකාශය සහ එක් එක් පේලි අයිතමය ඉදිරිපත් කර ඇති අනුපිළිවෙලට සටහන් මඟින් ඉදිරිපත් කල යුතු වේ. එසේම, LKAS 12 ආදායම් බදු ප්‍රමිතිය ප්‍රකාරවද ආදයම් බදු ගණනය කිරීම් පිළිබඳ හෙලිදරව් කිරීම කල යුතු බව වැඩි දුරටත් සඳහන් වේ. එසේ වුවද, අරමුදල ආදායම් බදු බැරකම

# විගණකාධිපතිවරයාගේ වාර්තාව



සටහනක් මඟින් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබීම හේතුවෙන් එම අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ බව තහවුරු නොවිය.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2018 වර්ෂය තුළදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත වන්දි ගෙවීම වෙනුවෙන් රු. 1,813,322,777 ක් ලබා දී තිබුණු අතර ඒ සඳහා අරමුදල විසින් වන්දි ගෙවීම් සඳහා වෙන් කිරීමේ ගිණුමක් හා වගා රක්ෂණ වන්දි සඳහා වගකීම් වෙනස්වීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. මෙම ගිණුම් දෙකෙහිම නොවැම්බර් මස පමණක් ගණුදෙනු ඇතුළත් කර තිබුණු අතර දෙසැම්බර් මාසය සඳහා වෙන් කිරීම් ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන්, මණ්ඩලය වෙත දෙසැම්බර් 14 හා 26 දින ගෙවා තිබූ නොවැම්බර් මාසයට අදාළ එකතුව රු. 62,761,857 ක් වගා රක්ෂණ වන්දි සඳහා වෙන් කිරීම් ගිණුමේ අවසාන ශේෂය ලෙස පෙන්නුම් කර තිබුණි.

(ii) ප්‍රතිරක්ෂණ අංශයෙහි 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාරික ආදායම තුළ ආයතනයන් 03 කට අදාළ රු. 20,444,071 ක් වූ බැර ශේෂයක් පැවතුනු අතර ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) රක්ෂණ සමාගම් වලින් වැඩවර්ජන, කැරලි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී (SRCC & TR) අරමුදලේ රක්ෂණ වාරික අයකර ගැනීමට අදාළව (අරමුදලේ අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති පරිදි) එක් සමාගමක වාරික විගණනයේදී අරමුදල වෙත ගෙවා තිබූ හා සත්‍ය වශයෙන් ගෙවිය යුතු වාරික මුදල් අතර රු. 8,490,385 ක වෙනසක් විය.

(iv) ප්‍රතිරක්ෂණ අංශයෙහි ලැබිය යුතු වාරික ආදායමට අදාල ලෙජර ගිණුම් ශේෂය හා ණයගැති කාල විශ්ලේෂණය අතර රු. 9,072,974 ක වෙනසක් විය.

(v) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ගේ දෛනික මුදල් තැන්පතු දිනයන් හා පද්ධති ලදුපත් නිකුත් කර ඇති දිනයන් අතර සැලකිය යුතු කාල පරතරයක් පැවතිම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි 2018 වර්ෂයේ ආදායමට බැර විය යුතු

විගණකාධිපතිවරයාගේ වාර්තාව



රු.2,502,302 ක වටිනාකමක් 2019 වර්ෂයේ ආදායමක් වශයෙන් හඳුනාගෙන තිබුණි.

(vi) අරමුදල හා ප්‍රතිරක්ෂණ ආයතනය අතර 2018.03.31 දින සිට 2019.03.31 දින දක්වා ඇති කර ගත් ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව, රු. 98,670,792 ක වාර්ෂික වාරිකයන් ගෙවනු ලබන අතර ඉන් කාර්තුවක වාරික වටිනාකම රු. 24,667,698 ක් වුවද නොඉපයූ වාරික ලෙස රු. 24,329,784 ක් වෙන් කිරීම හේතුවෙන් නොඉපයූ වාරික - වගා ප්‍රතිරක්ෂණ ගිණුම හා නොඉපයූ වාරික සංචිත ගිණුම තුළ රු. 337,914 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(vii) එක් ප්‍රතිරක්ෂණ ආයතනයක් විසින් විගණනයට ඉදිරිපත් කල සෘජු ශේෂ සනාථන අනුව 2018 දෙසැම්බර් 31 දිනට අරමුදල වෙත ගෙවිය යුතු මුදලක් නොමැති බව දක්වා තිබුණද අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල රු. 147,376,867 ක් එම ආයතනයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබීම හේතුවෙන් ශේෂ සනාථන හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 147,376,867 ක වෙනසක් විය.

(viii) එසේම එම ශේෂ සනාථන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට අදාලව අරමුදලෙන් ලැබිය යුතු ශේෂය රු. 309,562,948 ක් විය. එසේ වුවද, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව, ගෙවිය යුතු ලෙස එවැනි මුදලක් ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන හා ශේෂ සනාථන අතර රු. 309,562,948 ක වෙනසක්ද විය.

(ix) මූල්‍ය ප්‍රකාශනවල අරමුදලේ ආයෝජන ආදායම ලෙස දළ ආදායම දැක්විය යුතු වුවද ශුද්ධ ආදායම ගිණුම්වල ඇතුළත් කර තිබුණි. ඊට අදාළව වර්ෂය අවසානයේදී ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් ආයෝජන ආදායම රු. 128,781,294 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ප්‍රතිරක්ෂණ ආයතන වෙතින් ලැබිය යුතු එකතුව රු.1,468,768,756 ක ශේෂයෙන් රු.1,321,391,889 ක ශේෂ සඳහා සෘජු ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව



(ii) වසර ගණනාවක සිට ප්‍රතිරක්ෂණ අංශයෙහි ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. 9,053,364 ක් වටිනාකමැති, රක්ෂණ ආයතනයක් වෙත නිකුත් කළ හරපත් හා බැරපත් සම්බන්ධව තොරතුරු මෙතෙක් විගණනයට ඉදිරිපත් නොවිය.

(iii) NITF අංශය සේවක ආපදා ණය ගෙවීම සඳහා SRCC අංශයෙන් ලබා ගන්නා ලද රු. 3,462,112 ක මුදල NITF අංශය මගින් නැවත SRCC අංශය වෙත නිරවුල් කර ඇති බව දන්වා සිටිය ද එලෙස නිරවුල් කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(iv) Cheque Return – Car ACC Motor ගිණුම තුල පෙන්නුම් කරනු ලබන රු. 585,481 ක 2012 වසරේ සිට පැවත එන ශේෂයක් වන අතර ඒ සම්බන්ධ කිසිදු මූලාශ්‍ර ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවිය.

(v) 2012 වසරේ සිට පැවත එන රු. 270,049 ක ගෙවූ තැන්පතු ලෙස නිරූපණය වන ශේෂයට අදාල තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඈ) නොසැසඳීම්

----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් රු.33,593,020 ක් වූ ආපදා ණය ශේෂය, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව රු. 34,364,395ක් වීම හේතුවෙන් රු. 771,375 ක වෙනසක් විය.

(ii) වෙනත් මූල්‍ය නොවන වත්කම් තුල ඇතුළත් රු. 773,506 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂය, විගණනයට ඉදිරිපත් කරන ලද උප ලේඛන අනුව රු. 616,702 ක් වීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අතර රු. 156,804 ක වෙනසක් විය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව



(ඉ) නිරවුල් නොකරන ලද ශේෂයන්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අරමුදලේ ප්‍රතිරක්ෂණ අංශයෙහි 2015 වර්ෂයට අදාළව විකුණුම් ඉන්වොයිස් මත ගෙවිය යුතු වූ රු. 42,434,299 ක් කොමිස් මුදල විගණිත දිනය වූ 2019 මැයි 06 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ii) 2018 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණය - මෝටර් නොවන අංශයෙහි ලැබිය යුතු වාරික ආදායමට අදාලව ශේෂ පත්‍ර දිනට පසු ලැබීම් පිළිබඳ සිදුකල පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි 2019 මාර්තු මාසය වන විටත් රු.5,730,959 ක හිඟ ශේෂ පැවතුණි.

(iii) 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී (SRCC) අරමුදලට අදාළව නිරවුල් නොකළ රු.18,509,275 ක හිමිකම් ගෙවීම් (Non Motor) විගණිත දිනය වූ 2019 ජූලි 31 දින වන විටත් නිරවුල් නොවී පැවති බව නිරීක්ෂණය විය.

(iv) අග්‍රහාර රක්ෂණ සාමාජිකයින් පිළිබඳ තොරතුරු ඇතුළත් විධිමත් දත්ත පද්ධතියක් (Data base) නඩත්තු කිරීමට අරමුදල කටයුතු කර නොතිබීමත්, ගෙවිය යුතු හිමිකම් අදාළ වන්දි ඉල්ලුම්කරුවන්ට නිරවුල් කිරීමේ ක්‍රමවේදයේ ඇති දුර්වලතාවයන් හේතුවෙනුත් 2019 මැයි වන විටත් රු.8,319,124 ක නිරවුල් නොකරන ලද ශේෂ පැවතුණි.

(v) අරමුදලේ SRCC අංශයට අදාලව 2007 වර්ෂයේ සිට පැවත එන රු. 3,843,488 ක ආපසු ගෙවිය යුතු වාරික මුදල් ශේෂය 2019 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(vi) අග්‍රහාර වන්දි ගෙවීම් වෙනුවෙන් නිකුත් කරන ලද චෙක්පත් අවලංගු වීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනාගන්නා ලද රු. 2,632,770 ක ශේෂය විගණිත දිනය වූ 2019 මැයි 08 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව



(vii) 2015 වර්ෂය අවසානයේ රු. 1,073,351 ක් ලෙස පැවතුණු අරමුදල විසින් රක්ෂණ ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු ශේෂය, 2016, 2017 හා 2018 වර්ෂ අවසානයේ රු. 1,513,897 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. ඒ අනුව වසර 04 කට අධික කාලයක සිට පැවත එන මෙම අගය නිරවුල් කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

# විගණකාධිපතිවරයාගේ වාර්තාව



## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

විගණකාධිපතිවරයාගේ වාර්තාව



ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පසුගිය වර්ෂයේ විගණකාධිපතිවරයා විසින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදු කරන ලද ඇතැම් නිර්දේශ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොතිබුණි.

# විගණකාධිපතිවරයාගේ වාර්තාව



අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

  (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2015 අනුව, උත්සව අත්තිකාරම් වශයෙන් ලබා දිය හැකිඋපරිම මුදල්රු. 10,000 ක් වුවද, අරමුදල විසින් එම සීමාව නොසළකා කාර්ය මණ්ඩලයෙහි 117 දෙනෙකු සඳහා මූලික වැටුප පදනම් කර ගනිමින් උත්සව අත්තිකාරම් ලෙස රු. 3,229,139 ක් ගෙවා තිබුණි.

  (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව, ලබාගන්නා තත්කාරය අතුරු අග්‍රිමය එය දෙන ලද කාර්යය නිමකල වහාම නැවත පියවියයුතු වුවත් 2018 වර්ෂයේ නිකුත් කර ලද රු. 448,000 ක් වූ උප අග්‍රිම 13 ක් පියවීම සඳහා මාස 01 සිට මාස 4 ½ ක දක්වා කාලයක් ගතවී තිබුණි.

  (ඇ) 2018 වර්ෂයේ ගෙවිය යුතු නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම් රු. 60,752,249 ක් වන අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව රු. 53,891,837 කින් එනම් සියයට 786 කින් ඉහළ ගොස් තිබුණි. ඒ තුල ඇතුළත් 2017 වර්ෂයේ ජාතික ආපදා රක්ෂණ වැඩසටහනට අදාළව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම් රු.57,436,510 ක් විය. එම චෙක්පත් නිකුත් කළ දින සිට වර්ෂයක පමණ කාලයක් ගත වී තිබුණද, මු.රෙ. 396 පරිදි කටයුතු කර නොතිබුණි.

  (ඈ) මු.රෙ. 139 ට අනුව වවුචර් සඳහා චෙක්පත් මඟින් ගෙවීම් කිරීමේදී ගෙවීම් කරනු ලබන නිලධාරියා විසින්, බැංකු ශේෂය සියලුම ගෙවීම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් බවට සහතික විය යුතු වුවත් එලෙස බැංකු ශේෂය පිළිබඳව

විගණකාධිපතිවරයාගේ වාර්තාව



සැලකිලිමත් වීමකින් තොරව චෙක්පත් නිකුත් කිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට නිකුත් කල නමුත් ඉදිරිපත් නොකරන ලද චෙක්පත් වටිනාකම රු. 9,837,431 ක් වූ අතර එදිනට බැංකු ශේෂය රු. 6,224,696 ක් විය. එම චෙක්පත් එදිනට නිශ්කාශනය වූයේ නම් රු. 3,612,734 ක බැංකු අයිරාවක් ඇතිවන බව නිරීක්ෂණය විය. මු.රෙ. 387 ප්‍රකාරව ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම් බවද දක්වා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  (අ) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 04 ඡේදයේ සඳහන් වියදම්වලට පමණක් වැඩවර්ජන, කැරළි ගැසීම් සහ ජන කැළඹීම් හා ත්‍රස්තවාදී අරමුදල පිළිබඳ (SRCC) විශේෂ ගිණුමේ ඇති මුදල් භාවිතා කළ හැකි වුවත් එපරිදි කටයුතු නොකර 2018 හා 2019 වර්ෂ සඳහා ඊට අදාළ නොවන වියදම් සඳහා එකතුව රු.69,708,220 ක මුදල් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය.

  (ආ) ස්වාභාවික විපත්වලට එරෙහිව රක්ෂණාවරණය ලබා දීම සඳහා අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය NNDIS හිමිකම් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම යටතේ ක්‍රියා කළ යුතු මාර්ගෝපදේශයට අනුව ක්‍රියා කර නොමැති පහත අවස්ථා නිරීක්ෂණය විය.

    (i) අදාළ හිමිකම් අයදුම්පත් සඳහා ප්‍රාදේශීය ලේකම්තුමාගේ අත්සන් සහ රබර් මුද්‍රාව නොමැතිව ඉදිරිපත් කිරීම

    (ii) රු. 500,000 ඉක්මවන හිමිකම් අයදුම්පත් සම්බන්ධව අවධානම් ඉන්ජිනේරුවරයෙකු මඟින් තක්සේරු කිරීම අවශ්‍ය වුවද, අරමුදල විසින් එසේ සිදු කර නොමැති වීම

    (iii) හිමිකම් අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී අදාළ හිමිකම්ලාභියා සම්බන්ධව ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් නොවීම.

    (iv) ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ තාවකාලික වාසස්ථාන, කුටි හෝ වෙනත් ස්ථිර නොවන රාමු යටතේ සකස්

විගණකාධිපතිවරයාගේ වාර්තාව



කරන ලද ඉදිරි කිරීම් සඳහා වන්දි නොගෙවනු ලැබුවත් අරමුදල විසින් එසේ ගෙවා නොතිබීම.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අරමුදල හා ප්‍රතිරක්ෂණ ආයතනය සමඟ 2018.03.31 දින සිට 2019.03.31 දින දක්වා ප්‍රතිරක්ෂණ ගිවිසුමකට එළඹ තිබුණ අතර වර්ෂය තුළ ඒ සඳහා රු. 98,670,792 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද, එම ප්‍රතිරක්ෂණ ගිවිසුම හා ප්‍රතිරක්ෂක තෝරා ගැනීමට අදාල ප්‍රසම්පාදන තොරතුරු අරමුදල සතුව නොපැවතුණි.

(ආ) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් 2018 පෙබරවාරි 02 දින රු. 290,000,000 ක් ඉල්ලුම් කර තිබුණු අතර අරමුදල විසින් ඒ සඳහා සියයට 7.15 පොලියකට ආයෝජනය කරන ලද රු. 780,000,000 ක වටිනාකමකින් යුත් ස්ථාවර තැන්පතුවක් කල් පිරීමට පෙර වගා බදු ජංගම ගිණුමට මාරුකරගෙන තිබුණි. ඉන් රු. 149,134,697 ක වටිනාකමක් රඳවාගෙන රු. 140,865,303 ක් පමණක් නිදහස් කර තිබුණි.

(ඇ) එසේම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් රු. 250,380,277 ක් නැවත වරක් ඉල්ලුම් කර තිබුණ අතර මණ්ඩලය විසින් 2018 නොවැම්බර් 01 දින සියයට 8.55 පොලියට ආයෝජනය කරන ලද රු. 97,000,000 ක ස්ථාවර තැන්පතුවක් කල් පිරීමට පෙර වගා බදු ජංගම ගිණුමට මාරු කර ඉන් රු. 21,675,815 ක් රඳවාගෙන රු. 75,324,185 ක මුදලක් පමණක් ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත නිදහස් කර තිබුණි.

(ඈ) තැපැල් හා විදුලි සංදේශ නිළධාරීන්ගේ සංගමය (The Union of post and Telecommunication officers) සහ ජාතික රක්ෂණභාර අරමුදල අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව, අරමුදල මගින් රු. 39,600,000 ක තැන්පතුවක් සංගමය වෙත තබා ඇති අතර නිසි පරිදි ව්‍යාපාරික කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය තුළ අරමුදල් නිශ්කාර්ය ලෙස වෙනත් පාර්ශවයක් වෙත

විගණකාධිපතිවරයාගේ වාර්තාව



රදවා තිබුණි. ඒ අනුව මෙම අරමුදල් වෙනත් ආයෝජන මාර්ගයක යොදවා ප්‍රතිලාභ ඉපයීමට තිබූ අවස්ථාව අරමුදල විසින් අහිමි කර ගෙන තිබුණි.

(ඉ) 2018 වර්ෂයේදී රු. 1,838,208 ක පිරිවැයක් දරා ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂාවක් හා ප්‍රත්‍යාගණනයක් සිදු කර තිබූ අතර මේ සම්බන්ධව 2017 හෝ 2018 වර්ෂවල ප්‍රසම්පාදන සැලසුම්වල ඇතුලත් නොකොට අභ්‍යන්තර මෙමෝ පත්‍රයක් මගින් අනුමැතිය ලබාගෙන මිල ගණන් කැඳවා තිබුණි. ලංසු කැඳවූ ලේඛනයේ ඇතුළත් තොරතුරු අනුව, මිල ගණන් කැඳවීම් ලිපි ආයතන 05 කට යවා තිබුණද එම ආයතන තෝරා ගත් පදනම විගණනයේදී පැහැදිලි නොවීය.

2017 ජූලි 10 දින මිල ගණන් කැඳවූ මෙම ප්‍රසම්පාදන කාර්යයෙහි ලංසුකරුවෙකු තෝරා ගැනීම 2018 ජනවාරි 23 දින එනම් මාස 06 කට පසු සිදුව ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) හා (ආ) ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොමැති බව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.1.1 (අ) හා (ආ), අංක 5.2 (අ) හා (ආ), අංක 5. 3.10 හා 7.5.1 ඡේදවලට අනුකූලව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

---

(අ) 2018 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ වගා රක්ෂණ ගිණුමේ රු.1,640,828,796 ක ශේෂයක් පැවතිය යුතු වුවද අරමුදලේ මූල්‍ය කළමණාකරු විසින් විගණනයට ලබාදුන් වාර්තාව අනුව, 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ඉතිරි ශේෂය රු. 1,641,687,854 ක් විය. මෙම මුදලින් උපයෝජනය වන වත්කම් පිළිබඳව විගණනය විසින් විමසූ අතර ඒ සඳහා ඉදිරිපත් කල තොරතුරු අනුව, ඉන් රු. 1,462,969,344 ක ශුද්ධ අගයක් වෙනත් රක්ෂණ අංශ වෙත නිකුත් කල මුදල් බව නිරීක්ෂණය විය.එසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2017 ජුනි 28 දින නිකුත් කළ උපදෙස් මාලා අංක IBSL/DG/SUP/17/06/233 අනුව, එක් එක් අංශයන්හි අරමුදල් ඒවා ස්ථාපිත කිරීමේ අරමුණ උදෙසා යොදා ගතයුතු බවට උපදෙස් ලබා දී තිබුණි.

(ආ) අරමුදල විසින් වගා බදු ගෙවිය යුතු ආයතනවලට කාර්තු හා වාර්ෂික පදනමින් ආකෘති පත්‍රයක් ලබා දෙන අතර ගෙවීම් ප්‍රමාද කරන අයට දඩ මුදල් පිළිබඳ දන්වා ලිපිද යවනු

විගණකාධිපතිවරයාගේ වාර්තාව



ලබයි. කෙසේ වුවද, අයකර ගත් දඩ මුදල වගා රක්ෂණය - බදු ආදායම් ගිණුමෙහි ගිණුම්ගත කිරීම හැර අයකර ගත් දඩ මුදල් වෙනමම ගිණුමක ගිණුම්ගත කිරීමට, ලැබිය යුතු දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කිරීමට හෝ බදු ගෙවීම් ප්‍රමාද කරන/ පැහැර හරින ආයතන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධ විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතන 06 ක් විසින් 2017/18 වර්ෂය සඳහා මෙම රු.2,386,165 ක භෝග රක්ෂණ බද්ද හා ඒ මත ගණනය කර තිබූ රු.270,313 ක දඩ මුදල්, විගණිත දිනය වූ 2019 අගෝස්තු 30 දින වන විටත් අයකර ගෙන නොතිබූ බවත් එම දඩ මුදල් අයකර ගැනීමට අරමුදල විසින් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බවත් නියැදි පදනම මත සිදුකල පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලට අදාළව නොවිසඳුණු නඩු 189 ක් පැවතුණු අතර ඒ වෙනුවෙන් ඉල්ලුම් කල ප්‍රතිෂ්ඨාවන්හි මුළු වටිනාකම රු. 773,579,952 ක් වූ අතර සමහර නඩු වසර ගණනාවක සිට ඉදිරියට එමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) **ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය**

අරමුදලේ එක් එක් අංශ යටතේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය පහත පරිදි විය.

**I. ප්‍රතිරක්ෂණ අංශය**

i. ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිරක්ෂණ අංශය මඟින් 2018 වර්ෂයේ මෝටර් හා මෝටර් නොවන සාමාන්‍ය රක්ෂණ සඳහා ප්‍රතිරක්ෂණය කිරීමට සැලසුම්කර තිබුණු අතර එම කාර්යය විගණිත දිනය වන විටත් අවසන් කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

ii. ප්‍රතිරක්ෂණාවරණ හා වන්දි ගෙවීම් ක්‍රියාවලිය පද්ධති වාර්තාවක් ලබාදීම ද ඇතුලත්ව ස්වයංක්‍රියකරණය කිරීම සඳහා සැලසුම් කර තිබුණු නමුත් විගණිත දිනය වන විටත් එම කාර්යය ආරම්භ කර නොතිබුණි.

iii. 2018 වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණාවරණ පිළිබඳ ජත්‍යන්තර මට්ටමින් දැනුවත් කිරීමේ සමුළු 01 ක් ද, දේශීය මට්ටමින් දැනුවත් කිරීමේ සමුළු 04 ක් ද (කාර්තුවකට එක බැගින්) පැවැත්වීමට සැලසුම් කර තිබුණද විගණිත දිනය

විගණකාධිපතිවරයාගේ වාර්තාව



වූ 2019 මැයි 14 දින වන විටත් දැනුවත් කිරීමේ එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

II. සාමාන්‍ය රක්ෂණය - මෝටර් නොවන

i. 2017 වර්ෂය තුල ඒකාබද්ධ විදේශ රක්ෂණ ඔප්පුවක් එනම් පවතින රක්ෂණාවරණය පුළුල් කිරීමට සැලසුම් කර තිබුණද එය 2018 වර්ෂය තුල හෝ ක්‍රියාත්මක නොකොට 2019 වසර දක්වා කාලරාමුව දීර්ඝ කර තිබුණි.

ii. අග්‍රහාර රක්ෂණාවරණය මඟින්, පොදු සෞඛ්‍ය යෝජනා ක්‍රමයක් කොටස් වශයෙන් සෑම ක්ෂේත්‍රයක් වෙනුවෙන්ම පිහිටුවීමට සැලසුම් කර තිබුණද, අර්ධ රාජ්‍ය අංශයෙහි පමණක් එකී කටයුතු ආරම්භ කර තිබුණු අතර පෞද්ගලික අංශයන්හි දායකත්වයක් ලබාගෙන නොතිබුණි.

III. මූල්‍ය අංශය

අරමුදල, ප්‍රතිරක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය ලෙස වෙන් කිරීමට 2017 වර්ෂයේදී සැලසුම් කර තිබුණද එම කටයුතු 2019 වර්ෂය වන විටත් අවසන් කර නොතිබුණි.

IV. ස්වාභාවික ආපදා

මෙම අංශය මඟින් රක්ෂණ කර්මාන්තය සඳහා ස්වභාවික ආපදා සංචිතයක් (Disaster Pool) නිර්මාණය කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ මඟින් ප්‍රධාන විධායක නිලධාරී සඳහා තොරතුරු වාර්තාවක් ලබාදීමට ද එම සංචිතයෙන් ලැබෙන වාසි පිළිබඳ රක්ෂණ කර්මාන්තය දැනුවත් කිරීමට ද ශ්‍රේණිගත කිරීමද , ස්වාභාවික ආපදා සංචිත සඳහා රාමුවක් සකස් කිරීම ද, තාක්ෂණික ඇගයීම් කමිටුවක් ඇති කිරීම යනාදී ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වූ 2019 මැයි 14 දින වන විටත් මීට අදාලව කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

V. කෘෂි රක්ෂණය හා ක්ෂුද්‍ර රක්ෂණය

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත පිහිටුවීමේ ප්‍රධාන අරමුණක් වූ ක්ෂුද්‍ර රක්ෂණය මඟින් සංක්‍රමණික සේවකයන් ද පංශු සම්පත් හා ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්, වතු කම්කරුවන් හා ගොවීන් ආවරණය වන

විගණකාධිපතිවරයාගේ වාර්තාව



ලෙස රක්ෂණාවරණ හඳුන්වාදීමට සැලසුම්කර තිබුණද විගණිත දිනය වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

VI. **තොරතුරු තාක්ෂණ අංශය**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව තොරතුරු තාක්ෂණ අංශය සඳහා නව පද්ධතියක් ස්ථාපිත කිරීමට හා ගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් සමාලෝචනයක් සිදු කිරීම, අඩුලුහුඩුකම් තීරණය කිරීම බාහිර සම්පත් යොදා ගනිමින් මේ සම්බන්ධව ඇගයීමක් සිදුකිරීම් ආදිය සැලසුම් කර තිබුණද ඊට අදාල ඉදිරි පියවර කිසිවක් ගෙන නොතිබුණි.

(ට) **කාර්ය මණ්ඩල පරිපාලනය**

i. 2018 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු පැවති අතර ඒ තුළ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක්, කළමනාකරු තනතුරු 03 ක් හා අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් විය. අනුමත අභ්‍යන්තර විගණක තනතුරද ඇතුලත්ව ඉහත කී තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොමැති බව 2016 හා 2017 වර්ෂයන්හි විගණන විමසුම් තුළින්ද පෙන්වා දී තිබුණද, එසේ ක්‍රියා නොකොට එකී තනතුරු සඳහා 2018 සැප්තැම්බර් සිට මේ දක්වා වැඩ බැලීමේ පදනම මත තනතුරු පිරවීමට අරමුදල ක්‍රියාකර තිබුණි.

ii. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එම තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව කලයුතු වුවත් තනතුරු 04 ක් 2018 සැප්තැම්බර් සිට මේ දක්වා වැඩ බැලීමේ පදනම මත පත්වීම් සිදු කර තිබීම හේතුවෙන් එය ආයතන සංග්‍රහයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවිය.

iii. තෘතියික හා ද්විතියික මට්ටම්වල එකතුව 31 ක් වූ තනතුරු පුරප්පාඩු පැවතුණු අතර එම තනතුරු විගණිත දිනය වූ 2019 ජුලි 31 දින වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

iv. තාක්ෂණික මට්ටමේ පුරප්පාඩු තනතුරු 04 අතුරින්, 2017 වර්ෂයේදී බඳවා ගැනීමේ පටිපාටි අනුමත වී තිබූ ආයුගණක (Actuarial), කළමනාකරු හා අවධානම් අංශයෙහි ඉංජිනේරු තනතුරු සඳහා අනුමත කාර්ය පිරිවිතරයන් අනුව, එම තනතුරු අරමුදලේ කටයුතු සඳහා අත්‍යවශ්‍ය තනතුරු වූ අතර 2006 වර්ෂයේ සිට රක්ෂණ ක්ෂේත්‍රයේ නියැලී සිටින අරමුදල විසින් මෙකී පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

# මූල්‍ය ප්‍රකාශය

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

| | සටහන් | | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|---|
| දළ ලිඛිත රක්ෂණ වාරික | 1 | | 9,683,874,748 | 9,071,278,467 |
| අග්‍රහාර සඳහා ලද දායකත්ව මුදල් | 1 | | 4,017,420,904 | 2,726,522,599 |
| එකතු කළ වගා රක්ෂණ බදු | | | 2,138,167,676 | 1,878,361,459 |
| ලබා දුන් ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික | | | (2,460,537,699) | (1,146,635,715) |
| SRCC හා Tr අරමුදල වෙත ලබා දුන් | | | (25,439,340) | (28,647,172) |
| **ශුද්ධ ලිඛිත රක්ෂණ වාරික** | | | **13,353,486,289** | **12,500,879,639** |
| නොඉපැයූ රක්ෂණ වාරික සඳහා සංචිතයේ ශුද්ධ වෙනස | | | 299,945,178 | (887,050,657) |
| **ශුද්ධ ඉපැයූ රක්ෂණ වාරික** | | | **13,653,431,467** | **11,613,828,982** |
| | | | | |
| **වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම්** | | | | |
| ගාස්තු හා කොමිස් ආදායම් | 2 | | 6,467,415 | 6,350,874 |
| ආයෝජන හා වෙනත් ආදායම් | 3 | | 1,343,399,914 | 1,143,209,930 |
| **වෙනත් ආදායම්** | | | **1,349,867,329** | **1,149,560,805** |
| | | | | |
| දළ ප්‍රතිලාභ හා හටගත් හිමිකම් | 4 | | (9,763,499,280) | (11,455,239,706) |
| ප්‍රතිරක්ෂකයින් වෙත ලබාදුන් හිමිකම් | 4 | | | |
| ගිවිසුම්ගත වගකීම්හි දළ වෙනස | 4 | | 1,554,911,720 | 2,077,748,294 |
| ප්‍රතිරක්ෂකයින් වෙත ලබා දුන් ගිවිසුම්ගත වගකීම්හි දළ | 4 | | (1,016,766,143) | (239,679,294) |
| IBNRහි දළ වෙනස | 4 | | (465,294,517) | (283,528,663) |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | | | **(9,690,648,221)** | **(9,900,699,368)** |
| | | | | |
| ප්‍රාරක්ෂණය හා අත්පත්කරගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂ‹ | 5 | | (1,608,994,211) | (1,440,826,507) |
| | | | | |
| වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | 6 | | (414,816,836) | (344,678,298) |
| | | | | |
| **මුළු ප්‍රතිලාභ, හිමිකම් හා වෙනත් වියදම්** | | | **(11,714,459,268)** | **(11,686,204,174)** |
| **බදුවලට පෙර (ලාභය)/පාඩුව** | | | **3,288,839,528** | **1,077,185,612** |
| ආදායම් බදු වියදම | | | (105,600,662) | (100,951,677) |
| **වර්ෂය සඳහා ලාභය/(පාඩුව)** | | | **3,183,238,866** | **976,233,935** |
| | | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| | | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි ශුද්ධ වෙනස | | | 131,176,710 | 208,755,171 |
| 9විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක ලාභය/(පාඩුව) | | | (9,075,505) | (8,699,331) |
| දේපල, පිරියත හා උපකරණ මත නැවත තක්සේරු කිරීමේ හිභය | | | (2,102,126) | - |
| **ශුද්ධ බදුවලින් වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| | | | | |
| **මුළු විස්තීර්ණ ආදායම්** | | - | **3,303,237,946** | **1,176,289,775** |

# මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 7 | 2,806,809 | 1,377,708 |
| දේපල, පිරියත හා උපකරණ | 8 | 29,362,528 | 39,470,985 |
| මූල්‍ය වත්කම් | 9 | 10,674,617,497 | 8,161,427,792 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 10.1 | 1,468,768,756 | 4,574,100,921 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 10.2 | 1,548,824,733 | 2,109,164,970 |
| මෘදු ණය | 11 | 5,725,010 | 14,069,897 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 12 | 98,479,866 | 1,922,337,050 |
| කල් තබන ලද කොමිස් ගාස්තු | 13 | 620,751,687 | 597,083,610 |
| බැංකුවේ හා අතේ ඇති මුදල් | 14 | 1,145,855,712 | 1,133,642,497 |
| **මුළු වත්කම්** | | **15,595,192,598** | **18,552,675,429** |
| **ස්කන්ධ හා වගකීම්** | | | |
| රඳවාගත් ඉපැයීම් | | 7,424,644,966 | 7,213,150,131 |
| වෙනත් ස්කන්ධ අංග | | (466,454,792) | (66,791,641) |
| නැවත තක්සේරුකිරීමේ සංචිතය | | (2,102,126) | - |
| **මුළු ස්කන්ධ ප්‍රමාණය** | | **6,956,088,047** | **7,146,358,490** |
| **වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 17 | 7,531,205,639 | 8,879,856,741 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 18 | 28,510,041 | 29,660,364 |
| වෙනත් වගකීම් | 15 | 1,075,776,134 | 2,496,799,835 |
| බැංකු අයිරාව | 14 | 3,612,734 | - |
| **මුළු වගකීම්** | | **8,639,104,548** | **11,406,316,939** |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | **15,595,192,598** | **18,552,675,429** |

අරමුදලේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා හා අනුගත වන බව සහතික කරමි.

ජේ. ඒ. ඩී. සිරිවර්ධන
ප්‍රධාන මූල්‍ය නිලධාරි
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

සනත් සී ද සිල්වා
ප්‍රධාන විධායක නිලධාරි

පිටු අංක 5 සිට 42 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් අංගයක් වේ. මූල්‍ය ප්‍රකාශ සකස් කර, ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත.

මංජුල ද සිල්වා
සභාපති

අධ්‍යක්ෂ

2019 පෙබරවාරි 27
කොළඹ

# ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට

| | රඳවාගත් ඉපැයුම් රු. | විකිණීමට ඇති මූල්‍ය වත්කම් රු. | පාලනය කළ නොහැකි පොලී රු. | මුළු ස්කන්ධ ප්‍රමාණය රු. |
|---|---|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,744,382,870 | (88,871,109) | | 8,655,511,761 |
| වර්ෂය සඳහා ලාභය | 2,839,751,855 | | | 2,839,751,855 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි ශුද්ධ වෙනස | | (182,717,265) | | (182,717,265) |
| පාරිතෝෂිත තක්සේරු කිරීම මත ආයුගණක ලාභය | | 4,740,893 | | 4,740,893 |
| ප්‍රතිරක්ෂණ ඉන්වොයිසි අවලංගු කිරීම | (34,714,833) | | | (34,714,833) |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | (3,200,000,000) | | | (3,200,000,000) |
| 2012/13 ගෙවිය යුතු ආදායම් බදු | (578,674,926) | | | (578,674,926) |
| බැඳුම්කර මත ක්‍රමක්ෂය කරන ලද වට්ටම් | 47,663,316 | | | 47,663,316 |
| ක්ෂය කිරීම් ගැලපුම් | 2,614,431 | | | 2,614,431 |
| රක්ෂණ වාරික නැවත ගෙවීම සඳහා ගැලපුම් | 7,306,615 | | | 7,306,615 |
| SLIPS නැවත ලැබීම් මෝටර් රථ නොවන | 22,500 | | | 22,500 |
| මෝටර් රථ රක්ෂණ වාරික | (75,000) | | | (75,000) |
| බැහැර කළ ගෙවන ලද තැන්පතු | (392,000) | | | (392,000) |
| ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික ගැලපුම් | 3,869,230 | | | 3,869,230 |
| කුලී වියදම් | (48,450) | | | (48,450) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,831,705,609 | (266,847,481) | | 7,564,858,128 |
| වර්ෂය සඳහා ලාභය | 976,233,935 | | | 976,233,935 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි ශුද්ධ වෙනස | | 208,755,171 | | 208,755,171 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | (1,500,000,000) | | | (1,500,000,000) |
| වසර අවසානයේ අවසන් කිරීමේ වෙනස | (44,253,311) | | | (44,253,311) |
| 2016/2017 ගෙවිය යුතු ආදායම් බදු | (97,669,225) | | | (97,669,225) |
| බැඳුම්කර මත ක්‍රමක්ෂය කරන ලද වට්ටම් | 26,235,147 | | | 26,235,147 |
| AAIB වගා නැවත ගෙවීම | 42,871,673 | | | 42,871,673 |
| 2016 දිරිදීමනා | (3,140,650) | | | (3,140,650) |
| ප්‍රතිරක්ෂණ වාරික සාමාන්‍ය | (2,921,713) | | | (2,921,713) |
| ආරම්භක ලැබිය යුතු පාලන ගිණුම- ප්‍රතිරක්ෂණ | (38,856,406) | | | (38,856,406) |
| ආරම්භක ලැබිය යුතු පාලන ගිණුම -මෝටර් රථ නොවන | 83,109,718 | | | 83,109,718 |
| චෙක්පත් නැවත ලැබීම් | (324,575) | | | (324,575) |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3% | 305,147 | | | 305,147 |
| යතුරුපැදි අත්තිකාරම් හා ලැබිය යුතු මෝටර් රථ | (57,582,588) | | | (57,582,588) |
| ඊඑස්සී | (2,068,743) | | | (2,068,743) |
| පෙර වසරේ වෙනත් ගැලපුම් | (493,887) | | | (493,887) |
| පාරිතෝෂිත තක්සේරු කිරීම මත ආයුගණක (ලාභය)/පාඩුව | | (8,699,331) | | (8,699,331) |
| | **7,213,150,131** | **(66,791,641)** | **-** | **7,146,358,490** |
| වර්ෂය සඳහා ලාභය | 3,183,238,866 | | | 3,183,238,866 |
| | | | | - |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි ශුද්ධ වෙනස | | (390,587,646) | | (390,587,646) |
| ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද මුදල් | (2,750,000,000) | | | (2,750,000,000) |
| වත්කම් නැවත තක්සේරු කිරීම | | | (2,102,126) | (2,102,126) |
| බැහැර කරන ලද මෝටර් රථ නැවත තක්සේරු කිරීම | 6,276,415 | | | 6,276,415 |
| බැඳුම්කර මත ක්‍රමක්ෂය කරන ලද වට්ටම් | 25,070,657 | | | 25,070,657 |
| ප්‍රතිස්ථාපන හා ගැලපුම් ගාස්තු ජාතික ස්වාභාවික විපත් රක්ෂනාවරණය | (291,472,452) | | | (291,472,452) |
| ලැබිය යුතු රෙට්‍රො ප්‍රතිරක්ෂන හුවමාරු පාඩුව | (3,888,779) | | | (3,888,779) |
| නිරවුල් කරන ලද ඉන්වොයිසි සහ බැර පත් අවලංගු කිරීම | 41,810,528 | | | 41,810,528 |
| ප්‍රතිරක්ෂණ ආරම්භක ශේෂයේ අත්හැරුණු ඉන්වොයිසි | 10,980,047 | | | 10,980,047 |
| ජාතික ස්වාභාවික විපත් රක්ෂනාවරණය අවලංගු චෙක්පත් | 12,682,341 | | | 12,682,341 |
| චෙක්පත් අවලංගු කිරීම | 2,080,928 | | | 2,080,928 |
| බැඳුම්කර කූපන් පොලිය | (8,856,250) | | | (8,856,250) |
| වැටුප් නිවැරදි කිරීම | (1,037,300) | | | (1,037,300) |
| නිවාඩු සඳහා ගෙවීම් | (2,764,983) | | | (2,764,983) |
| ද්විත්ව බැර පත් අවලංගු කිරීම ප්‍රතිරක්ෂණ | (7,458,551) | | | (7,458,551) |
| යුරෝ එක්සත් ජනපද ඩොලර් හුවමාරු ලාභ සංචිතය | (5,082,679) | | | (5,082,679) |
| පෙර වසරේ වෙනත් ගැලපුම් | (83,955) | | | (83,955) |
| පාරිතෝෂිත තක්සේරු කිරීම මත ආයුගණක (ලාභය)/පාඩුව | | (9,075,505) | | (9,075,505) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,424,644,965 | (466,454,792) | (2,102,126) | 6,956,088,048 |

පිටු අංක 5 සිට 33 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් අංගයක් වේ.
වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

| | | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| බදුවලට පෙර ලාභය | | 3,288,839,528 | 1,077,185,612 |
| **ගැලපුම්:** | | | |
| පොලී ආදායම් | | (1,168,986,729) | (1,138,264,819) |
| ක්ෂය කිරීම් | | 12,452,639 | 7,316,750 |
| ක්‍රමක්ෂය කිරීම් | | 273,100 | |
| ශුද්ධ සාධාරණ වටිනාකම් වෙනස්වීම් | | (399,663,151) | 200,055,840 |
| පෙර වසරේ ගැලපුම් | | (228,020,447) | (94,789,413) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම මත පාඩුව/(ලාභය) | | (2,352,313) | (4,945,111) |
| | | **1,502,542,627** | **46,558,859** |
| මෙහෙයුම් වත්කම්හි වෙනස | අ | 5,465,861,509 | (1,690,242,910) |
| මෙහෙයුම් වගකීමෙහි වෙනස | ආ | (2,876,425,787) | (370,495,553) |
| මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | 4,091,978,349 | (2,014,179,604) |
| ගෙවන ලද පාරිතෝෂිත | | - | - |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් | | 4,091,978,349 | (2,014,179,604) |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ශුද්ධ මූල්‍ය වත්කම් බැහැර කිරීම/(අත්පත්කරගැනීම) | | (2,513,189,705) | 3,026,416,582 |
| ලද පොලී | | 1,168,986,729 | 1,138,264,819 |
| මෘදු ණය නැවත අයකරගැනීම | | 8,344,887 | 53,011,374 |
| දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම | | 9,018,980 | 6,029,880 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත්කරගැනීම | | (1,702,201) | (1,377,708) |
| දේපල, පිරියත හා උපකරණ අත්පත්කරගැනීම | | (4,836,560) | (4,813,960) |
| ආයෝජන කටයුතුවලින් ලද භාවිත කළ ශුද්ධ මුදල් | | (1,333,377,870) | 4,217,530,986 |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | | (2,750,000,000) | (1,500,000,000) |
| මූල්‍ය කටයුතු සඳහා භාවිත කළ ශුද්ධ මුදල් | | (2,750,000,000) | (1,500,000,000) |
| **මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | ඇ | 8,600,480 | 703,351,381 |
| වර්ෂය මුල ශුද්ධ මුදල් හා මුදල් සමාන දෑ | | 1,133,642,497 | 430,291,116 |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | | 1,142,242,978 | 1,133,642,497 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්**

| | 2018 | 2017 |
|---|---|---|
| **අ. මෙහෙයුම් වත්කම්හි වෙනස** | | |
| කල්තබන ලද කොමිස් ගාස්තුවල (වැඩිවීම)/අඩුවීම | (23,668,078) | (114,174,700) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකවල (වැඩිවීම)/අඩුවීම | 3,105,332,165 | 954,701,929 |
| ලැබිය යුතු රක්ෂණ වාරිකවල (වැඩිවීම)/අඩුවීම | 560,340,237 | (768,324,524) |
| වෙනත් මූල්‍ය නොවන වත්කම්හි (වැඩිවීම)/අඩුවීම | 1,823,857,184 | (1,762,445,615) |
| | 5,465,861,509 | (1,690,242,910) |
| **ආ. මෙහෙයුම් වගකීම්හි වෙනස** | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම්හි වැඩිවීම/(අඩුවීම) | (1,348,651,101) | (915,379,769) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්හි වැඩිවීම/(අඩුවීම) | (1,150,323) | 14,569,494 |
| වෙනත් වගකීම්හි වැඩිවීම/(අඩුවීම) | (1,526,624,363) | 530,314,722 |
| | (2,876,425,787) | (370,495,553) |
| **ඇ. මුදල් හා මුදල් සමානයන්හි වැඩිවීම/(අඩුවීම)** | | |
| වර්ෂාවසානයේ ශුද්ධ මුදල් හා මුදල් සමාන දෑ | 1,142,242,978 | 1,133,642,497 |
| අඩු කළා: වර්ෂය ආරම්භයේ ශුද්ධ මුදල් හා මුදල් සමාන දෑ | 1,133,642,497 | 430,291,116 |
| මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 8,600,481 | 703,351,381 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

1.ආයතනික තොරතුරු

**1.1 වාර්තා කරනු ලබන ආයතනය**

2007 අංක 28 දරන සංශෝධන පනතින් සංශෝධිත ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය (මණ්ඩලය) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාව තුල ස්ථාපිත කර ඇත. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ අංක 97, මරදාන පාර, කොළඹ 10 හි වන අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම ලිපිනයෙහිම පිහිටා ඇත.

**1.2 මව් සමාගම සහ පරම මව් සමාගම**

අධ්‍යක්ෂ මණ්ඩලයේ මව් සමාගම සහ පරම මව් සමාගම වන්නේ ශ්‍රී ලංකා රජයයි.

**1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් කටයුතුවල ස්වභාවය**

මෙම මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වනුයේ සාමාන්‍ය රක්ෂණ කටයුතු හා ප්‍රතිරක්ෂණ කටයුතු ඉටු කිරීමය.

මණ්ඩලය විසින් වැඩිදුරටත් SRCC & T අරමුදල පවත්වාගෙන යයි. මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවලින්, මූල්‍ය සමාගම්වලින් හා රක්ෂණ සමාගම්වලින් බදුවලින් පසු 1%ක වගා බද්දක් එකතු කරනු ලබන අතර, එම වගා බදු ක්‍රමය හරහා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රම ලබා දෙයි. සමාලෝචනයට යටත් වසරේ මණ්ඩලයේ මූලික කටයුතුවල ස්වභාවයෙහි කිසිදු සුවිශේෂි වෙනසක් සිදුව නොමැත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර, ඉදිරිපත් කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

**1.5 සේවකයින් සංඛ්‍යාව**

2018දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 238කින් සමන්විත විය (2017 – 211).

**1.6 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම**

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ 2019 පෙබරවාරි 27 දිනැති යෝජනාවට අනුව එදිනම නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

2. **පිළියෙල කිරීමේ පදනම සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය**

විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් සකස් කර ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසිවල සඳහන් අවශ්‍යතාවන්ට අනුගත වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.
මූල්‍ය ප්‍රකාශනවලට පහත සඳහන් අයිතමයන් ඇතුලත් වේ:

- වසර අවසානයේදී මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පැහැදිලි කෙරෙන තොරතුරු ඇතුලත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 02).
- සමාලෝචනයට යටත් වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය පැහැදිලි කෙරෙන තොරතුරු ඇතුලත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 01).
- ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් නිරූපණය වන පරිදි ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 03).
- මණ්ඩලයට මුදල් හා මුදල් හා සමාන වත්කම් උත්පාදනය කිරීමටත්, එවැනි මූල්‍ය ප්‍රවාහ උපයෝජනයටත් මණ්ඩලය සතු හැකියාව පිළිබඳ තොරතුරු පරිශීලකයින් වෙත ලබාදෙනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයක් (පිටු අංක 4) සහ
- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් තොරතුරු පැහැදිලි කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් (පිටු අංක 05 සිට 42 දක්වා).

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**2.2 ගණනය කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පහත අයිතමයන් සඳහා හැර, මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

| අයිතමය | ගණනය කිරීමේ පදනම | සටහන් අංක |
|---|---|---|
| ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම් | සාධාරණ වටිනාකම | 9.1 |
| අලෙවිය සඳහා පවතින මූල්‍ය වත්කම් | සාධාරණ වටිනාකම | 9.2 |
| අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් | අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම්හි වර්තමාන වටිනාකමට ආයුගණක ලෙද අගය කර හඳුනාගන්නා ලදී | 18 |
| රක්ෂනාවරණ හිමියන්ගේ වගකීම් | IRCSL මගින් නිකුත් කරන ලද ආයුගණක මාර්ගෝපදේශ මත පදනම් වූ ආයුගණක ලෙස නිර්ණය කරන ලද අගයන් | 17.1 |
| හටගත්, එහෙත් වාර්තා නොකළ/හට ගත් එහෙත් ප්‍රමාණවත් ලෙස වාර්තා නොකළ | ආයුගණක ක්‍රමවේද මත පදනම් වූ ආයුගණක ලෙස නිර්ණය කරන ලද අගයන් | 17.3 |

**2.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

මණ්ඩලය සිය සාපේක්ෂ ද්‍රවශීලතාව පිළිබිඹු වන ආකාරයෙන් පුළුල් ලෙස සිය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම් වන උද්ධමන සාධකවල කිසිදු ගැලපුමක් සිදු කර නැත.

මූල්‍ය වත්කම් සහ වගකීම් හිලවු කිරීම් වන අතර, හඳුනාගත් වටිනාකම් හිලවු කිරීම නෛතික ලෙස බලගැන්වීමට අයිතිය පවතින අවස්ථාවකදී හා ශුද්ධ පදනමක් මත නිරවුල් කරගැනීමට හෝ වත්කම් අත්පත්කරගෙන, එම අවස්ථාවේදීම වගකීම නිරවුල් කිරීමට හෝ චේතනාවක් පවතින විටදී පමණක් ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ.

**2.4 ව්‍යවහාර මුදල් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක**

මෙම මූල්‍ය ප්‍රකාශන, මණ්ඩලයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ. සියලුම මූල්‍ය තොරතුරු විශේෂ ලෙස දක්වා ඇත්නම් හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්න රුපියලට ගණනය කර ඉදිලරිපත් කර ඇත.

**2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය**

එක් එක් සමාන අයිතමයන්හි ප්‍රමාණාත්මක භාවය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අවස්ථාවලදී හැර, අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරිත්වයෙන් යුතු අයිතමයන් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

**2.6 වාර්තාගත කරනු ලබන කාලය**

වාර්තාගත කරනු ලබන කාලය 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වේ.
අවශ්‍ය අවස්ථාවලදී අවස්ථානෝචිත පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඉදිරි සටහන්වල විස්තර කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 2.7 වැදගත් ගිණුම්කරණ විනිශ්වයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය මගින් විනිශ්වයන්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් කළ යුතු වන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදාගැනීම හා වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වටිනාකම් හඳුනාගැනීමටද බලපෑමක් ඇති කරයි. සත්‍ය තත්ත්වයන් මෙම ඇස්තමේන්තුගත වටිනාකම් සමඟ වෙනස් වීමටද හැකියාව ඇත.

ගිණුම්කරණ විනිශ්වයන්, ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු නැවත සලකා බලන කාලසීමාවකදී හා බලපෑමට ලක් විය හැකි යම් අනාගත කාලසීමාවකදී සිදු කරනු ලබන ගිණුම්කරණ ඇස්තමේන්තු හඳුනාගනේ.

මූලික වැදගත් ගිණුම්කරණ විනිශ්වයන්, ඇස්තමේන්තු හා අවිනිශ්චිතභාවය සහිත උපකල්පන පහතින් සාකච්ඡා කෙරෙන අතර, එවැනි වත්කම් හා වගකීම්වලට අදාල වටිනාකම් අදාල සටහන්හි පරිදි වේ:

### 2.7.1 අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයට අඛණ්ඩ පැවැත්මකින් යුතුව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර, නුදුරු අනාගතයක් දක්වා ව්‍යාපාරික කටයුතු සිදුකරගෙනයාම සඳහා මණ්ඩලය සතුව සම්පත් පවතින බවට සෑහීමකට පත්ව සිටියි. එමෙන්ම, අඛණ්ඩ පැවැත්මකින් යුතුව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට මණ්ඩලය සතු හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පිළිබඳව මණ්ඩලයට දැනගැනීමට ලැබී නැත. එහෙයින්, අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සිදු කෙරේ.

### 2.7.1 මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම

කිසිදු සාධාරණ වෙළඳපොල මිලක් නොපවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලබන මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් ගණිතමය විධික්‍රම ඇතුලු විවිධ තක්සේරුකරණ විධික්‍රම ගණනාවක් භාවිත කරමින් නිර්ණය කරනු ලබයි. හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපොල දත්ත මගින් මෙම ආකෘති සඳහා යෙදවුම් ජනනය වන නමුත්, එසේ නොහැකි විටදී, එම සාධාරණ අගයන් ස්ථාපිත කිරීම සඳහා විනිශ්වය කිරීම අත්‍යවශ්‍ය වේ.

### 2.7.2 හානිකරණය පිළිබඳ තක්සේරු කිරීම

සෑම වාර්තා කරනු ලබන දිනකටම හෝ වඩාත් සුලබ වශයෙන් මණ්ඩලය මගින් කිසියම් වත්කමකට හෝ මුදල් උත්පාදන ඒකකයක හානිකරණයට බලපාන සාධක, සිදුවීම් හෝ අවස්ථා වෙනසකදී එසේ සිදු කිරීම අවශ්‍ය වන්නේ නම්, මණ්ඩලය විසින් අගය කරනු ලබයි. මෙමගින් එවැනි වෙන් වෙන් වූ වත්කම් හෝ මුදල් උත්පාදන ඒකකයක 'වර්තමාන වටිනාකම' අගය කිරීම අපේක්ෂා කෙරේ. වත්කමකින් හෝ මුදල් උත්පාදන ඒකකයෙන් හටගන්නා අනාගත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ පිළිබඳ ඇස්තමේන්තු කිරීමට සහ අදාල මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම ගණනය කිරීම පිණිස සුදුසු වට්ටම් අනුපාතයක් තෝරාගැනීමටද කළමනාකාරිත්වයට වර්තමාන වටිනාකම අගය කිරීම අත්‍යවශ්‍ය වේ. අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ මෙන්ම වට්ටම් අනුපාතයන්ද පිළිබඳව ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මණ්ඩලයට මෙම අගය කිරීම අත්‍යවශ්‍ය වන හෙයින්, ඒවා අවිනිශ්චිතතාවට ලක් වේ.

### 2.7.3 වගකීම් සහ අවිනිශ්චිතතාවන් සඳහා විධිවිධාන

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුල මණ්ඩලයට එරෙහි නීතිමය හිමිකම් ඊට ඉදිරිපත් කෙරේ. ප්‍රතිපාදන ලබාදීමේදී යම් හිමිකමක් සාර්ථක වීමේ ප්‍රවණතාව පිළිබඳව කළමනාකරණය විසින් නිගමනය කර ඇත. නීතිමය හිමිකම් ඉල්ලීමක් අවසන් කිරීමේ කාලය, ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය සේම අවිනිශ්චිතය. කාලය හා පිරිවැය අවසන් වශයෙන් අදාල නීතිමය බලප්‍රදේශයන් සම්බන්ධයෙන් පවතින විධිමත් ක්‍රියාවලිය මත රඳා පවතී.

සමාලෝචනයට යටත් වර්ෂය තුල නඩුකර සඳහා ප්‍රතිපාදන ලෙස මුළු නෛතික හිමිකම්වලින් 15%ක් ලබා දීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**2.8** සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

**2.8.1** විදේශ විනිමය පරිවර්තනය කිරීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ, මණ්ඩලයේ ක්‍රියාකාරී විනිමය ඒකකය ද වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. විදේශ විනිමයවලින් ඇති ගණුදෙණු, එම ගණුදෙණුව දිනයේදී පවතින ක්‍රියාකාරී විනිමය අනුපාතයට මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ.

**විදේශ විනිමය ඒකකවලින් ව්‍යවහාර වන මුදල්මය වත්කම් හා වගකීම්, වාර්තාගත කිරීමේ දිනයේදී බලපවත්වන ක්‍රියාකාරී විදේශ විනිමය අනුපාතයට නැවත පරිවර්තනය කෙරේ. සියලුම වෙනස්වීම් ලාභාලාභ ප්‍රකාශය තුල ඇතුලත් කෙරේ.**

**2.8.2** මූල්‍ය නොවන වත්කම් හානිකරණය

**යම් වත්කමක් හානිකරණය විය හැකි බවට හැඟවෙන යම් පෙන්නුම් කිරීමක් ඇත්දැයි මණ්ඩලය විසින් සෑම වාර්තාගත කිරීමේ දිනයකදීම තක්සේරු කරනු ලබයි. එවැනි යම් පෙන්නුම් කිරීමක් ඇත්නම් හෝ යම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍ය අවස්ථාවකදී, මණ්ඩලය විසින් එම වත්කමේ නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක නැවත අයකරගත හැකි වටිනාකම වන්නේ, යම් වත්කමක හෝ මුදල් ජනන ඒකකයක අලෙවි පිරිවැය හා එහි භාවිතයේ වටිනාකම අඩු කර එහි සාධාරණ අගයේ ඉහළ වටිනාකමය. යම් වත්කමක්, වෙනත් වත්කම්වලින් හෝ වත්කම්  සඳහා නැවත අයකරගැනීමේ වටිනාකම නිර්ණය කෙරේ. යම් වත්කමක ඉදිරියට ගෙනයාමේ වටිනාකම හෝCGU** අගය එහි නැවත අයකරගතහැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කම හානිකරණය වී ඇති සේ සැලකෙන අතර, එහි නැවත අයකරගැනිමේ වටිනාකම සේ ලියා තබනු ලැබේ. භාවිතයේ ඇති වටිනාකම අගය කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ, මුදලේ වත්මන් වටිනාකමෙහි වෙළඳපොල ඇගයීම හා එම වත්කමට අනන්‍ය වූ අවදානම් පිලිඹිබු කෙරෙන පෙර බදු වට්ටම් අනුපාතයක් භාවිත කරමින් එහි වර්තමාන අගය දක්වා වට්ටම් ලබා දෙයි. පිරිවැයට අඩු සාධාරණ අගය නිර්ණය කිරීමේදී, **මෑතකාලීන වෙළඳ ගණුදෙණු ඇත්නම්, එම ගණුදෙණු සැලකිල්ලට ගැනේ. එවැනි කිසිදු ගණුදෙණුවක් හඳුනාගත නොහැකි නම්, යෝග්‍ය අගය කිරීමේ ආකෘතියක් භාවිත කෙරේ.**

දැනට සිදු කෙරෙන මෙහෙයුම්හි හානිකරණය වූ වත්කම්හි ක්‍රියාකාරිත්වය සමඟ අනුරූප වියදම් කාණ්ඩයන් සඳහන් වන ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනියි.

**2.8.3** මූල්‍ය වත්කම් හානිකරණය කිරීම

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වී ඇත්දැයි මණ්ඩලය විසින් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී අගයනු ලබයි. එක් එක් වාර්තා කිරීමේ දිනයේදී, ලාභාලාභ මගින් සාධාරණ අගයකට ඉදිරියට ගෙන නොගිය යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වී ඇති බවට වාස්තවික සාක්ෂියක් ඇත්දැයි මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලබයි.

යම් වත්කමක් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් අනතුරුව එක් සිදුවීමක් හෝ ඊට වැඩි සිදුවීම් සංඛ්‍යාවක් හේතුවෙන් හානිකරණය සිදුව ඇති බවට හා සෛද්ධාන්තික ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත පාඩුදායක සිදුවීමක් (හෝ සිදුවීම්) බලපෑමක් කර ඇති බවට වාස්තවික සාක්ෂියක් ඇත්නම් පමණක් යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය කළ සේ සැලකිය යුතුය.

- ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙන යන ලද මූල්‍ය වත්කම් හානිකරණය කිරීම

ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙන යන ලද වත්කම් මත හානිකරණ පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, එම හානිකරණය පාඩුවේ අගය ගණනය කෙරෙනුයේ, එම වත්කමේ ඉදිරියට ගෙන යන ලද අගය සහ එම මූල්‍ය වත්කමේ ක්‍රියාත්මක මුල් පොලී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගයේ වෙනස ලෙසය. (තවමත් හටගෙන නොමැති, අනාගතයේ අපේක්ෂිත ණය පාඩු හැර). වත්කමේ ඉදිරියට ගෙන යන  අගය අඩු කර, පාඩුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුලත් කෙරේ.

හානිකරණය පිළිබඳ වාස්තවික සාක්ෂි තනි තනි වශයෙන් වැදගත් වන ලෙස මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තනිව පවතීද සහ තනි තනි වශයෙන් වැදගත් නොවන ලෙස මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තනිව හෝ සාමූහික වශයෙන් පවතීද යන්න පිළිබඳව මණ්ඩලය පළමුවෙන් ඇගයීමක් සිදු කරයි. තනිව අගයන ලද යම් මූල්‍ය වත්කමක් හානිකරණය පිළිබඳ වැදගත් වන හෝ නොවන කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට තීරණය කරන්නේ නම්, එම වත්කම සමාන ණය ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල ඇතුලත් කර, එම මූල්‍ය වත්කම් කාණ්ඩය හානිකරණය සඳහා සාමූහිකව අගයනු ලැබේ. හානිකරණය වීම සම්බන්ධයෙන් තනි තනිව අගයනු ලබන හා හානිකරණ පාඩුවක් සහිත හෝ එසේ පවතින සේ හඳුනාගන්නා වත්කම් සාමූහික හානිකරණ ඇගයීමක් තුල ඇතුලත් නොකෙරේ. එම හානිකරණ ඇගයීම එක් එක් වාර්තා කිරීමේ දිනයේදී සිදු කෙරේ.
පසුකාලීනව, හානිකරණ පාඩුවේ අගය අඩු වී, හානිකරණය වීම හඳුනාගැනීමෙන් පසු සිදු වන යම් සිදුවීමක් සමඟ එම අඩුවීම වාස්තවික ලෙස අදාල කරගත හැකි වන්නේ නම්, පෙරදී හඳනාගත හානිකරණය පාඩුව ආපසු හැරවිය හැකිය. එවැනි පසුකාලීන ඕනෑම හානිකර පාඩුවක් ආපසු හැරවීමක්, එම ආපසු හැරවීමේ දිනයේදී ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට වඩා එම වත්කමේ ඉදිරියට ගෙන යන අගය ඉක්මවා නොයන මට්ටම දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

- **විකිණීමට ඇති මූල්‍ය ආයෝජන හානිකරණය වීම**

විකිණීමට ඇති මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්නම්, එහි පිරිවැය (යම් මූලික නැවත ගෙවීමක් හා ක්‍රමක්ෂය කිරීමක් අතර ශුද්ධ වෙනස) හා වෙනත් විස්තීර්ණ ආදායම්හි පෙරදී හඳුනාගත් යම් හානිකරණය පාඩුවක් අඩු කර එහි වත්මන් සාධාරණ අගය අතර වෙනස ස්කන්ධවලින් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය වෙත මාරු කෙරේ. විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කරන ලද ස්කන්ධ උපකරණවලට අදාල නැවත හැරවීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා නොගැනේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කර ඇති ණය උපකරණවල හානිකරණය පාඩු නැවත හැරවීම්, එම උපකරණවල සාධාරණ අගයේ වැඩිවීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හානිකරණය පාඩු හඳුනාගැනීමෙන් පසු ඇති වන යම් සිදුවීමකට වාස්තවික ලෙස අදාල කරගත හැකි නම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් නැවත හැරවිය හැකිය.

- **පිරිවැය මගින් ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් හානිකරණය කිරීම**

දක්වා නොමැති ස්කන්ධ උපකරණයක ඊට සම්බන්ධ ව්‍යුත්පන්න වත්කමකසාධාරණ වටිනාකම නියම ලෙස ගණනය කළ නොහැකි වීමහේතුවෙන් හානිකරණ පාඩුවක් සිදු ව ඇතැයි වාස්තවික සාක්ෂි ඇත්නම් හා එවැනි නියම ලෙස ගණනය නොකළ ස්කන්ධ උපකරණයක් නැවත ලබාදීම මගින් නිරවුල් කළ යුතු නම්, හානිකරණ පාඩුවේ වටිනාකම ගණනය කෙරෙනුයේ මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම සහ ඒ හා සමාන මූල්‍ය වත්කමක් නැවතලබාදීමේදී හිමිවන වර්තමාන වෙළඳපොල අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය.

### 2.8.4 ප්‍රතිපාදන හා අවිනිශ්චිතතා

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය සතුව දැනට වගකීමක් (නෛතික හා ව්‍යුහාත්මක) පවතී නම්, සාමාන්‍ය ප්‍රතිපාදන හඳුනාගැනෙන අතර, එම වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභවලින් සමන්විත සම්පත් ධාරාවක් අවශ්‍ය විය හැකි අතර, එම වගකීම්වල වටිනාකම මත සාධාරණ ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වේ. මණ්ඩලය යම් ප්‍රතිපාදනයක කොටස හෝ සියලුම ප්‍රතිපාදන ප්‍රතිපූර්ණය කරගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණයකරගැනීම දෘශ්‍යමානව නිශ්චිත වන්නේ නම් පමණක්, වෙන් වූ වත්කමක් ලෙස හඳුනාගැනේ. යම් ප්‍රතිපාදනයකට අදාල වියදමක්, යම් ප්‍රතිපූර්ණයකරගැනීමක ශුද්ධ අගයක් ලෙස ලාභාලාභ ප්‍රකාශය තුල ඉදිරිපත් කෙරේ.

මුදලේ කාලීන වටිනාකමේ බලපෑම වැදගත් වන්නේ නම්, අවශ්‍ය වන පරිදි, එම වගකීමට අනන්‍ය වූ අවදානම් පිළිඹිබු කෙරෙන වර්තමාන පූර්ව බදු අනුපාතයක් භාවිත කරමින් ප්‍රතිපාදන සඳහා වට්ටම් ලබා දේ. වට්ටම් ලබාදීම උපයෝගිකරගන්නේ නම්, කාලසීමාව හේතුවෙන් ප්‍රතිපාදනවල ඉහළ යාම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනාගැනේ.

මණ්ඩලයේ මතයට අනුව, ආයතනයට එරෙහිව දැනට පවරා ඇති නඩු මගින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වාර්තා කර ඇති මූල්‍ය ප්‍රතිඵලවලට හෝ මණ්ඩලයේ අනාගත මෙහෙයුම් කෙරෙහි සුවිසල් බලපෑමක් සිදු නොකෙරෙනු ඇත.

### 2.8.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 - මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශවලට අනුව, මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ වක්‍ර ක්‍රමවේදය භාවිත කරමින් මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ සකස් කර ඇත. ලද පොලී ආයෝජනය කරන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කෙරේ. ව්‍යවහාරයේ පවතින මුදල්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, වටිනාකමේ වැදගත් නොවන වෙනස්කම්වලට යටත් වන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු කෙටිකාලීන ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. මුදල් හා මුදල් සමාන දෑ තුල අතෙහි ඇති මුදල් සහ බැංකු ශේෂයන් ඇතුලත් වේ. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශයන් සඳහා මුදල් හා මුදල් සමානයන් ශුද්ධ බැංකු අයිරා ලෙස ඉදිරිපත් කෙරේ.

### 2.8.6 නව ප්‍රමිතීන් හා මෙතෙක් අදාල කරගෙන නොමැති අර්ථනිරූපණ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය මගින් අනාගතයේ ක්‍රියාත්මක වන දිනයක් සහිත, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාල කරගෙන නොමැති පහත සඳහන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් නිකුත් කර ඇත. මෙම ප්‍රමිතීන් දැනට මණ්ඩලය විසින් අදාල කරගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්ති මත බලපෑමක් ඇති කරනු ලබන අතර, අනාගත මූල්‍ය ප්‍රකාශ කෙරෙහිද බලපෑමක් ඇති කළ හැකිය.

• **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 -** පාරිභෝගිකයින් සමඟ ඇතිකරගත් ගිවිසුම්වලින් ජනනය වන ආදායම් - මෙවැනි ආදායම් ගිණුම්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 මගින් අදියර පහකින් යුතු ආකෘතියක් ස්ථාපිත කරයි. මෙම ප්‍රමිතිය යටතේ, පාරිභෝගිකයෙකු වෙත භාණ්ඩ හෝ සේවාවන් හුවමාරු කිරීම සඳහා හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ආයතනයක් වෙත ලබාදිය හැකි මුදලක් ලෙස ආදායම් හඳුනාගැනේ. මෙමගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 - ආදායම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක - 11 ඉදිකිරීමේ ගිවිසුම් සහ IFRIC13 - පාරිභෝගික වරප්‍රසාද වැඩසටහන් ඇතුලු දැනට ක්‍රියාත්මක ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශන ආදේශ කෙරේ.

2018 ජනවාරි 1 දිනට අතීතයට බලපාන පරිදි සකස් කළ සම්පූර්ණ අයදුම්පත්‍රයක් හෝ සංශෝධිත එවැනි අයදුම්පත්‍රයක් ලබා දීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 4 - රක්ෂණ ගිවිසුම්හි විෂය පථය තුල පවත්නා ගිවිසුම්, එම ප්‍රමිති අංක 15හි 5 (ආ) ඡේදයේ විෂය පථයට අනුව එම විෂය පථයෙන් බැහැර කෙරේ. මණ්ඩලය විසින් දැනට වෙනත් ආදායම් ගිවිසුම්හි බලපෑම පිළිබඳව තක්සේරු කරමින් සිටියි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

• **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 - කල්බදූ**මෙම ප්‍රමිති අංක 16 මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 17- කල්බදූ හා IFRIC **4 -** යම් ගිවිසුමක කල්බදූ ඇතුලත්වේද යන්න නිර්ණය කිරීම, SIC15 - මෙහෙයුම් කල්බදූ දිරිදීමනා සහ SIC27 - කල්බදූ පහසුකමක නීතිමය ආකෘතිය ඇතුලු ගණුදෙණුවල අන්තර්ගතය අගයකිරීම යනාදිය ආදේශ කෙරේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 මගින් කල්බදූ හඳුනාගැනීම, ගණනය කිරීම, ඉදිරිපත් කිරීම හා අනාවරණය කිරීම සඳහා ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 17 යටතේ මූල්‍ය කල්බදූ ගිණුම්ගත කිරීමට සමානව තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ ගිණුම්ගතකිරීමට සියලුම කල්බදූහිමියන්ගෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රමිතිය තුල කල්බදූහිමියන් සඳහා හඳුනාගැනීම් බැහැරකිරීම් දෙකක් ඇතුලත් වේ - එනම්, අඩු වටිනාකම් සහිත කල්බදූ හා කෙටිකාලීන කල්බදූ ලෙසය. යම් කල්බදූ පහසුකමක් ආරම්භ වන දිනයේදී,කල්බදූහිමියන් විසින් ගෙවීමට ඇති කල්බදූ හිමිකමක් මෙන්ම කල්බදූ කාලසීමාව තුල ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් භාවිත කිරීමට ඇති අයිතිය පෙන්නුම් කරන යම් වත්කමක් හඳුනාගනියි. එම කල්බදූ වගකීම මත පොලී වියදම මෙන්ම එම වත්කම භාවිත කිරීමේ අයිතිය මත ක්‍රමක්ෂය කිරීමේ වියදම් වෙන් වෙන්ව හඳුනාගැනීමට කල්බදූහිමියන් වෙත පැවරේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 යටතේ කල්බදූ පහසුකම් සපයන්නන් ගිණුම්ගත කිරීම එම ප්‍රමිති අංක 17 යටතේ වර්තමාන ගිණුම්කරණ ක්‍රමවලින් සැලකිය යුතු මට්ටමින් වෙනස් වී නොමැත. එම පහසුකම් සපයන්නන් විසින් ප්‍රමිති අංක 17 යටතේ එම වර්ගීකරණ ප්‍රතිපත්තියම භාවිත කරමින් සියලුම කල්බදූ වර්ග කිරීම පවත්වාගෙන යන අතර, කල්බදූ වර්ග දෙකක් අතර වෙනස්කම් පෙන්වා දෙයි: මෙහෙයුම් හා මූල්‍ය කල්බදූ ලෙසය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 මගින්ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 17 යටතේ සිදු කරන අනාවරණය කිරීම්වලට වඩා අතිශයින් ගැඹුරු අනාවරණය කිරීම් සිදු කිරීමට කල්බදූහිමියන්ට මෙන්ම කල්බදූ පහසුකම් සපයන්නන්ටද නියම කෙරේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 2019 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ. කලින් අයදුම්පත් එවීමට අවසර ලැබෙන අතර, කල්බදූහිමියන් හට අතීතයට බලපවත්වන ලෙස හෝ සංශෝධිත ප්‍රවේශය හෝ භාවිත කරමින් එම ප්‍රමිතිය අදාල කරගැනීමට තෝරාගත හැකිය. මෙම ප්‍රමිතියේ සංක්‍රාන්ති විධිවිධාන මගින් යම් යම් සහන ලබාදෙයි. විස්තරාත්මක බලපෑම් විශ්ලේෂණයක් ලැබෙනතුරු සිටීම මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16න් සිදු විය හැකි බලපෑම වාර්තාකිරීමේ දිනයට සාධාරණ ලෙස තක්සේරු කළ නොහැකි වේ.

• **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 -** ප්‍රමිති අංක 9 මූල්‍ය උපකරණ - මෙම ප්‍රමිතිය මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 - මූල්‍ය උපකරණ: හඳුනාගැනීම හා ගණනය කිරීම, 2018 ජනවාරි 1 දින හෝ ඊට පසු වාර්ෂික කාලසීමාවන් සඳහා අවසර දී ඇති පරිදි කලින් අදාලකරගැනීම මත ආදේශ කෙරේ.

2017වර්ෂයේද, මණ්ඩලය තුල ප්‍රමිති අංක 9 ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් කණ්ඩායමක් පිහිටුවන ලදී.

මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 පිළිබඳ පරීක්ෂා කිරීමේ අදියර (මූලික බලපෑම් ඇගයීමේ පරීක්ෂාව) හා ක්‍රියාත්මක කිරීමේ අදියර (විසඳුම් සංවර්ධනය කිරීම) ද සිදු කරන ලදී. එම ප්‍රමිති අංක 9 ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව මණ්ඩලය විසින් සුවිශේෂී ලෙස විශ්ලේෂණය කර, තාවකාලික ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණ ගෙන ඇත.

වර්ගීකරණ හා ගණනය කිරීමේ අංශයෙන් ලබාගන්නා වර්ගීකරණ ගණනය කිරීම, මෙම නව ප්‍රමිතිය මගින් ස්කන්ධ උපකරණ හා ව්‍යුත්පන්න හැර අන් සියලුම මූල්‍ය වත්කම්, වත්කම් හා උපකරණයන්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම පිණිස, ආයතනයේ ව්‍යාපාරිත ආකෘතියේ සංයුතිකයක් මත පදනම්ව අගය කළ යුතුය.

ව්‍යාපාරික ආකෘති ඇගයුම සිය අරමුණු ළඟාකරගැනීම පිණිස, මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් කළමනාකරණය කරනුයේ කෙසේද යන්න හොඳින්ම පිලිඹිබු කෙරෙන මට්ටමින් සිය ව්‍යාපාරික ආකෘතිය පිළිබඳව මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබයි. මණ්ඩලයේ ව්‍යාපාරික ආකෘතිය උපකරණයෙන් උපකරණයට පදනම මත අගය නොකරන නමුත්, සාමාන්‍ය කළඹ අගය මට්ටමකදී සිදු කර, පහත සඳහන් නිරීක්ෂණ සාධක මත පදනම් වේ:

• ව්‍යාපාරික ආකෘතියේ ක්‍රියාකාරිත්වය කෙසේද යන්න හා එම ආකෘතිය තුල පවතින මූල්‍ය වත්කම් අගය කර, ආයතනයේ මූලික කළමනාකාරිත්ව කාර්යමණ්ඩලය වෙත වාර්තා කරන්නේ කෙසේද යන්න
• එම ආකෘතියේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑම් කරන අවදානම් (සහ එම ආකෘතිය තුල පවතින මූල්‍ය වත්කම්) හා සුවිශේෂීව, එම අවදානම් කළමනාකාරණය කරගන්නා ආකාරය.
• අලෙවියේ අපේක්ෂිත සුලබතාව, වටිනාකම හා කාලගණනය මණ්ඩලයේ ඇගයීමෙහි වැදගත් අංගද වේ.
ව්‍යාපාරික ආකෘති ඇගයීම, 'අයහපත්ම සිදුවීම'හෝ 'පීඩනකාරී සිදුවීම'හෝ සැලකිල්ලට නොගෙන සාධාරණ ලෙස සිදු විය හැකි යැයි අපේක්ෂිත සිදුවීම් පදනම් කරගෙනය. යම් හෙයකින් මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, මණ්ඩලයේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස්ව යම් ආකාරයකින් වෙනස් ආකාරයකට මුදල් ප්‍රවාහ උපලබ්ධි වන්නේ නම්, මණ්ඩලය විසින් ව්‍යාපාරික ආකෘතිය තුල පවතින මූල්‍ය වත්කම් වර්ගීකරණය වෙනස් නොකරන නමුත්, අලුතින් හටගත් හෝ අලුතින් මිලදීගත් මූල්‍ය වත්කම් ඇගයීමේදී එවැනි තොරතුරු ඇතුලත් කරනු ලබයි.

දෙවන පරීක්ෂණය ලෙස ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂාව - වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂාව ලෙස, මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් ප්‍රධාන ගෙවීම හා පොලී ගෙවීම් (SPPI)පටිපාටිය පමණක් සපුරාලන්නේද යන්න හඳුනාගැනීමේ අරමුණින්, එම මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් අගය කිරීම සිදු කරයි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

මෙම කරුණ සඳහා පරීක්ෂාවේ 'ප්‍රධාන' යන යෙදුමෙන් මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමේ සාධාරණ වටිනාකම අර්ථනිරූපණය වන අතර, මූල්‍ය වත්කමේ ආයුකාලය මත වෙනස් විය හැකිය (නිදසුනක් ලෙස, ප්‍රධාන ගෙවීම් නැවත ගෙවීමට ඇත්නම් හෝ රක්ෂණ වාරික/වට්ටම් ක්‍රමක්ෂය කිරීමක් ඇත්නම්)

ණය පහසුකම් ලබාදීමක් තුල අතිශයින් වැදගත් අංග වනුයේ මුදලේ කාලීන වටිනාකම සහ ණය අවදානමයි. SPPI ඇගයීම සිදු කිරීම පිණිස, මණ්ඩලය විසින් විනිශ්චයන් අදාල කරගන්නා අතර, මූල්‍ය වත්කම් නම් කරනු ලබන මුදල් ඒකකය හා පොලී අනුපාතය ස්ථාපිත කරන කාලසීමාව වැනි අදාල සාධක සලකා බලයි.

මූලික ණය දීමේ පහසුකමකට අදාල නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල අවදානම් හෝ ද්‍රවශීලතා අවදානම් කෙරෙහි මූල්‍ය නොවන නිරාවරණය වීමකට එහා ගිය ගිවිසුම්ගත නිරාවරණය කිරීම්වලට ප්‍රතිවිරුද්ධව ප්‍රධාන ගෙවීම් හා හිඟ මුදලේ පොලිය ගෙවීම පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති නොකෙරේ. එවැනි අවස්ථාවන්හිදී, මූල්‍ය වත්කම් FVPL මත ගණනය කිරීම අනිවාර්ය වේ.

### 3. මෙහෙයුම් අංශ

ආයතනයක පහත සඳහන් කරුණු ඇතුලත් අංශයක් මෙහෙයුම් අංශයක් වන්නේය:
අ) ආදායම් ඉපැයිය හැකි හා වියදම් ඇති විය හැකි ව්‍යාපාර කටයුතුවල නිරත වන (එම ආයතනයේම වෙනත් අංශ සමඟ සිදු කරන ගණුදෙණුවලට අදාල අදායම් හා වියදම් ඇතුලුව)

ආ) එම අංශය වෙත වෙන් කළ යුතු සම්පත් පිළිබඳ තීරණය කිරීමට සහ එහි කාර්යසාධනය පිළිබඳව ඇගයීමට ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් පිළිබඳ තීරකයා විසින් මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳව නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන; සහ

ඇ) විවික්ත මූල්‍ය තොරතුරු ලබාගත හැකි වීම.

කළමනාකරණ කාර්යයන් සඳහා නිෂ්පාදිත සහ සේවා මත පදනම්ව මණ්ඩලය විසින් ප්‍රධාන ව්‍යාපාරය ව්‍යාපාර අංශ හතරකට සංවිධානය කර ඇති අතර, වාර්තා කළ යුතු අංශ හතරක් ඇත.

ප්‍රධාන මෙහෙයුම් තීරක විසින් සම්පත් බෙදාහැරීම හා කාර්යසාධනය ඇගයීම පිණිස, පහත සඳහන් වාර්තා කර ඇති ආංශික තොරතුරු භාවිත කෙරේ.

- සාමාන්‍ය - මෝටර් රථ රක්ෂණය
- සාමාන්‍ය - මෝටර් රථ නොවන රක්ෂණය
- අග්‍රහාර
- NNDIS
- ප්‍රතිරක්ෂණය
- SRCC හා T අරමුදල
- වගා

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

**16. ආංශික තොරතුරු**

ඉහත නිෂ්පාදිත කාණ්ඩයන්හි ප්‍රාරක්ෂණය වෙනුවෙන් දළ ලිඛිත රක්ෂණ වාරික ප්‍රතිඵල පහත සඳහන් පරිදි වේ:

| | 2018 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | මෝටර් රථ නොවන | ආපදා කළමනාකරණය | ප්‍රතිරක්ෂණය | SRCC | ක්‍රමය /පාර්ලිමේන්තු | මඟ රක්ෂණ යෝජනා ක්‍රම | මුළු |
| **රක්ෂණ වාරික** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| දළ ලිඛිත රක්ෂණ වාරික | 422,117,039 | 103,722,015 | 500,000,000 | 4,056,395,150 | 4,581,640,544 | | - | 9,663,874,748 |
| අග්‍රහාර සඳහා ලද දායකත්ව මුදල් | - | - | | - | - | 4,037,420,904 | | 4,037,420,904 |
| එකතු කළ වගා රක්ෂණ බදු | - | - | | - | - | | 2,138,167,676 | 2,138,167,676 |
| ලබා දුන් ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික | | (10,851,496) | (1,433,623,973) | (577,911,555) | (81,656,250) | | (356,494,425) | (2,460,537,699) |
| SRCC හා Tr අරමුදල වෙත ලබා දුන් | (8,726,229) | (16,713,110) | | | | | | (25,439,340) |
| **ශුද්ධ ලිඛිත රක්ෂණ වාරික** | **413,390,810** | **76,157,409** | **(933,623,973)** | **3,478,483,595** | **4,499,984,294** | **4,037,420,904** | **1,781,673,252** | **13,353,486,289** |
| UPRහි දළ වෙනස | **(30,071,427)** | **253,971,616** | **-** | **(130,552,110)** | (468,137,941) | | | **(374,789,862)** |
| UPRහි ප්‍රතිරක්ෂකයින්ගේ කොටස් වෙනස | | | **555,846,575** | **94,558,680** | | | **24,329,784** | **674,735,040** |
| නොඉපැයූ රක්ෂණ වාරික සඳහා සංචිතයේ ශුද්ධ වෙනස | (30,071,427) | 253,971,616 | 555,846,575 | (35,993,430) | (468,137,941) | - | 24,329,784 | 299,945,178 |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික (අ)** | **383,319,383** | **330,129,025** | **(377,777,397)** | **3,442,490,164** | **4,031,846,353** | **4,037,420,904** | **1,806,003,036** | **13,653,431,467** |
| ගාස්තු ආදායම් (ආ) | 6,362,815 | 104,600 | | - | - | - | - | 6,467,415 |
| **මුළු ප්‍රාරක්ෂණ ආදායම් (අ+ආ)** | **389,682,198** | **330,233,625** | **(377,777,397)** | **3,442,490,164** | **4,031,846,353** | **4,037,420,904** | **1,806,003,036** | **13,659,898,882** |
| අත්පත්කරගැනීමේ පිරිවැය | - | (804,112) | | (807,579,402) | (800,610,698) | - | - | (1,608,994,211) |
| කල්තබන ලද අත්පත්කරගැනීමේ පිරිවැයේ වෙනස | | | | | - | | | - |
| **ශුද්ධ අත්පත්කරගැනීමේ පිරිවැය (ඈ)** | **-** | **(804,112)** | | **(807,579,402)** | **(800,610,698)** | **-** | | **(1,608,994,211)** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| හටගත් දළ හිමිකම් | (227,620,873) | (513,876,501) | (514,717,438) | (1,226,287,407) | (54,995,687) | (4,085,005,020) | (1,586,084,635) | (8,208,587,561) |
| ප්‍රතිරක්ෂණ නැවත අයකරගැනීම් | - | - | (681,171,372) | (335,594,771) | - | - | - | (1,016,766,143) |
| IBNR වෙනස්වීම් | (85,714,746) | (34,513,168) | (162,533,506) | 57,379,737 | (21,072,197) | (230,202,544) | 11,361,907 | (465,294,517) |
| **ගෙවන ලද ශුද්ධ හිමිකම්** | (313,335,619) | (548,389,669) | (1,358,422,316) | (1,504,502,441) | (76,067,885) | (4,315,207,564) | (1,574,722,728) | (9,690,648,221) |
| හිඟ හිමිකම්වල ප්‍රතිරක්ෂකයින්ගේ කොටස් වෙනස | | | | | | | - | - |
| **හටගත් ශුද්ධ හිමිකම් (ඇ)** | **(313,335,619)** | **(548,389,669)** | **(1,358,422,316)** | **(1,504,502,441)** | **(76,067,885)** | **(4,315,207,564)** | **(1,574,722,728)** | **(9,690,648,221)** |
| **ප්‍රාරක්ෂණ ප්‍රතිඵල (අ+ආ+ඇ+ඈ)** | **76,346,580** | **(218,960,156)** | **(1,736,199,713)** | **1,130,408,322** | **3,155,167,770** | **(277,786,661)** | **231,280,308** | **2,360,256,450** |
| **පරිපාලන වියදම් (ඉ)** | (67,124,281) | (18,645,634) | (37,291,267) | (37,291,267) | (41,904,162) | (205,101,971) | (7,458,253) | (414,816,836) |
| | | | | | - | | | |
| **මුළු වියදම් (ඇ+ඈ+ඉ)** | (380,459,900) | (567,839,414) | (1,395,713,584) | (2,349,373,110) | (918,582,744) | (4,520,309,535) | (1,582,180,981) | (11,714,459,268) |
| | **9,222,298** | **(237,605,790)** | **(1,773,490,981)** | **1,093,117,054** | **3,113,263,608** | **(482,888,631)** | **223,822,055** | **1,945,439,614** |
| වර්ෂය සඳහා ආයෝජන හා වෙනත් ආදායම් | 8,724,966 | 1,907,024 | 904,767 | 249,363,438 | 1,073,813,679 | 3,432,899 | 5,253,142 | 1,343,399,914 |
| **බදුවලට පෙර ලාභය** | **17,947,264** | **(235,698,766)** | **(1,772,586,214)** | **1,342,480,492** | **4,187,077,287** | **(479,455,732)** | **229,075,197** | **3,288,839,529** |
| ආදායම් බදු වියදම් | | | | | | | | (105,600,662) |
| **බදුවලට පසු ලාභය** | **17,947,264** | **(235,698,766)** | **(1,772,586,214)** | **1,342,480,492** | **4,187,077,287** | **(479,455,732)** | **229,075,197** | **3,183,238,867** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**4.** ආදායම්

**5.** දළ ලිඛිත රක්ෂණ වාරික

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නිෂ්පාදිත රක්ෂණ වර්ගීකරණය හා ආයෝජන ගිවිසුම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 4 - රක්ෂණ ගිවිසුම් මගින් රක්ෂකයා විසින් එළඹෙන ගිවිසුම්, මාරු කරන රක්ෂණ අවදානම්හි මට්ටම මත පදනම්ව 'රක්ෂණ ගිවිසුම්' හෝ 'ආයෝජන ගිවිසුම්'හෝ ලෙස වර්ගීකරණය කළ යුතුය.

යම් නිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීම) මගින් රක්ෂණ හිමියන් වෙත අහිතකර බලපෑම් සිදුවන්නේ නම්, එම රක්ෂණහිමියන් වෙත වන්දි ගෙවීමට එකඟවීම මගින් මණ්ඩලය විසින් වෙනත් පාර්ශ්වයකින් (රක්ෂණහිමියන්) සුවිශේෂී රක්ෂණ අවදානමක් පිළිගෙන ඇති අවස්ථාවක රක්ෂණ ගිවිසුම් ජනනය වේ. පොදු මගපෙන්වීමක් ලෙස, එම රක්ෂිත සිදුවීම නොසිදුවූයේ නම්, ගෙවන ලද ප්‍රතිලාභ ගෙවිය යුතු ප්‍රතිලාභ සමඟ සංසන්දනය කිරීම මගින් ඒ සතුව සුවිශේෂී රක්ෂණ අවදානමක් පවතීද යන්න මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. රක්ෂණ ගිවිසුම් මගින් මූල්‍ය අවදානම්ද මාරු කළ හැකිය.

ආයෝජන ගිවිසුම් යනු සුවිශේෂී මූල්‍ය අවදානමක් මාරු කරන, නමුත් රක්ෂණ අවදානමක් මාරු නොකරන ගිවිසුම්ය. මූල්‍ය අවදානම් යනු මූල්‍ය නොවන විචල්‍යයක් සම්බන්ධයෙන් නම් එම විචල්‍යය ගිවිසුමේ පාර්ශ්වයක් වෙත අනන්‍ය නොවන විටදී හැර, නිශ්චිත ලෙස දක්වා ඇති පොලී අනුපාතයක් හෝ අනුපාතයන්හි, මූල්‍ය උපකරණ මිලගණන්හි, වෙළඳ ද්‍රව්‍ය මිලගණන්හි, විනිමය අනුපාතයන්හි, මිල හෝ අනුපාත දර්ශකයින්හි, ණය ශ්‍රේණිගතකිරීම්හි හෝ ණය දර්ශකයන්හි හෝ වෙනත් විචල්‍යයන්හි සිදුවිය හැකි අනාගත වෙනස්කමකි.

යම් ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කළ විට, මෙම කාලසීමාව තුල රක්ෂණ අවදානම අතිශයින් අඩු වුවද, සියලුම අයිතීන් හා වගකීම්ශුන්‍ය වීම හෝ කල් ඉකුත් වන තෙක්, එහි රක්ෂණ කාලසීමාව ඉතුරු කාලසීමාව සඳහාද බලපැවැත්වේ. එසේ වුවද, රක්ෂණ අවදානම සුවිශේෂී වන්නේ නම්, ආරම්භ කිරීමෙන් පසුව ආයෝජන ගිවිසුම් රක්ෂණ ගිවිසුම් ලෙස නැවත වර්ගීකරණය කළ හැකිය.

මණ්ඩලය මගින් අලෙවි කරන ලද සියලුම නිෂ්පාදිත රක්ෂණ ගිවිසුම් වන අතර, එම නිසා, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 4 - රක්ෂණ ගිවිසුම් යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ග කෙරේ. එහෙයින්, මණ්ඩලය සතුව වාර්තා කිරීමේ දිනයේදී සිය නිෂ්පාදිත කාණ්ඩය තුල කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - දළ ලිඛිත රක්ෂණ වාරික හඳුනාගැනීම - අවදානම් ප්‍රාරක්ෂණය කිරීම සඳහා මණ්ඩලය මගින් අය කරන රක්ෂණ වාරික දළ ලිඛිත රක්ෂණ වාරිකවලින් නියෝජනය කෙරේ. එම අගය උපචිත පදනමක් මත ගිණුම්ගත කෙරේ.

ජීවිත රක්ෂණ නොවන රක්ෂණයන්හි දළ ලිඛිත රක්ෂණ වාරික තුල ගිණුම්ගත කිරීමේ කාලසීමාවේදී එළැඹි ගිවිසුම් මගින් ලබා දී ඇති රක්ෂණාවරණයේ මුළු කාලසීමාව සඳහා ලද/ලැබිය යුතු මුළු රක්ෂණ වාරික ඇතුලත් වන අතර, රක්ෂණාවරණය ආරම්භ වන දිනයේ සිට බලාත්මක වේ.

හිමිකම් ඉල්ලා නොසිටීම් වැනි රක්ෂණ වාරික අනුපාත සමන්විත වන අඩු කිරීම්, දළ ලිඛිත රක්ෂණ වාරිකවලින් අඩු කෙරේ. ප්‍රධාන ව්‍යාපාරික කාණ්ඩ අනුව වර්ෂය සඳහා දළ ලිඛිත රක්ෂණ වාරික පහත සඳහන් පරිදි වේ:

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**දළ ලිඛිත රක්ෂණ වාරික**
ප්‍රධාන ව්‍යාපාර කාණ්ඩ මගින් වර්ෂය සඳහා රක්ෂණ වාරික ආදායම පහත සඳහන් පරිදි වේ:

| | **2018** | **2017** |
|---|---|---|
| | රු. | රු. |
| අභ්‍යන්තර ප්‍රතිරක්ෂණය | 4,056,395,150 | 3,683,389,120 |
| SRCC හා Tr රක්ෂණ වාරික | 4,581,640,544 | 4,036,282,848 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 422,117,039 | 417,885,956 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 103,722,015 | 413,720,543 |
| ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ වාරික | 500,000,000 | 500,000,000 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන රක්ෂණ යෝජනා ක්‍රමය | 20,000,000 | 20,000,000 |
| | **9,683,874,748** | **9,071,278,467** |

| **අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එකතු කළ දායකත්ව මුදල්** | **2018** | **2017** |
|---|---|---|
| | රු. | රු. |
| සාමාජිකයින්ගෙන් ලද දායකත්ව මුදල් | 2,959,518,379 | 2,154,586,499 |
| භාණ්ඩාගාරයෙන් ලද දායකත්ව මුදල් | 750,000,000 | 500,000,000 |
| විශ්‍රාමික රක්ෂණ යෝජනා ක්‍රමය | 101,282,200 | 58,785,600 |
| අර්ධ රාජ්‍ය යෝජනා ක්‍රමය | 206,620,325 | 13,150,500 |
| | **4,017,420,904** | **2,726,522,599** |

## 6. නොඉපැයූ රක්ෂණ වාරික සඳහා සංචිතයේ වෙනස

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නොඉපැයූ රක්ෂණ වාරික සඳහා සංචිතයේ වෙනස්කම් - මෙම සංචිතය මගින් වර්ෂය තුල, එහෙත් ආවරණය තුල කල් ඉකුත් නොවූ කාලසීමාවට අදාල ලිඛිත රක්ෂණ වාරික ප්‍රමාණය පෙන්නුම් කෙරේ. නොඉපැයූ රක්ෂණ වාරික මෝටර් රථ හා මෝටර් රථ නොවන සාමාන්‍ය රක්ෂණය සහ අග්‍රහාර සෞඛ්‍ය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් 365 පදනම මත, SRCC සම්බන්ධයෙන් 1/24 පදනම මත හා සාමාන්‍යයෙන් පිළිගත් රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ කර්මාන්ත කටයුතු හා සමගාමීව ප්‍රතිරක්ෂණය වෙනුවෙන් 35%ක දළ රක්ෂණ පදනමක් මත ගණනය කෙරේ. මෙම සංචිතයේ වෙනස මගින් රක්ෂණයන්හි කල් ඉකුත් නොවූ කාලසීමාව ආවරණය කිරීමට නොඉපැයූ රක්ෂණ සංචිතය වෙත මාරු කළ දළ ලිඛිත රක්ෂණ වාරිකවල ශුද්ධ ප්‍රමාණය පෙන්නුම් කෙරේ.

## 7. ප්‍රතිරක්ෂකයින් වෙත ලබා දුන් රක්ෂණ වාරික

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රතිරක්ෂකයින් වෙත ලබා දුන් රක්ෂණ වාරික හඳුනාගැනීම - ජීවිත රක්ෂණ නොවන රක්ෂණවල දළ ප්‍රතිරක්ෂණ වාරික මගින් කාලසීමාව තුල එළැඹි ගිවිසුම් මගින් ලබා දී ඇති මුළු කාලසීමාව සඳහාම ගෙවිය යුතු මුළු රක්ෂණ වාරික වටිනාකම ඇතුලත් වන අතර, රක්ෂණය ක්‍රියාත්මක වන දිනයේදී හඳුනාගැනේ. පූර්ව ගිණුම්කරණ කාලසීමාවන් තුල ක්‍රියාත්මක වන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලසීමාව තුල හටගන්නා යම් ගැලපුමක් රක්ෂණ වාරික තුල අන්තර්ගත වේ.

## 8. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතයේ වෙනස

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතයේ වෙනස - නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය යන්නෙන් වාර්තා කිරීමේ දිනට පසු අවදානම් කාලසීමාවන් සඳහා අදාල වන වර්ෂයක් තුල ලිඛිත රක්ෂණ වාරිකවල වටිනාකම අදහස් කෙරේ. පදනම් වූ සෘජු රක්ෂණාවරණයන්හි කාලසීමාව තුල නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික කල් තබනු ලැබේ. මෙම සංචිතයේ වෙනස මගින් ආවරණයේ කල් ඉකුත් නොවූ කාලසීමාව ආවරණය කිරීමට වර්ෂය තුල නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිත වෙත මාරු කරන ලද ප්‍රතිරක්ෂණ වාරිකවල ශුද්ධ ප්‍රමාණය පෙන්නුම් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**9. ශුද්ධ හිමිකම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ශුද්ධ හිමිකම් හඳුනාගැනීම - ජීවිත රක්ෂණය නොවන වෙනත් රක්ෂණ සඳහා ශුද්ධ හිමිකම් යන්නට, හිමිකම් සකස් කිරීම හා නිරවුල් කිරීමට ඍජුවම අදාල වන බාහිර හිමිකම් පිළිබඳ කටයුතු කිරීමේ පිරිවැයට සම්බන්ධ වාර්තා කළ හෝ නොකළ වර්ෂය තුල හටගත් සියලුම හිමිකම්, බේරුම්කරණ හා වෙනත් අයකරගැනීම්වල වටිනාකම අඩු කිරීමක් හා පෙර වසරවල හිඟ හිමිකම්වල යම් ගැලපුමක් ඇතුලත් වේ. එක් එක් හිමිකම් ලිපිගොනු සමාලෝචනය කිරීම හා හිමිකම් නිරවුල්කිරීමේ අවසන් පිරිවැයෙහි වෙනස්කම් ඇස්තමේන්තු කිරීම මගින් හිඟ හිමිකම් අගය කෙරේ.

ඍජු රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් හිමිකම් සඳහා වියදම් හා හිඟ හිමිකම් සඳහා වගකීම් හඳුනාගැනේ. වාර්තා කර ඇති, එහෙත් මෙතෙක් ගෙවා නොමැති හිමිකම්, හටගත්, එහෙත් වාර්තා කර නොමැති හිමිකම් (IBNR) හා එම හිමිකම් නිරවුල් කිරීමට අපේක්ෂිත ඍජු හා වක්‍ර පිරිවැය මෙම වගකීම මගින් ආවරණය කෙරේ. අතීත අත්දැකීම් හා ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම් වඩාත් යථාර්ථවාදී ලෙස ඇස්තමේන්තු කිරීම තහවුරු කිරීම පිණිස, සිදු වූ නමුත් හඳුනා නොගත් දේ හි දළ වෙනස සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන කාර්තුමය පදනම මත ආයුගණක ලෙස ඇගයේ.

දැනට පවතින තොරතුරු මත පදනම්ව හිමිකම් සඳහා සාධාරණව ප්‍රතිපාදන දක්වා ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සලකනු ලබන විට, පසුව ලැබෙන තොරතුරු හා සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අවසන් වගකීම වෙනස් විය හැකිය. මෙමගින් ලබා දී ඇති මුදලෙහි ගැලපුමක් සිදු කළ හැකිය. එවැනි මුදලක් එම කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල පිළිඹිබු කෙරේ. භාවිත කරන ක්‍රමවේද සහ සකස් කරන ලද ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනාගැනීම - අදාල ගිවිසුමේ නියමයන්ට අනුව ආශ්‍රිත දළ රක්ෂණ හිමිකම් හඳුනාගැනෙන විට, ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනාගැනේ.

ප්‍රතිරක්ෂිත ව්‍යාපාර නිෂ්පාදිත වර්ගීකරණය සැලකිල්ලට ගනිමින්, ප්‍රතිරක්ෂණයද ඍජු ව්‍යාපාරයක් සේ සලකන්නේ නම්, ඒ හා සමානවම උපකල්පිත ප්‍රතිරක්ෂණ මත හිමිකම් ආදායමක් හෝ වියදමක් සේ හඳුනාගැනේ.

**10. ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ පිරිවැය**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රාරක්ෂණ හා කල් තබන ලද අත්පත්කරගැනීමේ පිරිවැය හඳුනාගැනීම - වෙනස් වන හා ව්‍යාපාර නිෂ්පාදිතවලට ඍජුවම අදාල වන කොමිෂන් ගාස්තු හා අත්පත්කරගැනීමේ වියදම් කල් තබා, ආශ්‍රිත ලිඛිත රක්ෂණ වාරික ඉපැයූ කාලසීමාව තුල ක්‍රමක්ෂය කෙරේ.

කල් තබන ලද අත්පත්කරගැනීමේ පිරිවැය තුල ප්‍රතිරක්ෂණ කොමිෂන් ගාස්තු ද එලෙසම සලකනු ලැබේ.

**11. වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම් හඳුනාගැනීම - මෙම වියදම් උපචිත පදනමින් හඳුනාගැනේ. ව්‍යාපාරය පවත්වාගෙනයාමේදී හා දේපල, පිරියත හා උපකරණ නඩත්තු කිරීමේදී හටගන්නා සියලුම වියදම් ලාභාලාභ ප්‍රකාශය තුල සටහන් කෙරේ.

කාර්යමණ්ඩල සඳහා වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - කෙටිකාලීන සේවක ප්‍රතිලාභ - කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වගකීම් වට්ටම් රහිත පදනමක් මත ගණනය කරනු ලබන අතර, ආශ්‍රිත සේවාව ලබාදීමේදී වියදම් පෙන්නුම් කෙරේ. සේවකයා විසින් ලබා දී ඇති අතීත සේවාවක් හේතුවෙන් යම් මුදලක් ගෙවීමට මණ්ඩලයට වර්තමානයේ නීතිමය හෝ ව්‍යුහාත්මක වගකීමක් ඇත්නම්, කෙටිකාලීන මුදල් ප්‍රසාද දීමනා හෝ ලාභ බෙදාහැරීමේ සැලසුම් යටතේ ගෙවීමට නියමිත මුදල සඳහා වගකීමක් හඳුනාගැනෙන අතර,මෙම වගකීම සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකිය.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - අර්ථනිරූපිත ප්‍රතිලාභ සැලසුම් - අර්ථනිරූපිත ප්‍රතිලාභ සැලැස්මක් යනු අර්ථනිරූපිත දායකත්ව සැලැස්මක් හැර යම් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. මණ්ඩලය අර්ථනිරූපිත ප්‍රතිලාභ වගකීම්හි මෙම වෙනස්කම් ලාභාලාභ ප්‍රකාශයේ කාර්යමණ්ඩල වියදම් යටතේ හඳුනාගනියි.

(අ) වත්මන් සේවා පිරිවැය
(ආ) පොලී පිරිවැය

වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර අර්ථනිරූපිත ප්‍රතිලාභ වගකීම් පිළිබඳ සටහන් අංක 34 බලනු මැනවි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - අර්ථනිරූපිත දායකත්ව සැලසුම් - අර්ථනිරූපිත දායකත්ව සැලැස්මක් යනු යම් ආයතනයක් විසින් තවත් එක් ආයතනයක් වෙත ස්ථාවර දායකත්ව මුදල් ගෙවනු ලබන හා තවත් මුදලක් ගෙවීමට නීතිමය හෝ ව්‍යුහාත්මක වගකීමක් නොවන යම් පශ්චාත් සේවා නියුක්ති සැලැස්මකි. සියලුම සේවකයින් ආවරණය කරන, සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල යටතේ සේවක අර්ථසාධක අරමුදල වෙත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල යටතේ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත දායකත්ව මුදල් ගෙවීමේ වගකීම, එම ගෙවීම් නියමිත වූ දිනයේදී ලාභාලාභ ප්‍රකාශය තුල සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනාගැනේ. මණ්ඩලය විසින් සේවකයින්ගේ ශුද්ධ පාරිශ්‍රමිකවලින් 12% ක් හා 3%ක් පිළිවෙලින්, සේවක අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

**12. ගාස්තු ආදායම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ගාස්තු හඳුනාගැනීම - ආවරණ පරිපාලනය කිරීමේ සේවාවන් හා වෙනත් ගිවිසුම් ගාස්තු සඳහා ආවරණහිමියන්ගෙන් ගාස්තු අය කෙරේ. මෙම ගාස්තු ලැබීම් මත ආදායම් ලෙස හෝ ගෙවීමට නියමිත ලෙස හඳුනාගැනේ.

**13. ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභ**

සාධාරණ වටිනාකම් ලාභ හා පාඩු හඳුනාගැනීම - ආයෝජන මත ලාභලාභ ප්‍රකාශය තුල වාර්තා කරන ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභ තුල මූල්‍ය වත්කම් මත ලාභ සහ පාඩු ඇතුලත් වේ. ආයෝජන අලෙවිය මත ලාභ හා පාඩු ශුද්ධ අලෙවි ආදායම් හා මුල් හෝ ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස ලෙස ගණනය කරන අතර, එම අලෙවි කටයුත්ත සිදුවීම මත වාර්තා කෙරේ.

**14. වෙනත් ආදායම්**

වෙනත් ආදායම් තුල බේරුම්කරණය මත බැහැර කිරීමේ ලාභ/(පාඩු), දේපල, පිරියත හා උපකරණ සහ විවිධ ආදායම් ඇතුලත් වේ. අලෙවිය සිදුවන කාලසීමාව තුල දේපල, පිරියත හා උපකරණ අලෙවිය මත ලාභය හෝ පාඩුව හඳුනාගැනෙන අතර, එය වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කෙරේ.

**15. බදුවලට පෙර ලාභය**

බදුවලට පෙර ලාභය, පහත සඳහන් වියදම් අයකරගැනීමෙන් අනතුරුව සඳහන් කෙරේ:

**16. ආදායම් බදු වියදම්**

ආදායම් බදු වියදම් හඳුනාගැනීම - ආදායම් බදු වියදම තුල වත්මන් හා කල් තබන ලද බදු ඇතුලත් වේ. එම බදු ස්කන්ධ තුල හඳුනාගන්නා විට ස්කන්ධ තුල ඍජුවම හඳුනාගන්නා අයිතමවලට අදාල වන මට්ටමට හැර, එකී බදු ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනාගැනේ.

ආදායම් බදුවල ප්‍රධාන අංග පහත සඳහන් පරිදි වේ:

**16.2 විලම්බිත බදු වගකීම් (රඳවාතබාගැනීමේ බදු)**

මණ්ඩලයට විලම්බිත බදු කපා හැරීමට ශක්‍යතාව හිමිවන ආකාරයෙන් මණ්ඩලය විසින් අනාගතයේ බදු අයකළ හැකි ලාභය පිළිබඳ ඇගයීමක් සිදු කර ඇත. මෙම ඇගයීම මත පදනම්ව, මණ්ඩලයට නුදුරු අනාගතයේදී විලම්බිත බදු භාවිත කිරීමේ හැකියාවක් නොමැති හෙයින්, එසේ ගෙවන ලද විලම්බිත බදු ලාභාලාභ ගිණුමින් අය කෙරේ. එසේ වුවද, බදු අයකළ හැකි ප්‍රමාණවත් ලාභයක් අනාගතයේ පවතී නම්, මණ්ඩලය විසින් එවැනි කපා හරින ලද විලම්බිත බදු නැවත ගිණුම්ගත කර, ඉල්ලා සිටිනු ලැබේ.

**17. අස්පෘශ්‍ය වත්කම්**

මණ්ඩලයේ අස්පෘශ්‍ය වත්කම් තුල අත්පත්කරගත් පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුලත් වේ.

හඳුනාගැනීමේ පදනම - යම් වත්කමකින් ලැබිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා එන්නේ නම් හා එම වත්කමේ පිරිවැය සාධාරණ ලෙස ගණනය කළ හැකි නම්, අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගැනේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

මණ්ඩලය විසින් අත්පත්කරගත් මෘදුකාංග මූලිකව පිරිවැය මත ගණනය කරනු ලබන අතර, ඉන් පසුව, සමුච්චිත ක්‍රමක්ෂය කිරීම් හා සමුච්චිත හානිකරණය පාඩු වේ නම්, එවැනි ක්‍රමක්ෂය කිරීම් හා හානිකරණය පාඩුවලින් පිරිවැය අඩුකර ලැබෙන වටිනාකමට සඳහන් කෙරේ.

පසුකාලීන වියදම් - මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය කිරීම් හා සමුච්චිත හානිකරණ පාඩුවලින් පිරිවැය අඩුකර ලැබෙන වටිනාකමට ඉදිරියට ගෙන යනු ලැබේ.

මෘදුකාංග පිළිබඳ පසුකාලීන වියදම්, ඊට අදාල වන යම් නිශ්චිත දේපලකට සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් ඉහළ නංවන්නේ නම් පමණක්, ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම වියදම් හටගත් ඒවා සේ සැලකේ.

ක්‍රමක්ෂය කිරීම - අස්පෘශ්‍ය වත්කම් වසර හතරක කාලසීමාවක් පුරා සෘජු රේඛීය පදනමක් මත ක්‍රමක්ෂය කෙරේ. ක්‍රමක්ෂය කිරීම ලාභාලාභ ප්‍රකාශය තුල ගිණුම්ගත කෙරේ.

සීමිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් ආයුකාලයක් තුල ක්‍රමක්ෂය කෙරේ. ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව හා සීමිත ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමවේදය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත ආයුකාලයේ හෝ වත්කමට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාවේ වෙනස්කම් යෝග්‍ය පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් වාර්තා කෙරෙන අතර, එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සැලකේ.

සීමිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම්, එම වත්කමෙහි ක්‍රියාකාරිත්වය සමඟ අනුගත වන ලාභාලාභ ප්‍රකාශයේ වියදම් කාණ්ඩය තුල හඳුනාගැනේ.

පහත සඳහන් අස්පෘශ්‍ය වත්කම්හි ආයුකාලය මත එහි ශේෂ වටිනාකමට එම වත්කම්හි පිරිවැය ගිණුම්ගත කිරීම පිණිස, ක්‍රමක්ෂය කිරීම සෘජු රේඛීය ක්‍රමය භාවිත කරමින් ගණනය කෙරේ:අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීම - බැහැර කිරීම මත හෝ යම් අස්පෘශ්‍ය වත්කමකින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට, එම අස්පෘශ්‍ය වත්කම හඳුනාගැනීමක් සිදු නොකෙරේ. එවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීම තුලින් හටගන්නා පාඩුව හෝ ලාභය, එවැනි අයිතමයක් හඳුනා ගැනිමකින් තොරව බැහැර කරන විටදී, ලාභාලාභ ප්‍රකාශය තුල ඇතුලත් කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - අස්පෘශ්‍ය වත්කම් හානිකරණය වීම - යම් හානිකරණයක් සිදු ව ඇති බවට පෙන්නුම් කරන විටකදී හානිකරණය පිළිබඳ සමාලෝචනයක් සිදු කෙරේ. අයකරගතහැකි මුදල ඉදිරියට ගෙනයාමේ වටිනාකමට වඩා අඩු නම්, යම් හානිකරණ පාඩුවක් ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනාගැනේ. එක් එක් වාර්තාකිරීමේ කාලසීමාව සඳහා දැඩි ගිවිසුම්ගත විධිවිධානයක් ස්ථාපිත කිරීමේදී අනාගත සේවාවන් ලබාගැනීමේ අයිතීන්ද සලකා බැලේ.

17.7 භාවිතයේ ඇති සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද අස්පෘශ්‍ය වත්කම් රු.6,542,073ක් විය - දැනටත් භාවිතයේ ඇති හෝ වාර්තා කරන දිනට අක්‍රිය අස්පෘශ්‍ය වත්කම් (2017 – 6,542,073).

17.8 අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ හිමිකම් සම්බන්ධ සීමාවන් - අස්පෘශ්‍ය වත්කම්හි අයිතිය පිළිබඳ කිසිදු සීමාවක් නොමැති අතර, වගකීම් වෙනුවෙන් ඇපකර ලෙස කිසිදු අයිතමයක් ඉල්ලා නැත.

17.9 වර්ෂය තුල අස්පෘශ්‍ය වත්කම් අත්පත්කරගැනීම් රු.1,702,201 විය. 2018 වර්ෂය තුල (2017 – 1,490,000)

17.10 අස්පෘශ්‍ය වත්කම් හානිකරණය වීම ඇගයීම - මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් හානිකරණය වීමේ හැකියාව පිළිබඳ සලකුණු අගයා ඇත. මෙම ඇගයීම මත, එවැනි කිසිදු හානිකරණය වීමක් පිළිබඳ සලකුණක් හඳුනා නොගත් හෙයින්, අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දිනයේදී හානිකරණය වීම පිළිබඳ කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් නොකෙරේ.

18. **දේපල, පිරියත හා උපකරණ**

සේවාවන් සැපයීම හා පරිපාලන කාර්යයන් සඳහා පවත්වාගෙන යනු ලබන ස්පෘශ්‍ය අයිතමයන් දේපල, පිරියත හා උපකරණ වන අතර, වර්ෂයකට වඩා කාලයක් භාවිත කිරීමට නියමිතය. මීට, කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, විවිධ වත්කම් සහ මෝටර් රථ ඇතුලත් වේ.

හඳුනාගැනීමේ පදනම - යම් වත්කමක් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ එම වත්කමේ පිරිවැය සාධාරණ ලෙස ගණනය කළ හැකි නම්, දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනේ.

ගණනය කිරීම - වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් මූලිකව එහි පිරිවැයට ගණනය කෙරේ. වත්කම් අත්පත්කරගැනීමට සෘජුවම දැරීමට සිදු වන වියදම හා ඉන්පසුකාලීනව එයට කොටසක් එක් කිරීමට හෝ ආදේශ කිරීමට වැය වන පිරිවැය, මෙම පිරිවැය තුල අන්තර්ගත වේ.ස්වයං නිෂ්පාදිත

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

වත්කම්හි පිරිවැය තුල ද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රමය, අපේක්ෂිත භාවිතය වෙනුවෙන් යම් වත්කමක් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම දායක වන වෙනත් යම් පිරිවැයක් හා අයිතමයන් වෙන්කිරීමේ හා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටි ස්ථානයේ නැවත පිහිටුවීමේ පිරිවැය ඇතුලත් වේ. ආශ්‍රිත උපකරණවල ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වන මිලදීගත් මෘදුකාංග, පරිගණක උපාංගයන්හි කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ.

මණ්ඩලය විසින් පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පිරිවැය ආකෘතිය අනුගමනය කර, මිලදීගැනීම් හෝ ඉදිකිරීම් මත සමුච්චිත ක්ෂය කිරීම් අඩු කර ලැබෙන යම් ආනුශංගික පිරිවැයක් සහ යම් සමුච්චිත හානිකරණ පාඩුවක් සමඟින් එකී මිලදීගැනීම් හෝ ඉදිකිරීම්වල පිරිවැය ගිණුම්ගත කරනු ලබයි.

අලුත්වැඩියාකිරීම් හා නඩත්තු කිරීම් හටගත් මූල්‍ය කාලසීමාව තුල ලාභාලාභ ප්‍රකාශයේ සටහන් කෙරේ. ප්‍රධාන පෙලේ අලුත්වැඩියාකිරීම්හි පිරිවැය වත්කම්හි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකමෙහි ඇතුලත් කරනුයේ, දැනට පවතින වත්කම්හි මෑතකදී අගයන ලද ප්‍රමිතිගත කාර්යසාධනය ඉක්මවා අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමට හැකියාවක් පවතින විටකදී වන අතර, අලුත්වැඩියාකිරීම මගින් වත්කමේ හඳුනාගතහැකි කොටසක් ආදේශ කෙරේ. ආශ්‍රිත වත්කමේ ඉතිරි ප්‍රයෝජ්‍ය ආයුකාලය තුල ප්‍රධාන අලුත්වැඩියාකිරීම් ක්‍රමක්ෂය කෙරේ.

දේපල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ආයුකාලය මත එහි ශේෂ වටිනාකම්වලට එකී දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ගිණුම්ගත කිරීම පිණිස, සෘජු රේඛීය ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය කිරීම ගණනය කෙරේ. භාවිතය සඳහා යම් වත්කමක් ලබාගත හැකි අවස්ථාවේදී, ක්‍රමක්ෂය කිරීම ආරම්භ කෙරේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදිය:

| | |
|---|---|
| පිරියත හා උපකරණ | වසර 10කට වඩා වැඩි |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | වසර 13.33කට වඩා වැඩි |
| කාර්යාල උපකරණ | වසර 13.33කට වඩා වැඩි |
| මෝටර් රථ | වසර 10කට වඩා වැඩි |

දේපල, පිරියත හා උපකරණ හඳුනා නොගැනීම
යම් දේපල, පිරියත හා උපකරණ අයිතමයක ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම, බැහැර කිරීම මත හෝ එයින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විටදී හඳුනාගැනීමක් සිදු නොකෙරේ. එසේ හඳුනා නොගැනීමකින් හටගන්නා ලාභ හෝ පාඩු, එවැනි අයිතමයක් හඳුනා නොගන්නා විටකදී, ලාභාලාභ ප්‍රකාශයෙහි ඇතුලත් කෙරේ.

යම් දේපල, පිරියත හා උපකරණ අයිතමයක ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුල ආදේශක පිරිවැය හඳුනාගනු ලබන අවස්ථාවේදී, එසේ ආදේශ කරන ලද කොටසේ ඉදිරියට ගෙන යනු ලබන ඉතිරි වටිනාකම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. එවැනි එක් එක් ප්‍රාග්ධනීයකරණය කිරීමකදී, පෙර පරීක්ෂා කිරීමේ පිරිවැයේ ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම හඳුනාගැනීමෙන් තොර වේ.

18.1 සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද, භාවිතයේ පවතින දේපල, පිරියත හා උපකරණ - දේපල, පිරියත හා උපකරණ තුලද සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාවිත කෙරෙන ක්‍රමක්ෂය කරන ලද වත්කම් ඇතුලත් වේ. වාර්තා කරන දිනට දැනටත් භාවිතයේ ඇති සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත සඳහන් පරිදි වේ;

18.2 දේපල, පිරියත හා උපකරණ මත හිමිකම් සීමාවන් - වාර්තා කරනු ලබන දිනට මණ්ඩලය සතු දේපල, පිරියත හා උපකරණ මත කිසිදු සීමාවක් නොතිබිණි.

18.3 වසර තුල දේපල, පිරියත හා උපකරණ අත්පත්කරගැනීම - මෙම මූල්‍ය වර්ෂය තුල, මණ්ඩලය විසින් රු.4,836,560ක වටිනාකමින් යුත් දේපල, පිරියත හා උපකරණ මිලදීගන්නා ලදී (2017 - රු.4,813,960). මෙම වර්ෂය තුල දේපල, පිරියත හා උපකරණ මිලදීගැනීම සඳහා රු.4,836,560 (2017 - රු.4,813,960) ක මුදල් ගෙවීම් සිදු කරන ලදී.

18.4 ඇපකර ලෙස ඉල්ලා සිටි දේපල, පිරියත හා උපකරණ - 2018 දෙසැම්බර් 31 දිනට වගකීම් සඳහා ඇපකර ලෙස ඉල්ලා සිටි කිසිදු දේපල, පිරියත හා උපකරණ අයිතමයක් නොතිබිණි. (2017 - කිසිවක් නැත).

18.5 තාවකාලික අක්‍රිය දේපල, පිරියත හා උපකරණ - 2018 දෙසැම්බර් 31 දිනට කිසිදු තාවකාලික අක්‍රිය දේපල, පිරියත හා උපකරණ අයිතමයක් නොතිබිණි. (2017 - කිසිවක් නැත).

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

18.6දේපල, පිරියත හා උපකරණ ඇගයුම - අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ හානිකරණය වීමේ හැකියාව පිළිබඳ පෙන්වන දර්ශකයන් ඇගයුමට ලක් කර ඇත. එම ඇගයුම මත පදනම්ව, කිසිදු එවැනි දර්ශකයක් හඳුනා නොගත් අතර, එහෙයින්, දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්තා කරනු ලබන දිනයේදී මූල්‍ය ප්‍රකාශ තුල කිසදු හානිකරණය ප්‍රතිපාදනයක් ලබාදිමට අවශ්‍ය නොවීය.

18.7දේපල, පිරියත හා උපකරණ මිලදීගැනීම සඳහා ගිවිසුම්ගත වගකීම්හි වටිනාකම - වාර්තා කරනු ලබන දිනයේදී දේපල, පිරියත හා උපකරණ අත්පත්කරගැනීම වෙනුවෙන් කිසිදු ගිවිසුම්ගත වකීමක් නොමැත.

18.8පසුකාලීනව දේපල, පිරියත හා උපකරණ ගණනය කිරීම

වෘත්තීයමය ලෙස සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් විවෘත වෙළඳපොල වටිනාකම් යොදාගනිමින් නැවත තක්සේරුකිරීම සිදු කරනු ලබයි. වත්කම් කාලීනව නැවත තක්සේරු කරනු ලබන අතර, 2018 වර්ෂයේදී එසේ නැවත තක්සේරු කිරීමක් සිදු කර ඇත. නැවත තක්සේරුකිරීමේ අතිරික්තය, වත්කමේ ඉදිරියට ගෙන යනු ලබන ශුද්ධ වටිනාකම තුල හඳුනාගනු ලබන අතර, එම වත්කම නැවත තක්සේරු කරන ලද වටිනාකමට දැක්වීමෙන් අනතුරුව නැවත තක්සේරුකිරීමේ සංචිතයකට මාරු කෙරේ. නැවත තක්සේරු කිරීමේ සංචිතය, හඳුනාගැනීමෙන් බැහැර කරන අවස්ථාවකදී රඳවාගත් ඉපැයුම්වලට මාරු කෙරේ.

19. **මූල්‍ය ආයෝජන**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - මූල්‍ය ආයෝජන වර්ගීකරණය කිරීම - මණ්ඩලය මූලික වශයෙන් ණය හා ලැබිය යුතු ආදායම් ජනනය වූ දිනයේ සිට එකී ණය හා ලැබිය යුතු ආදායම් හඳුනාගනියි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභාලාභ මගින් සාධාරණ වටිනාකමට නියම කරන ලද වත්කම් ඇතුලුව) මූලිකව එම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවලට මණ්ඩලය පාර්ශ්වයක්වූ වෙළඳ දිනයේ සිට හඳුනාගැනේ. මූල්‍ය වත්කම් ලාභාලාභ මගින් සාධාරණ වටිනාකමට නියම නොකරන අවස්ථාවකදී, යම් මූල්‍ය වත්කමක් මූලිකව ගණනය කෙරෙනුයේ එම වත්කම අත්පත්කරගැනීමේදී හෝ නිකුත් කිරීමේදී ඍජුවම හටගන්නා ගණුදෙණුමය පිරිවැය සමඟ සාධාරණ වටිනාකමටය.

ආයෝජන වත්කම් පවත්වාගෙනයාමේ හැකියාව සහ චේතනාව මත පදනම්ව, මණ්ඩලය විසින් සිය ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩවලට වර්ග කරනු ලබයි:

• ලාභාලාභ මගින් සාධාරණ මිල (FVTPL); • ණය හා ලැබිය යුතු ආදායම් (L&R); •විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS); සහ •යෝග්‍ය පරිදි කල් පිරීමට තබා ඇති (HTM)

එසේ වුවද, වාර්තා කරනු ලබන දිනයේදී මණ්ඩලය සතුව කල් පිරීමට ඇති ආයෝජන ලෙස වර්ග කර ඇති යම් ආයෝජනයක් හා ලාභාලාභ ආයෝජන මගින් සාධාරණ වටිනාකමට වර්ග කර ඇති අයෝජන නොතිබිණි (2017 - කිසිවක් නැත).

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - මූල්‍ය වත්කම් හඳුනාගැනීමකින් තොරව බැහැර කිරීම - මූල්‍ය වත්කමෙන් ලද මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට හෝ මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ අයිතිය හා සම්බන්ධ වරදාන සැලකිය යුතු ලෙස මාරු කරන ගණුදෙණුවකදී මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතිය මණ්ඩයලය මගින් පවරා දෙනු ලබන විට, මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් හඳුනාගැනීමකින් තොරව බැහැර කරනු ලබයි. මණ්ඩලය විසින් නිර්මාණය කරන හෝ රඳවාගන්නා මාරු කරන ලද මූල්‍ය වත්කමක යම් පොලියක් වෙන් වෙන් වූ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගැනේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - මූල්‍ය උපකරණවල ශුද්ධ ශේෂය ලබාගැනීම - මූල්‍ය වත්කම් හා වගකීම් ශුද්ධ ශේෂයට යටත් වන අතර, ශුද්ධ අගය, මණ්ඩලයට එසේ ශුද්ධ ශේෂයක් පෙන්වීමට හා ශුද්ධ පදනමක් මත වත්කම් නිරවුල් කිරීමට හෝ අත්පත්කරගැනීමට අපේක්ෂා කර, ඊට සමගාමීව වගකීම නිරවුල් කිරීමට මණ්ඩලයට නීතිමය අයිතියක් ඇති විටෙකදී පමණක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල ඉදිරිපත් කෙරේ.

ගණනය කිරීමේ කාණ්ඩය මගින් මණ්ඩලයේ මූල්‍ය ආයෝජන පහත පරිදි සාරාංශගතකර ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| කාණ්ඩය | මූල්‍ය වත්කම |
|---|---|
| ලාභාලාභ මගින් සාධාරණ වටිනාකම | කිසිවක් නැත |
| විකිණීමට ඇති | භාණ්ඩාගාර බැඳුම්කර<br>භාණ්ඩාගාර බිල්පත් |
| ණය හා ලැබිය යුතු | REPO,<br>එක්දින REPO |
| කල් පිරීමට තබා ඇති | විදේශ විනිමය සංවර්ධන බැඳුම්කර<br>භාණ්ඩාගාර බැඳුම්කර |

මූල්‍ය වත්කම්හි සාධාරණ වටිනාකම් සමඟ ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම්වලින් පහත සඳහන් වගුව සමන්විත වේ.

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම හා විකිණීමට ඇති ආයෝජන සාධාරණ වටිනාකමට අගයා ඇත. ණය හා ලැබිය යුතු ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගයා ඇත.

ලක්ෂණ මත පදනම්ව මූල්‍ය වත්කම් විශ්ලේෂණය කිරීම - පහත සඳහන් සටහන් මගින් එක් එක් උපකරණ කාණ්ඩයේ ලක්ෂණ මත පදනම්ව මූල්‍ය ආයෝජන පිළිබඳ අනාවරණය කිරීම් ලබා දේ.

19.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ලාභ හෝ පාඩු මගින් ආයෝජනවල සාධාරණ වටිනාකම හඳුනාගැනීම - ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් යන්නට අලෙවිය සඳහා පවතින මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූලිකව හඳුනාගැනීම මත නියම කර ඇති මූල්‍ය වත්කම් ඇතුලත් වේ. නුදුරු අනාගතයේදී අලෙවි කිරීමේ චේතනාවෙන් සාමාන්‍ය ලෙස මිලදීගත් ආයෝජන අලෙවිය සඳහා තබා ඇති ඒවා සේ වර්ග කෙරේ. ඇතිවියහැකි ගණුදෙණු පිරිවැය හටගත් පිරිවැය ලෙස ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනාගැනේ. මෙම ආයෝජන මූලිකව සාධාරණ වටිනාකමට ගිණුම්ගත කෙරේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ඒවා සාධාරණ වටිනාකමට නැවත ගණනය කෙරේ.

සාධාරණ වටිනාකමේ වෙනස්කම් ලාභාලාභ ප්‍රකාශයේ ‘සාධාරණ වටිනාකම් ලැබීම් හා පාඩු’යටතේ ගිණුම්ගත කෙරේ. මණ්ඩලය විසින් නුදුරේදී මූල්‍ය වත්කම් අලෙවි කිරීමට ඇති චේතනාව තවමත් යෝග්‍ය වන්නේද යන්න සලකා බලමින් සිය මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට (අලෙවිය සඳහා තබා ඇති) අගයනු ලබයි.

19.2 ණය සහ ලැබිය යුතු - ණය හා ලැබිය යුතු ආයෝජන හඳුනාගැනීම - ණය හා ලැබිය යුතු යන්නෙන් ස්ථාවර හෝ ක්‍රියාකාරී වෙළඳපොලක් තුල දක්වා නොමැති නිර්ණය කළ හැකි ගෙවීම් අදහස් කෙරේ. මෙම ආයෝජන මූලික වශයෙන් එම වත්කම අත්පත්කරගැනීම සඳහා ගෙවන ලද මුදලේ සාධාරණ වටිනාකම් පිරිවැයට හඳුනාගැනේ. එම අත්පත්කරගැනීමට සෘජුවම අදාල සියලුම ගණුදෙණු පිරිවැය ද ආයෝජන පිරිවැයෙහි ඇතුලත් වේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, ණය හා ලැබිය යුතු දෑ EIR භාවිත කරමින් හානිකරණය සඳහා දීමනා අඩු කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනුයේ, EIR හි වැදගත් අංගයක් වන ගාස්තුවක් හෝ පිරිවැය සහ අත්පත්කරගැනීම මත යම් වට්ටමක් හෝ වාරිකයක් වේ නම්, එවැනි වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. EIR ක්‍රමක්ෂය කිරීම, හානිකරණය වීම හේතුසාධක වන ලාභාලාභ ප්‍රකාශයේ වියදමක් ලෙස ඇතුලත් කර, හඳුනාගැනේ.

ආයෝජන හඳුනාගැනීමෙන් බැහැර කෙරෙන හෝ හානිකරණය වන අවස්ථාවකදී මෙන්ම ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමවේදය මගින්ද ලාභ හෝ පාඩු ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනාගැනේ. ණය හා ලැබිය යුතු දෑ නැවත මිලදීගැනීමේ ගිවිසුම්වල සඳහන් ආයෝජන තුල ඇතුලත් වේ.

19.2.1 නැවත මිලදීගැනීමේ ගිවිසුම් - මණ්ඩලය විසින් මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හා එන් එස් බී අරමුදල් කළමනාකරණ ( පුද්ගලික ) සමාගමෙහි හි ආපසු හැරවිය හැකි නැවත මිලදීගැනීමේ ගිවිසුම්වල (REPO) ආයෝජනය කර ඇති අතර, ඒවා ISIN අංක සමඟ පවරා ඇති රජයේ ඇපකර සමඟ පූර්ණ සුරක්ෂිතභාවයෙන් යුතු වේ. හිඟ ශේෂ සඳහා ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම්පත් ආයෝජන අනුපාත විවිධ කල් පිරීම් කාලසීමාවන් මත, 7% - 9.25% පරාසයක පැවතිණි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

19.3 **විකිණීමට ඇති**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - විකිණීමට ඇති ආයෝජන හඳුනාගැනීම - මීට භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් ඇතුලත් විය හැකිය.

මූලික ගණනය කිරීමෙන් පසු, විකිණීමට ඇති මූල්‍ය වත්කම් විකිණීමට ඇති සංචිතය යටතේ වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගත් අත්පත්කරනොගත් ලාභ හෝ පාඩු සමඟ සාධාරණ වටිනාකමට ඉන් අනතුරුව ගණනය කෙරේ. විකිණීමට ඇති ආයෝජන පවත්වාගනිමින් ඉපැයූ පොලී EIR භාවිත කරමින් 'පොලී ආදායම්'ලෙස ගිණුම්ගත කෙරේ. වත්කම හඳුනාගැනීමෙන් බැහැර කළ විට, ලාභාලාභ ප්‍රකාශයේ සඳහන් සමුච්චිත ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ලාභාලාභ ප්‍රකාශයට මාරු කෙරේ. එම වත්කම හානිකරණය වීමට නියමිත බව නිර්ණය කරනු ලැබුවහොත්, එම සමුච්චිත පාඩුව ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනාගැනෙන අතර, විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරේ.

සිය මූල්‍ය වත්කම් නුදුරේදී විකිණීමේ හැකියාව හා චේතනාව තවමත් යෝග්‍ය වන්නේද යන්න මණ්ඩලය විසින් අගයනු ලැබේ. දුර්ලභ අවස්ථාවන්හිදී, ක්‍රියාකාරී නොවන වෙළඳපොලවල් හේතුවෙන් මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් අලෙවි කිරීමට නොහැකි වන අතර, පූර්වේක්ෂණය කළ හැකි අනාගතය වෙනුවෙන් හෝ කල් පිරෙන තෙක් එම වත්කම් තබාගැනීමේ හැකියාව හා චේතනාව කළමනාකාරිත්වය සතු වන්නේ නම්, එම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීමට මණ්ඩලය තීරණය කරයි. මූල්‍ය වත්කම, ණය හා ලැබිය යුතු දෑ යන්නෙහි නිර්වචනය සපුරාලන විටදී හා පූර්වේක්ෂණය කළ හැකි අනාගතය වෙනුවෙන් හෝ කල් පිරෙන තෙක් එම වත්කම් තබාගැනීමේ හැකියාව හා චේතනාව කළමනාකාරිත්වය සතු වන විටදී, ණය හා ලැබිය යුතු දෑ වර්ගීකරණය කිරීම සඳහා අවකාශය හිමි වේ. කල්පිරීමට තබා ඇති ආයෝජන නැවත වර්ගීකරණය කිරීමට අවසර හිමිවන්නේ, කල් පිරෙන තෙක් එම මූල්‍ය වත්කම් තබාගැනීමේ හැකියාව හා චේතනාව ආතනය සතු වන්නේ නම් පමණි.

විකිණීමට ඇති කාණ්ඩයෙන් බැහැරව යම් මූල්‍ය වත්කමක් නැවත වර්ගීකරණය කිරීම පිණිස, එසේ නැවත වර්ගීකරණය කරනු ලබන දිනයේදී පවතින සාධාරණ වටිනාකම නව ක්‍රමක්ෂය පිරිවැය බවට පත්වන අතර, ස්කන්ධ තුල හඳුනාගනු ලැබ ඇති එම වත්කම මත යම් පූර්ව ලාභයක් හෝ පාඩුවක්, EIR භාවිත කරමින් ආයෝජනයේ ඉතිරි ආයුකාලය මත ලාභාලාභ ප්‍රකාශය තුල ක්‍රමක්ෂය කර ඇත. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හා කල්පිරීමේ වටිනාකම අතර වෙනසද EIR භාවිත කරමින් වත්කමේ ඉතිරි ආයුකාලය මත ක්‍රමක්ෂය කර ඇත. එම වත්කම පසුකාලීනව හානිකරණය කිරීමට තීරණය කර ඇත්නම්, ස්කන්ධවල ගිණුම්ගත කර ඇති මුදල ලාභාලාභ ප්‍රකාශය තුල නැවත වර්ගීකරණය කෙරේ.

19.3.1 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන හානිකරණය වීම - වාර්තා කරනු ලබන දිනයේදී, ගෙවීමට ඇති හා හානිකරණය වූ විකිණීමට ඇති කිසිදු මූල්‍ය වත්කමක් නොතිබිණි.

20. **ලැබිය යුතු ප්‍රතිරක්ෂණ**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ලැබිය යුතු ප්‍රතිරක්ෂණ - මණ්ඩලය සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සියලුම ව්‍යාපාර වෙත රක්ෂණ අවදානම් ප්‍රදානය කරයි. ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මගින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබීමට ඇති ශේෂයන් නියෝජනය වේ. ප්‍රතිරක්ෂකයින් වෙතින් අයකරගතයුතු මුදල්, හිඟ හිමිකම් ප්‍රතිපාදන හෝ ප්‍රතිරක්ෂකයාගේ ආවරණය ආශ්‍රිත නිරවුල් කරන ලද හිමිකම් හා අනුගත ක්‍රමවේදයකින් ඇස්තමේන්තු කෙරෙන අතර, ආශ්‍රිත ප්‍රතිරක්ෂණ ගිවිසුම් සමඟ අනුකූල වේ.

ලබාදී ඇති ප්‍රතිරක්ෂණ වැඩසටහන් මගින් මණ්ඩලයට සිය රක්ෂණාවරණහිමියන් වෙත පවතින වගකීම්වලින් නිදහස් නොකෙරේ.

ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට මූලික ලෙස හඳුනාගැනීම මත ගණනය කළ හෝ ගෙවීමට නියමිත අවස්ථාවේදී, ලැබිය යුතු ප්‍රතිරක්ෂණ හඳුනාගැනේ.

ගිවිසුම්ගත අයිතීන් අවසන් කළ විට හෝ කල් ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයක් වෙත මාරු කළ විට හෝ ප්‍රතිරක්ෂණ වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

සෑම වාර්තා කිරීමේ දිනයකදීම හෝ වාර්තා කරනු ලබන වර්ෂයේදී හානිකරණය වීමක් පිළිබඳ හැඟවීමක් පලවුවහොත් වඩාත් සුලබව ප්‍රතිරක්ෂණ වත්කම් සමාලෝචනය කෙරේ. ගිවිසුමේ නියමයන් යටතේ සියලුම හිඟ මුදල් මණ්ඩලය වෙත හිමි නොවිය හැකි ප්‍රතිරක්ෂණ වත්කම් මූලිකව හඳුනාගැනීමෙන් අනතුරුව ඇතිවන යම් සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වාස්තවික සාක්ෂි පවතින විට හානිකරණය වීම සිදුවන අතර, ප්‍රතිරක්ෂකයින්ගෙන් මණ්ඩලය වෙත ලැබිය හැකි මුදල් මත එම සිදුවීම සැලකිය යුතු මට්ටමින් බලපෑමක් කරනු ඇත. ප්‍රතිරක්ෂණ පාඩුව ලාභාලාභ ප්‍රකාශය තුල වාර්තා කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

21. **ලැබිය යුතු රක්ෂණ**

ලැබිය යුතු රක්ෂණ - ලැබිය යුතු රක්ෂණ, ගෙවීමට ඇති හා ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට මූලික හඳුනාගැනීම මත ගණනය කරනු ලබන අවස්ථාවේදී හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ලැබිය යුතු රක්ෂණ ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. ඉදිරියට ගෙන යනු ලබන මුදල, සිදුවීම් හෝ අවස්ථාවන් මගින් ලාභාලාභ ප්‍රකාශය තුල වාර්තා කර ඇති හානිකරණය පාඩුව සමඟ අයකරගත නොහැකි බවට දක්වාලනු ලබන විටදී, ලැබිය යුතු රක්ෂණවල ඉදිරියට ගෙන යන වටිනාකම හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේ පටිපාටිය සපුරාලනු ලැබ ඇති විටදී, ලැබිය යුතු රක්ෂණ හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති රක්ෂණ වාරික ගෙවීමේ වගකීමේ (PPW) නියෝගය පරිදි, සියලුම සාමාන්‍ය රක්ෂණාවරණ PPWට යටත් වන අතර, නිරවුල් කරනු නොලැබුවහොත්, දින 60ක් ඉකුත්වීම මත අවලංගු කළ හැකිය. එසේ වුවද, රාජ්‍ය ආයතනවලින් හා ප්‍රතිරක්ෂණ සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල වැනි අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රම සඳහා ලැබිය යුතු රක්ෂණ වාරික මෙම පාර්ශ්වයන්ගෙන් අයකරගැනීම නිශ්චිත වන හෙයින්, දින 60ක් ඉකුත්වීමෙන් පසු අවලංගු නොකෙරේ.

රාජ්‍ය ආයතන හැර වෙනත් පෞද්ගලික පාර්ශ්වයන් හා ප්‍රතිරක්ෂණ සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල වැනි අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මණ්ඩලය PPW ක්‍රමවේදය අදාලකරගෙන ඇති හෙයින්, ලැබිය යුතු රක්ෂණ වාරික තුල කිසිදු දිගුකාලීන හිඟ ශේෂයක් අන්තර්ගත නොවේ. එම නිසා, මෝටර් රථ සහ මෝටර් රථ නොවන සාමාන්‍ය රක්ෂණ සඳහා ලබාදී ඇති මුදල හැර වෙනත් අතිරේක හානිකරණ පාඩු ප්‍රතිපාදනයක් ලබාදීම අවශ්‍ය නොවේ.

50% ලබා දෙනු ලැබේ -> දින 60 <දින 90

100% ලබා දෙනු ලැබේ -> දින 90

22. කල් තබන ලද වියදම්

නව ව්‍යාපාර සමඟ වෙනස් වන හා නිෂ්පාදනයට සෘජුවම අදාල වන කොමිෂන් ගාස්තු, ප්‍රාරක්ෂණ, අලෙවි හා රක්ෂණාවරණ නිකුත් කිරීමේ වියදම් ඇතුලු නව ව්‍යාපාර අත්පත්කරගැනීමේ වියදම්, අනාගතයේ රක්ෂණ වාරිකවලින් මෙම පිරිවැය නැවත අයකරගත හැකි මට්ටම තෙක් කල් තැබේ. වෙනත් සියලුම අත්පත්කරගැනීමේ පිරිවැය, හටගත් විට වියදමක් ලෙස හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නොඉපැයූ රක්ෂණ වාරික ක්‍රමක්ෂය කිරීමේ පදනම මත එම කාලසීමාව සඳහා කල් තබන ලද අත්පත්කරගැනීමේ පිරිවැය (DAC) ක්‍රමක්ෂය කෙරේ.

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව හෝ අපේක්ෂිත ආයු කාලයේ වෙනස්කම්, ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කිරීම මගින් ගණනය කෙරෙන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස සැලකේ.

**අදාල කොන්ත්‍රාත්තු කල් ඉකුත් වී ඇති විට හෝ අවලංගු කර ඇති විට, DAC හඳුනා නොගැනේ.**

**DACහි හානිකරණය සමාලෝචනයක් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී හෝ හානිකරණයක් පිළිබඳ පෙන්වාදීමක් සිදු වන විටෙක සුලබ වශයෙන්DACහි හානිකරණ සමාලෝචනයක් සිදු කෙරේ. ඉදිරියට ගෙන යන වටිනාකමට වඩා අයකරගතහැකි මුදල අඩු වන්නේ නම්, එවැනි හානිකරණ පාඩුවක් ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනාගැනේ. එක් එක් වාර්තා කිරීමේ දිනයේදී වගකීමෙහි ප්‍රමාණවත්බව පරීක්ෂා කිරීමේදී දDAC සලකා බැලේ.**

ප්‍රතිරක්ෂණ කොමිෂන් ගාස්තු බාහිර ප්‍රතිරක්ෂණය සඳහා ලැබිය යුතු කොමිෂන් ගාස්තු කල් තැබෙන අතර, අපේක්ෂිත රක්ෂණ වාරික ගෙවිය යුතු කාලසීමාව තුල සෘජු රේඛීය පදනමක් මත ක්‍රමක්ෂය කෙරේ.

23. වෙනත් වත්කම

වෙනත් වත්කම් හඳුනාගැනීම මූල්‍ය නොවන වත්කම්වලින් සමන්විත වෙනත් වත්කම් යම් හානිකරණය පාඩුවකින් අඩු කර ලැබෙන පිරිවැයට හඳුනාගැනේ.

කාර්යමණ්ඩල සඳහා ණය පහසුකම්
මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත ලබා දී ඇති ආපදා ණය හා උත්සව අත්තිකාරම් මීට ඇතුලත් වේ. මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු වෙත ණයක් හෝ අත්තිකාරමක් ලබා දී නැත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

මdදු ණය

මෙම ණය මුදල් ලංකා බැංකුව මගින් SRCC හා T අරමුදලෙන් **ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් බලපෑමට ලක් වූ ආයතන/හෝටල් වෙත ප්‍රදානය කරන ලදී.**

**නැවත අයකරගත යුතු බදු - මීට ලැබිය යුතු රඳවාතබාගැනීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු ඇතුලත් වේ.**

**ලැබිය යුතුESC – 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ විධිවිධාන පරිදි, නිශ්චිත අනුපාතවලට ලැබිය යුතු ආදායමින් නිශ්චිත අනුපාතවලට ESC ගෙවිය යුතුය. මෙම ගෙවීම ආදායම් බදු වගකීමෙන් අඩු කළ හැකිය.එම පනතේ අදාල විධිවිධාන පරිදි හිමිකම් පල නොකරන ලද ලැබිය යුතුESC මුදල ඉදිරියට ගෙන යාම හෝ ගෙවිය යුතු ආදායම් බදුවලින් කපා හැරිය හැකිය.**

**භාණ්ඩ ලේඛන හඳුනාගැනීම - මීට අඩු පිරිවැයකට හා අයකරගත හැකි ශුද්ධ වටිනාකමට දක්වා ඇති සියලුම පාරිභෝගික අයිතමන් ඇතුලත් වේ.**

24. මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා බැංකු ශේෂ යන්නට වටිනාකමේ වැදගත් නොවන වෙනස්කම් ඇතිවීමේ අවදානමට යටත් වන බැංකුවේ සහ අතේ ඇති මුදල් අයත් වේ.

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය වෙනුවෙන්, මුදල් කළමනාකරණයේ හා ඉතුරුම් ගිණුම්හි අතිශයින් වැදගත් කොටසක් හිමිකරගන්නා මුදල්, මුදල් සමානයන් හා බැංකු අයිරා මුදල් හා මුදල් සමානයන්ගේ කොටසක් සේ ඇතුලත් කෙරේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල බැංකු අයිරා වගකීම් යටතේ ඇතුලත් කෙරේ. මණ්ඩලයට බැංකුවෙන් ලබා ගත් කිසිදු බැංකු අයිරා පහසුකමක් නොමැත. නමුත් බැංකු අයිරා ශේෂයක් ශේෂ පත්‍රය තුල දක්වා ඇත.

25. රඳවාගත් ඉපැයුම්

රඳවාගත් ඉපැයුම් මගින් මෙහෙයුම් සඳහා මණ්ඩලය විසින් භාවිත කිරීමට නියමිත සමුච්චිත ඉපැයීම් අදහස් කෙරේ.

26. විකිණීමට ඇති දෑ සංචිතය

විකිණීමට ඇති මෙම සංචිතය, විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි සාධාරණ අගයේ ශුද්ධ සමුච්චිත වෙනස ඇතුලත් වන අතර, අදාල වත්කම් හඳුනා නොගැනෙන තුරු හා හානිකරණය වන තෙක් ඉදිරියට ගෙන යනු ලැබේ.

27. නැවත තක්සේරුකිරීමේ සංචිත

**LKAS 19** - සේවක ප්‍රතිලාභ මගින් දක්වා ඇති පරිදි පාරිතෝෂිත වගකීම තක්සේරු කිරීමෙන් හටගන්නා ආයුගණක ලාභ/(පාඩු)වලින් වෙනත් සංචිත සමන්විත වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

28. රක්ෂණ ගිවිසුම් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ශුද්ධ නොඉපැයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදන

නොඉපැයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදන යන්නෙන් මෙතෙක් කල් ඉකුත් නොවූ අවදානම් සඳහා ලද රක්ෂණ වාරික අදහස් කෙරේ. සාමාන්‍යයෙන්, මෙම සංචිතය ගිවිසුමේ කාලසීමාව අවසානයේ නිදහස් කරන අතර, රක්ෂණ වාරික ආදායම ලෙස හඳුනාගැනේ. සෑම වාර්තා කරනු ලබන දිනකදීම මණ්ඩලය විසින් එහි කල් ඉකුත් නොවූ අවදානම සමාලෝචනය කරන අතර, සමස්තයක් ලෙස අපේක්ෂිත හිමිකම්හි අතිරික්තයක් හා නොඉපැයූ රක්ෂණ වාරික ඉක්මවූ කල් තබන ලද අත්පත්කරගැනීමේ පිරිවැය පවතීද යන්න නිර්ණය කිරීම සඳහා ප්‍රමාණවත් වගකීම් පරීක්ෂණයක් සිදු කෙරේ. අදාල ජීවිත රක්ෂණ නොවන රක්ෂණවල තාක්ෂණික ප්‍රතිපාදනවලට අදාලව වත්කම් මත ඇති විය හැකි යැයි අපේක්ෂිත ආයෝජන ආදායම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, මෙම ගණනය කිරීම තුල අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල වර්තමාන ඇස්තමේන්තු භාවිත කෙරේ. නොඉපැයූ රක්ෂණ වාරිකවල ඉදිරියට ගෙන යන ලද අගය ප්‍රමාණවත් නොවන බව මෙම ඇස්තමේන්තුවලින් පෙන්නුම් කරන්නේ නම්, වගකීම් ප්‍රමාණවත්භාවය සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කිරීම මගින් ලාභාලාභ ප්‍රකාශය තුල මෙම ඌණතාව හඳුනාගැනේ.

**SLFRS 4** - රක්ෂණ ගිවිසුම්හි දක්වා ඇති පරිදි, මණ්ඩලය බාහිර ආයුගණක ආයතනයක සහායද සහිතව ජීවිත රක්ෂණ නොවන ගිවිසුම්ගත වගකීම් සම්බන්ධයෙන් වගකීම්හි ප්‍රමාණවත් බව පිළිබඳ පරීක්ෂාවක් සිදු කරයි.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - දළ හිඟ හිමිකම් සඳහා ප්‍රතිපාදන
ගිවිසුම්වලට එළැඹ, රක්ෂණ වාරික අයකරගනු ලබන විටදී, ජීවිත රක්ෂණ නොවන රක්ෂණවල ගිවිසුම්ගත වගකීම් හඳුනා ගැනේ. මෙම වගකීම් හිඟ හිමිකම් ප්‍රතිපාදන යනුවෙන් හඳුනාගන්නා අතර, අදාල හිමිකම් ඉල්ලීම් කළමනාකරණය කිරීමේ පිරිවැය සහ බේරාගැනීමේ හා වෙනත් අයකරගැනීම්හි අපේක්ෂිත පිරිවැය සඳහා අඩුකිරීම් සමඟ වාර්තා කර ඇති හෝ නොමැති, ඉල්ලා සිටින ලද, එහෙත් වාර්තාගත කිරීමේ දිනයේදී නිරවුල් නොකරන ලද සියලුම හිමිකම් ඉල්ලීම්වල ඇස්තමේන්තුගත පිරිවැය මත මෙම වගකීම් පදනම් වේ.

මුදලේ වර්තමාන වටිනාකමට මෙම වගකීම අවම්ල නොකෙරේ. සමතාකරණය හෝ ආපදා සංචිත සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන කිසිවක් හඳුනාගෙන නොමැත. ගිවිසුම කල් ඉකුත්වන විටදී, ක්‍රියාත්මක කරන විටදී හෝ අවලංගු කරන විටදී මෙම වගකීම් හඳුනා ගැනීමක් සිදු නොවේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - හටගත්, එහෙත් වාර්තා නොකළ ශුද්ධ හිමිකම්

ඇතැම් හිමිකම් ඉල්ලීම් දැනුම් දීමේදී හා නිරවුල් කිරිමේදී ප්‍රමාදවීම් ඇති විය හැකිය. එනිසා, වාර්තාගත කිරිමේ දිනයේදී ඒවායේ අවසන් පිරිවැය නිශ්චිතවම දැනගත නොහැකි වේ. අනිසි බැහැර කිරීම් සඳහා සීමාවක් ඇතුලත් විය හැකි පරිදි ආනුභූතික දත්ත හෝ වර්තමාන උපකල්පන මත පදනම්ව, ප්‍රමිතිගත ආයුගණක හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රමවේද රැසක් උපයෝගිකරගනිමින් වාර්තාගත කිරීමේ දිනයේදී මෙම වගකීම ගණනය කෙරේ.

ජීවිත රක්ෂණ නොවන රක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන්, වාර්තාගත කිරීමේ දිනයේදී වාර්තා කරන ලද හිමිකම් ඉල්ලීම්වල අපේක්ෂිත අවසන් පිරිවැය සහ එම දිනට හටගත්, එහෙත් වාර්තා නොකළ හිමිකම් ඉල්ලීම්වල (IBNR) අපේක්ෂිත අවසන් පිරිවැය යන ද්විත්වයම සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතු වේ. නිශ්චිතවම අවසන් හිමිකම් ඉල්ලීම් පිරිවැය ස්ථාපිත කළ හැකි වීමට පෙර ඊට සැලකිය යුතු කාලසීමාවක් ගත විය හැකි අතර, ඇතැම් ආවරණ සම්බන්ධයෙන්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වගකීම් වැඩි සංඛ්‍යාවක්**IBNR**වලින් සමන්විත වේ.

හිඟ හිමිකම් ඉල්ලීම්වල අවසන් පිරිවැය, චේන් ලැඩර් ක්‍රමය, බෝර්න්හර්ටර් - ෆර්ගියුසන් ක්‍රමය සහ සුලබතාව/වැදගත්කම පිළිබඳ ක්‍රමය වැනි ප්‍රමිතිගත ආයුගණක හිමිකම් සකස් කිරීමේ විධික්‍රම රැසක් භාවිත කරමින් ඇස්තමේන්තු කෙරේ.

මෙම විධික්‍රම සඳහා පදනම් වූ ප්‍රධාන උපකල්පනය වන්නේ, සමාගමක අතීත හිමිකම් සංවර්ධනය කිරීමේ අත්දැකීම අනාගත හිමිකම් සංවර්ධනය කර, එමගින් අවසන් හිමිකම් පිරිවැය සකස් කිරීමට හැකි වීමය. ඒ අනුව, මෙම ක්‍රම මගින් ගෙවන ලද සහ හටගත් පාඩු සංවර්ධනය කිරීම, හිමිකම් සඳහා සාමාන්‍ය පිරිවැය සහ පෙර වසරවලදී නිරීක්ෂණය කරන ලද සංවර්ධනය හා අපේක්ෂිත පාඩු අනුපාතයන් මත පදනම් වූ හිමිකම් සංඛ්‍යාව තක්සේරු කෙරේ. ඓතිහාසික හිමිකම් වැඩිදියුණු කිරීම ප්‍රධාන වශයෙන් අනතුරු සිදු වූ වර්ෂ මගින් විශ්ලේෂණය කෙරෙන නමුත්, භූගෝලීය ප්‍රදේශ මගින් මෙන්ම සුවිශේෂී ව්‍යාපාර හා හිමිකම් වර්ග මගින්ද වැඩිදුරටත් විශ්ලේෂණය කළ හැකිය. අධි හිමිකම් පිළිබඳව සමාන්‍යයෙන්, ඒවායේ අනාගත සංවර්ධනය කිරීම් පිලිඹිබු වන අයුරින් පාඩු ගැලපුම් ඇස්තමේන්තුවල මුහුණත වටිනාකමට අගය කිරීම හෝ වෙන් වෙන්ව සකස් කිරීම මගින් වෙන් වෙන්ව සලකා බැලේ. බොහෝ අවස්ථාවන්හිදී, හිමිකම් උද්ධමනයක හෝ පාඩු අනුපාතවල අනාගත අනුපාතයන් සම්බන්ධයෙන් කිසිදු විවෘත උපකල්පනයක් සිදු නොකෙරේ. ඒ වෙනුවට, එලෙස සකස් කිරීම් සිදු කළ ඓතිහාසික හිමිකම් සංවර්ධන දත්ත තුල සැඟවුණු උපකල්පන භාවිත කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

සියලුම සම්බන්ධිත අවිනිශ්චිතතාවන් සැලකිල්ලට ගනිමින්, සිදුවිය හැකි ප්‍රතිඵලවල සම්භාවිතාව පෙන්නුම් කරන ඇස්තමේන්තුගත අවසන් හිමිකම් පිරිවැය ලබාගැනීමේ අරමුණින්, අතීත ප්‍රවණතා අනාගතයේදී අදාල නොවිය හැකි මට්ටම ඇගයීම සඳහා අතිරේක ප්‍රමාණාත්මක විනිශ්චයන් භාවිත කෙරේ (නිදසුනක් ලෙස, එක් වරක් පමණක් සිදු විය හැකි සිදුවීම් හිමිකම්, ආර්ථික තත්ත්වයන්, හිමිකම් උද්ධමන මට්ටම්, නඩු තීන්දු හා ව්‍යවස්ථා වැනි බාහිර හෝ වෙළඳපොල සාධකවල වෙනස්වීම් මෙන්ම වත්කම් වෙන්කිරීම්, ප්‍රතිපත්තිමය කරුණු හා හිමිකම් කළමනාකරණය කිරීමේ ක්‍රමවේද වැනි අභ්‍යන්තර සාධක පිලිඹිබු කිරීම සඳහා)

නොඉපැයූ රක්ෂණ වාරික සඳහා ලබාදෙන ප්‍රතිපාදනවල ප්‍රමාණවත්බව ඇගයීමේදී සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගැනේ.
රක්ෂණ ගිවිසුම් වගකීම්වලට අදාල හිමිකම් සංවර්ධනය කිරීමේ වගු හා සංවේදීතා විශ්ලේෂණ අවදානම් කළමනාකරණ සටහනේ ඇතුලත් කර ඇත.

- අ. රක්ෂණ ගිවිසුම් වගකීම්
- ආ. ශුද්ධ නොඉපැයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදන
- ඇ. දළ හිඟ හිමිකම් සඳහා ප්‍රතිපාදන
- ඈ. දළ හටගත්, එහෙත් වාර්තා නොකළ හිමිකම් සඳහා ප්‍රතිපාදන
- ඉ. රක්ෂණ ප්‍රතිපාදන සහ තාක්ෂණික සංචිත අතර සැසඳුම
- ඊ. වගකීම්හි ප්‍රමාණවත්බව පරීක්ෂාකිරීම(**LAT**)නොඉපැයූ රක්ෂණ වාරික සඳහා ඉදිරියට ගෙනයන ප්‍රතිපාදනවල ප්‍රමාණවත්බව ඇගයීමේ අරමුණින්, මෙම පරීක්ෂණය, SLFRS **4** - රක්ෂණ ගිවිසුම් මගින් දක්වා ඇති පරිදි 2018 දෙසැම්බර් 31 දිනට වෘත්තියමය ආයුගණක ආයතනයක් වන NMG Financial Services Consulting Pte Limitedවිසින්සිදු කරන ලදී. මෙම තක්සේරු කිරීම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආයුගණක ක්‍රමවේද මත පදනම් වන අතර, කාර්තුමය පදනම මත සිදු කෙරේ. එම සමාගම විසින් නිකුත් කරන ලද වාර්තාවට අනුව, මණ්ඩලය විසින් ඉදිරියට ගෙන යන ලද වගකීම ප්‍රමාණවත් නොවීය. එම නිසා, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රක්ෂණ වාරික හිඟතාව වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොදෙන ලදී (2016 - කිසිවක් නැත).
- උ. තක්සේරු කිරීම හා හටගත්, එහෙත් වාර්තා නොකළ හිමිකම් සංචිතය**NMG Financial Services Consulting Pte Limited**විසින් 2018 දෙසැම්බර් 31 දිනට ආයුගණක ලෙස ගණනය කරන ලදී.
- ඌ. උපකල්පනයන්හි වෙනස්කම් 2017 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද පෙර තක්සේරු කිරීමෙහි වැදගත් ඇස්තමේන්තු වෙනසක් නොතිබිය.

**29. අර්ථ නිරූපිත සේවක ප්‍රතිලාභ වගකීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - අර්ථ නිරූපිත සේවක ප්‍රතිලාභ වගකීම් හඳුනාගැනීම සහ ගණනය කිරීම අර්ථනිරූපිත ප්‍රතිලාභ සැලැස්මක් යන්නෙන් අර්ථ නිරූපිත දායකත්ව සැලැස්මක් හැර වෙනත් යම් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් අදහස් කෙරේ.අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්මක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගන්නා වගකීම වන්නේ වාර්තාගත කිරීමේ දිනට අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීමෙහි වත්මන් වටිනාකමයි. LKAS 19 -සේවක ප්‍රතිලාභ මගින් නිර්දේශ කර ඇති පරිදි, Projected Unit Credit (PUC)ක්‍රමවේදය ඔස්සේ වාර්තාගත කරනු ලබන දිනයේදී සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු මගින් මෙම අගය ගණනය කෙරේ. මෙම අගය කිරීම තුල වට්ටම් අනුපාත, වැටුප් වර්ධක අනුපාතය මෙන්ම සේවකයින්ගේ සේවා ශේෂය පිළිබඳ උපකල්පන සිදු කිරීම අන්තර්ගත වේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සුවිශේෂී අවිනිශ්චිතතාවකට යටත් වේ.

ආයුගණක ලාභ සහ පාඩුවලින් සමන්විත ශුද්ධ අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම නැවත ගණනය කිරීම, එම ලාභ හා පාඩු හටගන්නා කාලසීමාවේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල අයකිරීම හෝ බැර කිරීම හෝ සිදු කෙරේ. ආයුගණක අගය කිරීමේ ප්‍රතිඵල මත නිර්ණය කරන ලද උපකල්පන මූල්‍ය ප්‍රකාශන සඳහා 34.2.4 සටහනෙහි ඇතුලත් කර ඇත.

එසේ වුවද, 1983 අංක12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව, යම් සේවකයෙකු හට පාරිතෝෂිත ගෙවීමේ වගකීම මතු වනුයේ, මණ්ඩලයෙහි අඛණ්ඩ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණි.

මණ්ඩලයට ප්‍රතිපාදන බාහිර වශයෙන් සම්පාදනය නොකෙරේ.

අගය කිරීමේ සංකීර්ණභාවය, පදනම් වූ උපකල්පන හා එහි දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් මෙම උපකල්පනවල වෙනස්කම් සම්බන්ධයෙන් අතිශයින් සංවේදී වේ. සියලුම උපකල්පන එක් එක් වාර්තාගත කිරීමේ දිනයේදී සමාලෝචනය කෙරේ.

අ. 2018 දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ වගකීම් පාරිතෝෂිත වගකීම් අගය කිරීම, LKAS 19 - සේවක ප්‍රතිලාභ මගින් පනවා ඇති පරිදි, ආයුගණක විශේෂඥතාවක් සහිත සමාගමක් වන NMG Financial Services Consulting Pte Limited විසින් Projected Unit Creditක්‍රමය යටතේ ආයුගණක ලෙස අගය කරන ලදී.

**ආ. භාවිත කළ ප්‍රධාන ආයුගණක උපකල්පන**

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**ඇ. සංවේදීතා විශ්ලේෂණය පහතින් දැක්වෙන සංවේදීතා විශ්ලේෂණය, වාර්තාගත කිරීමේ දිනය අවසානයේදී හටගනු ලබන මූලික උපකල්පනවල සාධාරණ වෙනසක් හේතුවෙන් අර්ථනිරූපිත ප්‍රතිලාභ වගකීම් මත ඇති කරන බලපෑම තක්සේරු කරන ක්‍රමයක් මත පදනම්ව නිර්ණය කර ඇත. මෙම විශ්ලේෂණය අර්ථනිරූපිත ප්‍රතිලාභ වගකීම්හි සත්‍ය වෙනසක් නියෝජනය කළ නොහැක්කේ, උපකල්පන වෙනස්කම් තනි තනි වශයෙන් සිදුවීම සිදුවීමේ සම්භාවිතාවක් නොමැති හෙයිනි.**

**සේවක වගකීම් ගණනය කිරීමේදී ස්ථාර ලෙස පවත්වාගෙන යන ලද අනෙකුත් සියලුම විචල්‍යයන් යොදාගත් මූලික උපකල්පනවල සිදු විය හැකි සාධාරණ වෙනසකට දක්වන සංවේදීතාව පහත සඳහන් වගුව මගින් පෙන්නුම් කෙරේ.**

**30.** **වෙනත් මූල්‍ය වගකීම්**

මූල්‍ය වගකීම් හඳුනාගැනීම ණය, ලැබිය යුතු මුදල් සහ ණය ඇපකර ජනනය වූ දින නිකුත් කරන ලද එවැනි අයිතමයන් මණ්ඩලය විසින් මූලිකව හඳුනාගැනේ. ආයතනය එම මූල්‍ය වගකීමේ ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත් වන වෙළඳ දිනයේදී අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනේ. වෙනත් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්, ඍජුව ආරෝපණය කළ හැකි යම් ගණුදෙනු පිරිවැයකට අඩු සාධාරණ අගයකදී මූලික වශයෙන් ගණනය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, මෙම වගකීම් ඵලදායී පොලී ක්‍රමවේදය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැය මත ගණනය කෙරේ. වෙනත් මූල්‍ය වගකීම් තුල අදාල පාර්ශ්වයන් වෙත ගෙවිය යුතු හිඟ මුදල්, උපචිත මෙන්ම ගෙවිය යුතු හිඟ කොමිෂන් මුදල් ඇතුලු වෙනත් ණයහිමියන් ඇතුලත් වේ.

වෙනත් මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම යම් වගකීමක් යටතේ ඇති බැඳීමක් ඉටු කර ඇති විටෙක හෝ අවලංගු කර ඇති විටෙක හෝ කල් ඉකුත් වී ඇති විටෙක හෝ යම් මූල්‍ය වගකීමක් හඳුනා නොගැනේ. සැලකිය යුතු ආකාරයෙන් වෙනස් වූ නියමයන් මත දැනට පවත්නා මූල්‍ය වගකීමක් එම ණයලබාදෙන්නා විසින්ම වෙනත් මූල්‍ය වගකීමක් සමඟ ආදේශ කරන විටෙකදී හෝ දැනට ක්‍රියාත්මක මූල්‍ය වගකීමක නියමයන් සැලකිය යුතු අන්දමින් වෙනස් කරන විටෙකදී, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් ලෙස සැලකිය යුතු අතර, නව වගකීමක් හඳුනා ගැනීම සහ අදාල ඉදිරියට ගෙන යන මුදල් ප්‍රමාණයේ වෙනස ලාභාලාභ ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

**31.** **වෙනත් වගකීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - වෙනත් වගකීම් වෙනත් වගකීම් යන්නට ගෙවිය යුතු ආදායම් බදු හැර රජයට ගෙවිය යුතු වෙනත් බදු ඇතුලත් වන අතර, LKAS 39 මූල්‍ය උපකරණ - හඳුනාගැනීම හා ගණනය කිරීම ප්‍රකාරව මෙම වගකීම් මූල්‍ය වගකීම් නොවේ. මෙම වගකීම් වාර්තාගත කිරීමේ දිනයට ගෙවීමට නියමිත මුදලින් වාර්තා කෙරේ.

**32.** **ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ හඳුනාගැනීම හා ප්‍රතිරක්ෂණය ප්‍රතිරක්ෂණ වගකීම් මගින් රක්ෂණ සමාගම් වෙත ගෙවීමට ඇති ශේෂයන් නියෝජනය කෙරේ. ගිවිසුම්ගත අයිතීන් වලංගු නොවන විට හෝ කල් ඉකුත් වන විට හෝ වෙනත් පාර්ශ්වයක් වෙත ගිවිසුම පවරන විට හෝ ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් හඳුනා නොගැනේ.

33. **ගෙවිය යුතු ආදායම් බදු**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ගෙවිය යුතු ආදායම් බදු වර්තමාන කාලසීමාවට අදාල ආදායම් බදු වගකීම්, බදුකරණ බලධාරීන් වෙත ගෙවීමට නියමිත මුදලට අනුව ගණනය කෙරේ. මෙම අගය ගණනය කිරීම සඳහා භාවිත කරන බදු අනුපාත සහ නීති වන්නේ පනවන ලද හෝ මණ්ඩලය විසින් මෙහෙයුම් සිදු කර, බදු ලෙස අය කළ හැකි ආදායම් ජනනය කරනු ලබන රටවල වාර්තාගත කිරීමේ දිනයේදී සැලකිය යුතු මට්ටමින් පනවන ලද අගයන්ය.

ස්කන්ධ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුල ඍජුවම හඳුනාගැනෙන අයිතමයන්ට අදාල වත්මන් ආදායම් බදු, ලාභාලාභ ප්‍රකාශය තුල නොව, ස්කන්ධ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුල හඳුනාගැනේ. අදාල බදු රෙගුලාසි අර්ථනිරූපණයට බඳුන්වන අවස්ථාවන් සම්බන්ධයෙන් බදු වාර්තාවල දක්වා ඇති තත්ත්වයන් කළමනාකාරිත්වය විසින් කාලීනව අගය කර, යෝග්‍ය පරිදි විධිවිධාන ස්ථාපිත කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

34. බැංකු අයිරා

මූල්‍ය කළමනාකරණය සහ ඉතිරිකිරීමේ ගිණුම්හි අත්‍යන්ත කොටසක් වන බැංකු අයිරා, මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශයේ අරමුණු උදෙසා මුදල් හා මුදල් සමානයන්හි අංගයක් ලෙස ඇතුලත් කර ඇත. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල බැංකු අයිරා වගකීම් යටතේ ඇතුලත් කර ඇත. මණ්ඩලය සතුව බැංකුවකින් ලබාගත් කිසිදු බැංකු අයිරා පහසුකමක් නොමැත. එහෙත්, වාර්තාගත කරන ලද බැංකු අයිරා ශේෂයක් ශේෂ පත්‍රය තුල දක්වා ඇත.

**35. වාර්තාගත කිරීමේ කාලසීමාවෙන් පසුව හටගන්නා සිදුවීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - වාර්තාගත කිරීමේ කාලසීමාවෙන් පසුව හටගන්නා සිදුවීම් යන්නෙන් වාර්තාගත කරන දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය පවරනු ලබන දිනය අතර සිදු වන හිතකර හා අහිතකර සිදුවීම් අදහස් කෙරේ.

වාර්තාගත කිරීමේ දිනයට පසුව සිදුවන සියලුම වැදගත් සිදුවීම් සලකා බලා, යෝග්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශ සඳහා අදාල සටහන් තුල ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

හිමිකම් වෙනුවෙන් ගොනු කර ඇති මෙතෙක් විසඳා නොමැති ඉල්ලීම් ඇගයීමට ලක් කර ඇති අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශ තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇත.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

## 1. ශුද්ධ රක්ෂණ වාරික

### 1.1 දළ ලිඛිත රක්ෂණ වාරික

ප්‍රධාන ව්‍යාපාර කාණ්ඩ මගින් වර්ෂය සඳහා රක්ෂණ වාරික ආදායම පහත සඳහන් පරිදි වේ:

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| ප්‍රතිරක්ෂණය | 4,056,395,150 | 3,683,389,120 |
| වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අර මුදල-රක්ෂණ වාරික | 4,581,640,544 | 4,036,282,848 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 422,117,039 | 417,885,956 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 103,722,015 | 413,720,543 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ වාරික | 500,000,000 | 500,000,000 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන රක්ෂණ යෝජනා ක්‍රමය | 20,000,000 | 20,000,000 |
| | **9,683,874,748** | **9,071,278,467** |

### 1.2 අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එකතු කළ දායකත්ව මුදල්

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| සාමාජිකයින්ගෙන් ලද දායකත්ව මුදල් | 2,959,518,379 | 2,154,586,499 |
| භාණ්ඩාගාරයෙන් ලද දායකත්ව මුදල් | 750,000,000 | 500,000,000 |
| විශ්‍රාමික රක්ෂණ යෝජනා ක්‍රමය | 101,282,200 | 58,785,600 |
| අර්ධ රාජ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 206,620,325 | 13,150,500 |
| | **4,017,420,904** | **2,726,522,599** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

| | | 2018 | 2017 |
|---|---|---|---|
| **2.** | **ගාස්තු හා කොමිස් ආදායම්** | රු. | රු. |
| | ආවරණහිමියන්ගේ පරිපාලන ගාස්තු | 6,467,415 | 6,350,874 |
| | **මුළු ගාස්තු හා කොමිස් ආදායම්** | **6,467,415** | **6,350,874** |

| | | 2018 | 2017 |
|---|---|---|---|
| **3.** | **ආයෝජන හා වෙනත් ආදායම්** | රු. | රු. |
| **3.1** | **ණය හා ලැබිය යුතු පොලී ආදායම්** | | |
| | නැවත මිලදීගැනීමේ ගිවිසුම්වලින් ලද පොලී ආදායම් | 359,001,887 | 160,720,267 |
| | ලාභාංශවලින් ලද පොලී ආදායම් | - | - |
| | | 359,001,887 | 160,720,267 |
| **3.2** | **විකිණීමට ඇති පොලී ආදායම්** | | |
| | භාණ්ඩාගාර බිල්පත්වලින් ලද පොලී ආදායම් | 146,519,438 | 203,450,756 |
| | භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලද පොලී ආදායම් | 653,510,330 | 743,835,183 |
| | | **800,029,767** | **947,285,939** |
| **3.3** | **කල් පිරීමට තබා ඇති පොලී ආදායම්** | | |
| | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙතින් ලද පොලී ආදායම් | | |
| | **මුළු ආයෝජන ආදායම්** | **1,159,031,654** | **1,108,006,205** |
| **3.4** | **වෙනත් ආදායම්** | | |
| | ඉතිරිකිරීමේ ගිණුම මත පොලිය -එක්සත් ජනපද ඩොලර් | 8,241,076 | 898,532 |
| | මෘදු ණය මත පොලිය | 318,346 | 807,908 |
| | කාර්යමණ්ඩල ආපදා ණය මත පොලිය | 1,395,653 | 1,085,081 |
| | ස්ථාවර වත්කම් බැහැර කිරීම | 2,352,313 | 4,945,111 |
| | හුවමාරු ලාභ/පාඩු | 168,765,990 | 26,899,206 |
| | වෙනත් | 3,294,882 | 567,887 |
| | | **184,368,260** | **35,203,725** |
| | | **1,343,399,914** | **1,143,209,930** |

| | | 2018 | 2017 |
|---|---|---|---|
| **4.** | **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | රු. | රු. |
| | **(අ) දළ ප්‍රතිලාභ හා ගෙවන ලද හිමිකම්** | | |
| | ප්‍රතිරක්ෂණය | (2,345,202,622) | (2,039,286,678) |
| | වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස් තවාදී අරමුදල | (50,085,704) | (12,314,131) |
| | සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | (208,043,768) | (202,402,854) |
| | සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය හා වෙනත් | (469,755,602) | (151,205,332) |
| | වගා රක්ෂණය | (1,813,322,777) | (1,593,396,750) |
| | ආපදා | (843,784,556) | (4,699,472,888) |
| | අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | (4,033,304,251) | (2,757,161,073) |
| | | **(9,763,499,280)** | **(11,455,239,706)** |
| | **(ආ) ප්‍රතිරක්ෂකයින් වෙත ලබා දුන් හිමිකම්** | | |
| | ප්‍රතිරක්ෂණය | | |
| | සාමාන්‍ය රක්ෂණය - ජාතික ස්වභාවික විපත් රක්ෂනාවරණය | | ස |
| | **(ඇ) ගිවිසුම්ගත වගකීම්වල දළ වෙනස** | | |
| | ප්‍රතිරක්ෂණය | 1,118,915,215 | 137,254,896 |
| | වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස් තවාදය | (4,909,984) | - |
| | සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | (19,577,104) | (7,003,676) |
| | සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය හා වෙනත් | (44,120,899) | (11,331,084) |
| | වගා රක්ෂණය | 227,238,143 | (289,394,804) |
| | ආපදා | 329,067,118 | 2,379,827,068 |
| | අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | (51,700,769) | (131,604,106) |
| | | **1,554,911,720** | **2,077,748,294** |
| | **(ඈ) ප්‍රතිරක්ෂකයින් වෙත ලබා දුන් ගිවිසුම්ගත වගකීම්හි වෙනස** | | |
| | ප්‍රතිරක්ෂණය | (335,594,771) | (191,629,545) |
| | සාමාන්‍ය රක්ෂණය - ජාතික ස්වභාවික විපත් රක්ෂනාවරණය | (681,171,372) | (48,049,749) |
| | | **(1,016,766,143)** | **(239,679,294)** |
| | **(ඉ) සිදු වූ නමුත් හඳුනා නොගත් දේ හි දළ වෙනස** | | |
| | ප්‍රතිරක්ෂණය | 57,379,737 | (232,748,969) |
| | වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස් තවාදය | (21,072,197) | 22,833,384 |
| | සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | (85,714,746) | (57,045,536) |
| | සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය හා වෙනත් | (34,513,168) | (32,365,340) |
| | වගා රක්ෂණය | 11,361,907 | 133,625,924 |
| | ආපදා | (162,533,506) | (0) |
| | අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | (230,202,544) | (117,828,127) |
| | | **(465,294,517)** | **(283,528,663)** |
| | **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | **(9,690,648,221)** | **(9,900,699,368)** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා

**5. ප්‍රාරක්ෂණය හා අත්පත්කරගැනීමේ පිරිවැය**

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| අත්පත්කරගැනීමේ පිරිවැය | (1,518,080,365) | (1,452,274,432) |
| කොමිස් ලාභ වියදම් | (114,581,924) | (102,726,775) |
| නොඉපැයූ කොමිස් ගාස්තු සංචිතයේ වෙනස - SRCC | 31,900,594 | 29,656,526 |
| නොඉපැයූ කොමිස් ගාස්තු සංචිතයේ වෙනස - සාමාන්‍ය | (804,112) | (2,923,900) |
| නොඉපැයූ කොමිස් ගාස්තු සංචිතයේ වෙනස - ප්‍රතිරක්ෂණය | (7,428,404) | 87,442,074 |
| | **(1,608,994,211)** | **(1,440,826,507)** |

**6. වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම්**

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 1,000,000 | 886,200 |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 218,637,288 | 201,433,256 |
| පරිපාලන හා ආයතන වියදම් | 174,516,012 | 128,114,613 |
| අලෙවි වියදම් | 4,747,107 | 4,021,842 |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම | 12,452,639 | 7,316,750 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 273,100 | 112,292 |
| නෛතික ගාස්තු | 1,214,940 | 623,345 |
| අනුග්‍රාහකත්ව | 1,975,750 | 2,170,000 |
| **මුළු වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම්** | **414,816,836** | **344,678,298** |

**6.1 සේවක ප්‍රතිලාභ වියදම්**

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රසාද දීමනා හා දිරිදීමනා ඇතුලු වේතන හා වැටුප් | 139,453,031 | 128,427,751 |
| අර්ථනිරූපිත දායකත්ව සැලසුම් සඳහා දායකත්ව මුදල් | | |
| සේවක අර්ථසාධක අරමුදල | 16,864,127 | 16,660,178 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | 4,210,826 | 3,961,613 |
| වෙනත් පෞද්ගලික පිරිවැය | 50,184,122 | 46,513,552 |
| විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය | 7,925,182 | 5,870,163 |
| **මුළු සේවක ප්‍රතිලාභ වියදම්** | 218,637,288 | 201,433,256 |

**6.2 පරිපාලන හා ආයතන වියදම්**

